ඉයාප්පෙම් ලෙවිතාන්

ළමයින්ට ඉර, හඳ, තාරකා ගැන කතා



ළමයිනට
ඉර, හඳ, තාරකා
ගැන කතා



යෙ. ලෙවිතාන්

ළමයිනව ඉර, හඳ, තාරකා ගැන කතා

රාදුගා ප්‍රකාශකයෝ
මොස්කව්

Е. Левитан

МАЛЫШАМ О ЗВЕЗДАХ И ПЛАНЕТАХ

на языке сингала

අනුවාදය – දදිගම වී. රුද්රිගු
චිත්‍ර – සෙර්ගෙයි අලිමොව්

©සිංහල අනුවාදය. රාදුගා ප්‍රකාශකයෝ, 1986

Л $\frac{4803010102\text{-}553}{031(01)\text{-}86}$ 278-86

ISBN 5-05-000909-X

පටුන

ඉර



නාරකා

වැඩි හිටියන්ට වචනයක්
7

ආකාශ වස්තු විද්‍යාව දන්න වුට් සියා
11

දිළුතු ආකාශ වස්තු විද්‍යාඥයෙක් වීමට කැමති වෙයි
12

හිරු බැලීමට ඇස් කණ්ණාඩි
15

වට රවුමක් ද? ගෝලයක් ද?
17

වුට් සියා ගේ අපූරු යාළුවා
20

ඉර ඇත ද?
26

ඉර ලොකු ද, කුඩා ද?
30

ඉර හෙසේ ගමන් කරන හැටි
31

ඉර මිනිසාට සේවය කරයි
37

ඉස්සර කාලේ මිනිසුන් ඉරට භයවුනේ මන්ද
39

නුගත් කුරුම්බිටා ඉර ගැන දන්නේ මොනවා ද
41

දහසක් ඉරු ඇති රට
47

අහසේ තරු කොපමණ ද
47

නාරකාවලින් හැදුනු හැන්ද
48

මහ වලහා තරු සමූහය
51

දිසාව පෙන්වන මාලිමා තරුව
58

වලසුන් දෙදෙනකු ගැන කතා
60

නිරිහය පර්සියස් ලස්සන අන්ද්‍රොමෙදාව බෙරා ගත් සැටි
62

නාරකා ත්‍රිකෝණය
65

ගවයා සමඟ සටන් කරන දඩයක්කාරයා
68

තරුවල ජීවත් විය හැකි ද?
70

ඇත බොහෝ හිරු ඇති ලෝකයේ
71

සෞර ග්‍රහ මණ්ඩලය

නවත් එක අල්දෙනෙක්ගේ තරුවක් ද?
79

හඳ යනු කුමක් ද?
82

අපේ අජටාකාශ යානය
87

හඳ වෙනස් වන්නේ මක්නිසා ද?
90

දවල් වෙලා ඒ වුනා ම, එක දවසක් ගෙවී යනවා
92

හිරු ගේ පවුල
97

වෙනත් ග්‍රහ ලෝකවල ජීවත් විය හැකි ද?
100

ග්‍රහ ලෝක

බුදහු වෙත සියාසැටිය
105

බුදහු ග්‍රහයා මත ගොඩබැසීම
107

කුණාටු සහිත ග්‍රහයා
110

රතුවන් ග්‍රහයා
114

ගුහස්පති සහ එහි චන්ද්‍රිකා
118

නුගත් කුරුමිටියා තාරකා සහ ග්‍රහයන් ගැන දන්නේ මොනවා ද?
123

වැඩි හිටියන්ට වචනයක්

සිත් ඇදගන්නා සුලු විද්‍යාවක් වන ආකාශ වස්තු (ජෝති) විද්‍යාව ළමයිනට හඳුන්වා දීම මෙම පොතේ අරමුණ ය. ආකාශ වස්තු ගැන දැනගැනීම ප්‍රයෝජනවත් ය. ප්‍රථමයෙන්, ලෝකය ගැන යථාර්ථවාදී දැනීමක් ලබා ගැනීමට ආකාශ වස්තු විද්‍යාව වැදගත් සේවයක් කිරීම ය. දෙවනුව, ආකාශ වස්තු විද්‍යාව ගැන දැනගැනීමට සැලැස්වීමෙන් ළමයින් ගේ නිරීක්ෂණ ශක්තිය දියුණු කිරීමට ද, නිරීක්ෂණයේ ප්‍රතිඵල කිරා බැලීමට ද ඔවුන් පොළඹවාලීම ය. තෙවැන්න, ආකාශ වස්තු විද්‍යාව ගැන සැළකිල්ලක් දැක්වීම නිසා ප්‍රකෘති විද්‍යා, භූගෝල විද්‍යාව, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායනික විද්‍යාව සහ වෙනත් පාඨශාලීය විෂයයන් හැදෑරීමට ළමයින් තුළ උනන්දුවක් ඇති කිරීම ය.

මෙම පොතින් ලැබෙන මූලික විද්‍යා දත්තයන් පසක් කැරැ ගැනීමට ළමයින් සමත් වෙති ද? ළමයින් ගේ බුද්ධි වර්ධනයේ හැකියාව කලින් සිතුවාට වඩා වැඩි බව සමකාලීන ශික්ෂණ විද්‍යාඥයෝ සහ මානසික විද්‍යාඥයෝ නිගමනය කරති. ප්‍රාථමික පාසල් වයසේ දී ම ඇසට පෙනෙන ආදර්ශ මගින් පමණක් නොව, එක්තරා ප්‍රමාණයකට වියුක්ත චින්තනය මගින් ළමයින් ගේ බුද්ධිය වර්ධනය කළ හැකි බවට සැහෙන කරුණු සෝවියට් විද්‍යාඥයින්ට ලැබී තිබෙ.

සෝවියට් සංගමයේ පොත් සාප්පුවල වැඩි හිටියන් සහ ළමයින් හොඳින් දන්නා ළමා කතා පොත් දහස් ගණනාක් මෙන් උසස් ගණිත විද්‍යාව, භෞතික විද්‍යාව පිළිබඳ ළමා පොත් පෙළක් බිහි වූ අතර පෙව විද්‍යාව, රසායනික විද්‍යාව සහ භූගෝල විද්‍යාව පිළිබඳ ළමා පොත් පළවීමට පටන් ගෙන ඇත්තේ මෙම හේතුව නිසා ය. දැන් ඔබ අතට පත් වී ඇත්තේ ආකාශ වස්තු විද්‍යාව පිළිබඳ ළමා කතා පොතකි.

මෙම පොත නිකම් කියැවීම පමණක් ප්‍රමාණවත් නො වේ. කියැවීම ත් සමග ආකාශ වස්තු නිරීක්ෂණය කිරීම, සරළ පර්යේෂණ පැවැත්වීම සහ දුටු දේ ත්, කියැවූ දේ ත් ගැන සාකච්ඡා කළ යුතු ය. දෙමාපියන් ගේ මෙම සහයෝගතාව නැතිව ළමයිනට මේ පොතින්

ඉදිරිපත් කරන විද්‍යාත්මක කරුණු හරි හැටි පසක් කර ගත නො හැකි වෙයි.

ළමයින් ඉදිරියේ මේ පොත කියැවීමට පෙර වැඩි හිටියෝ මේය කියවිය යුත්තා හ. හැම පරිච්ඡේදයක ම ඇති ශික්ෂණ ක්‍රමය ගැන සැලකිලි යොමු කරන්න.

බොහෝ පින්තූර සහිත මේ පොත කියැවීමෙන් ළමයින් ලබන දැනුම තවත් පුළුල් කොටැ ගැඹුරු කළ හැකි ය. ප්‍රථමයෙන් ම, ළමයා ගේ සිත ඇදී යන්නේ විශාල වෛවර්ණ චිත්‍ර කෙරෙහි ය. චිත්‍ර පදනම් කර ගෙන ළමයින් සමග සාකච්ඡා කරන්න. ඒ චිත්‍ර ගැන කතා ගොතන ලෙස ළමයිනට යෝජනා කරන්න. ඡායා රූප හා චාර්තා රූප නිසා වඩාත් හොඳින් ආකාශ වස්තු විද්‍යාව ගැන නොයෙක් කරුණු ළමයිනට විස්තර කිරීමට ඔබට හැකි වනු ඇත.

එක් කතාවක් කියැවූ පසු ළමයිනට අවබෝධ කර ගත හැකි වුණු කරුණු ගැන ත්, ඔවුනට මතක තබා ගත හැකි කරුණු ගැන ත් විශේෂ සැලකිල්ලක් දක්වන්න. චිත්‍ර හා ඡායා රූප පෙන්වා, ඔවුනට වටහා ගත නො හැකි වූ කොටස් යළි කියවා ඒවා ගැන සාකච්ඡා කරන්න.

මේ පොත කියැවීම නිසා අපේ පුංචි පාඨකයින් අතර ආකාශ වස්තු විද්‍යාව ගැන වඩා ත් වැඩි උනන්දුවක් ඇති වී, තවත් දුර තරු සහ ග්‍රහ ලෝක ගැන තොරතුරු දැනගැනීමට ඔවුන් පෙළඹෙනු ඇතැ යි අපි බලාපොරොත්තු වමු.

ඉර

හිරු ගේ සිට ආකාශ වස්තු විද්‍යාව ගැන තොරතුරු මෙයින්ට දැන ගැනීමට සසේවලු. මෙයා ගේ සැලකිල්ල යොමුවන එක් ප්‍රථම වස්තුවකි හිරු. අපට ඉතා ම ළඟ තරුව ද හිරු ය.

අපේ පොතේ පළමුවැනි කොටසේ අරමුණ හිරු ගේ ප්‍රමාණය සහ හැඩය පිළිබඳ ව මූලික දැනීමක් ලබා දීම ය. ඉර ත් අප ත් අතර ඇති දුර ප්‍රමාණය ගැන ද, සූර්ය තාපයෙන් ලබා ගත හැකි ප්‍රයෝජනය ගැන ද මෙයිනට විස්තර කිරීම ය. තවමත් පාසල් නො යන වයසේ පසුවන මෙයිනට මෙය සැහෙන තරමින් අසීරු දෙයක් බව කිව යුතු ය. ඒනිසා එක ණුස්මට කතා කීපයක් කියා දීමට ඉදිරිපත් නො වන්න. පොතේ සඳහන් නිරීක්ෂණ සහ පරීක්ෂණ පැවැත්වීමට මෙයින් සහභාගි කරවා ගන්න. ඒවායේ ප්‍රතිඵල ඔවුන් සමග සාකච්ඡා කිරීමට උත්සාහ ගන්න.

පරීක්ෂණ පැවැත්වීමට පෙර හිරු රශ්මියෙන් දෙනෙත් ආරක්ෂා කරන ඇස් කණ්ණාඩි වලින් මෙයින් ගේ ඇස් ආරක්ෂා කළ යුතු ය. පියවි ඇසින් ඉර දෙස බැලීම නො කළ යුතු ය. ආරක්ෂක ඇස් කණ්ණාඩි පැළඳ ගෙන වුව ද හිරු දෙස බැලිය හැක්කේ විනාඩි දෙකකට වඩා අඩු කාලයකි. මෙවන් ඇස් කණ්ණාඩි ඔබට විවිධ ලෙස සාදා ගත හැකි ය. පොතේ සඳහන් කරන ඇස් කණ්ණාඩිවලට වඩා හොඳ ඒවා ඔබට සැදිය හැකි වෙතැ යි අපි විශ්වාස කරමු. හිරු එළිය කෙළින් ම දෙනෙත් පිඩා කිරීමෙන් ආරක්ෂා කිරීම මෙහි ප්‍රධාන අරමුණ වීය යුතු ය. එවැනි ඇස් කණ්ණාඩි පැළඳ ගෙන පමණක් ඉර නිරීක්ෂණය කළ යුතු ය. මෙයා ගේ ඇස් පෙනීමට හානි නො වන්නේ එවිට පමණකි.



දිමුතු සහ දිලාන්ති කතන්දර ඇසීමට බොහොම කැමති යි. තාත්තා මේ දෙදෙනාට රතු තොප්පිය ඇඳගත් ගෑනු ළමයා, බුරුතීනෝ, කාල්සන් සහ හා පැටවුන් ගැන කතන්දර කියා තියෙනවා.

ඔන්න දවසක් දා තවත් අලුත් කතාවක් කියන්න කියලා මේ දෙදෙනා ඉල්ලා හිටියා.

ඉතින් කතා පටන් ගන්නා හැටි ඔය ළමයින් දන්නවා නේ ද? "එකෝමත් එක රටක...", "එකෝමත් එක් රාජ්ජෙක...", "මේ කතාව බොහොම ඉස්සර කාලේ වෙච්ච දෙයක්..." කියලා තම යි කතාවේ මුල පටන් ගන්නේ. නමුත් තාත්තා කතාව පටන් ගත්තේ එහෙම නො වෙයි.

"මගේ හොඳ යාළුවෙක් ඊයේ මාව හම්බ වෙන්න ආවා. එයා ගේ නම චූට් සියා. එයා කුරු මිටිටෙක්. ඉතින් එයා ඇවිත් මගේ ලියන මේසය උඩ, ඔර්ලෝසුව ළඟින් වාඩි වුනා..."

"තාත්තේ, හැබැට ම ඔය තරම් චූට් සියා කෙනෙකු පණ පිටින් ම ආවා ද?" දිමුතු තාත්තා ගෙන් ඇහුවා.

චේතයට පත් මල්ලි දෙස බැලූ දිලාන්ති හිනාවුනා. නමුත් තාත්තා ලොකු බැරිරුම් වෙසක් මවා ගෙන හිටියා.

"ඔව්, සත්තකින් ම, චූට් සියා, මගේ යාළුවා, නිතර මාව හමුවීමට එනවා."

දිලාන්ති සිනාසීම නැවැත්වූවා. දිමුතු පොරවා ගෙන හිටිය කම්බිලිය ඉවත් කරලා දෙනෙත් මහත් කර ගෙන තාත්තා දිහා බැලුවා.

"චූට් සියා කවුරුන් වගේ ද?" දිමුතු ඇහුවා.

"එයා නිල් පාට යි. එයා ඇඳලා ඉන්නේ නිල් පාට ඇඳුමක්. ඒ ඇඳුමේ තරු ඇඳලා තියෙනවා. එයා ගේ අතේ විජ්ජාකාර කෙට්ටක් තියෙනවා. ඒ කෙට්ට එයාට විජ්ජාකාර බහිරව සියා ගෙන් ලැබිච්ච තෑග්ගක්.

"විජ්ජාකාරයා ගෙන්!" දිමුතු පුදුම වුනා.

"ඔවු, ඇත්තට ම. චූට් සියා පිවත් වන්නේ කතා ලෝකයේ. ඒක බහිරවයන් ගේ රට. ලොකු ම බහිරවයා තම යි විජ්ජාකාරයා. චූට් සියා විජ්ජාකාර සියා ගේ

ආකාශ වස්තු විද්‍යාව දන්න චූට් සියා

අපේ විද්‍යාඥයෝ ඉර දුටු හැටි (පිටුව 10).

ආකාශ වස්තු (ජෝති) විද්‍යාව– විශ්වය අර්බයා වූ උගැන්වීමෙකි. එය ඉතා ඈත කාලයෙක. දී බිහි විය. ඉර හා තරු අනුව වේලාව බැලීමට ත්, ගොඩබිම සහ මුහුදේ ගමන් මග සොයා ගැනීමට ත් ඇත කාලයේ සිට මිනිස්සු දන සිටියහ.

හොඳ ම ගෝළයා. චූටි සීයා ලොකු නුවණක්කාරයා, නොයෙක් දේ දැන ගැනීමට ආශා කරනවා. ඒ වගේ ම බොහොම කරුණාවන්ත යි. එයාට විජ්ජාකාර කෙව්ට තැගි ලැබුණේ එයා බොහෝ දේ දන්නා නිසා. බොහෝ දේ කිරීමට දක්ස නිසා.

තාත්තා නිහඬ වුනා. ළමයිනුත් නිහඬ ව ඉන්නවා.

"චූටි සීයා ගේ ඇදුමේ තරු තියෙන්නේ මන්ද? එයා ගේ අතේ විජ්ජාකාර, හිරු රැස් ඇති කෙව්ටක් තියෙන්නේ ඇයි?" දිමුතු ඇහුවා.

"චූටි සීයා ඉර, හඳ, තාරකා ගැන කියන ආකාශ වස්තු විද්‍යාවට බොහොම කැමති හන්දා. බහිරවයන් ගේ රටේ චූටි සීයා තරම් හොඳින් ආකාශ වස්තු විද්‍යාව දන්නා වෙනත් කෙනෙක් නැහැ! එයා නියම ආකාශ වස්තු විද්‍යාඥයා!" තාත්තා කියුවා.

"මාත් කැමති යි ඉර සහ තරු ගැන ඉගෙන ගන්න!" දිමුතු කිව්වේ ආශාවෙන්.

දිමුතු ආකාශ වස්තු විද්‍යාඥයෙක් වීමට කැමති වෙයි

හවස තාත්තා එන තුරු ළමයි නොඉවසිල්ලෙන් බලා සිටියහ. තාත්තා ගෙදර ආ විගස දිමුතු රහසක් කියේ ය:

"මම අර රහස ගැන කාට වත් කිව්වේ නැහැ!"

"මොන රහස ගැන ද?" තාත්තා ඇහුවා.

"චූටි සීයා ගැන!" දිමුතු කිවේ අමනාපයෙන්. "මම යි දිලාන්ති යි නිතර ම චූටි සීයා ගැන කතා කළා. ඒ අතර මම ඉර දිහා බැලුවා."

"බැලුවේ කොහොම ද?"

"ඉර වලාකුළුවලට හැංගෙන සැටි."

"බොහොම හොඳ යි. පුතා අද ඉර නිරීක්ෂණය කළා. ඔනෑ ම විද්‍යාවකට නිරීක්ෂණය කිරීම ඉතා ම වැදගත්. විශේෂයෙන් ම ආකාශ වස්තු හෙවත් ජෝති විද්‍යාවට", තාත්තා විස්තර කළා.

"බහිරව ලෝකයේ චූටි සීයා වගේ ම මා ත් කැමති යි ආකාශ වස්තු විද්‍යාව ඉගෙන ගන්න", දිමුතු කිවා.

"අගෙ යි. ඉතින් හැබෑට ම කැමති නම්, අපි වැඩ පටන් ගනිමු!"

"මොන වැඩේ ද?" දිලාන්ති ඇහුවා.

"අපේ ජෝති විද්‍යා වැඩ. ඔය ළමයි දන්නවා ප්‍රධාන දේ නිරීක්ෂණය කිරීම. අපි ඉර නිරීක්ෂණය කරමු. මම කියන ආකාරයට වැඩ පටන් ගනිමු. මේ වැඩ සපුරාලන්නට බොහොම කල් ඕන වෙනවා. සමහර විට ළමයින්ට හෙට ඒ වැඩ සපුරාලීමට නො

ඉස්සර කාලේ හිරු නිරීක්ෂණය කළ හැටි.



හැකි වෙවි."

"ඇයි? අපි මහන්සි ගනිමු!"

"සත්තකින් ම මහන්සි ගන්න ඕන. එහෙම නැතුව කිසි ම දෙයක් කරන්න බැහැ. නමුත් උත්සාහ කිරීම පමණක් ප්‍රමාණවත් නො වන අවස්ථා තියෙනවා."

ළමයි කල්පනා කරන්නට වුනා.

"ඔවු, මට තේරුම් ගන්න පුළුවනි. හෙට වැස්ස තිබුණොත්, අපට ඉර නිරීක්ෂණය කරන්න බැහැ!" දිලාන්ති කීවා.

"ඒන්න ඉතින් අපි වැදගත් දෙයක් ඉගෙන ගත්තා. ජොති විද්‍යා නිරීක්ෂණ වැහි දවස්වලට පවත්වන්න බැහැ. අපට වලාකුල් බාධා කරනවා," තාත්තා විස්තර කළා.

"බාධා කරන්නේ කොහොම ද?" දිමුතු ප්‍රශ්න කළා.

"බොහොම ලේසි යි. එය තේරුම් ගන්න. ඔන්න මම දිමුතු සහ දිලාන්ති මැදින් හිට ගත්තා. දිමුතු කියන්න දැන් දිලාන්ති කරන්නේ මොනවා ද කියලා?" තාත්තා ඇහුවා.

"මට දිලාන්තිව පෙනෙන්නේ නැහැ," පුතා පිළිතුරු දුන්නා.

"මක්නිසා ද?"

"තාත්තා අක්කාව බැලීමට මට බාධා කරන හන්ද."

"හරියට හරි. ඔන්න ඔය විදිහට වලාකුළු ඉර, හඳ, තාරකා බැලීමට බාධා කරනවා. තේරුම් ගත්තා ද?"

"ඔවු," පුතා උත්තර දුන්නා.

"ඔන්න එහෙනම් තවත් ප්‍රශ්නයක් ගැන කල්පනා කරන්න. අපට වැඩියෙන් මෙ වලාකුළු ද, ඉර ද?"

දලාන්තිට පැහැදිලි යි, නමුත් දිමුතු කල්පනා කරන්න පටන් ගත්තා...

තාත්තා දිමුතු ගෙන් වෙනත් ප්‍රශ්නයක් ඇහුවා.

"මම පුතාට යි, දිලාන්තිට යි මැදින් හිට ගත්තා ම පුතාට වැඩියෙන් ම ළඟින් ඉන්නේ කවු ද?"

එවිට දිමුතු තේරුම් ගත්තා. ළඟින් හිටියේ තාත්තා.

"දැන් මට තේරුම් ගන්නට පුළුවනි. අපට වලාකුළු බාධා කරනවා නම් ඒවා අපට වඩා ත් ළඟින් තියෙනවා," දිමුතු කීවා.

"මා ත් කල්පනා කළේ එහෙම තම යි," දිලාන්ති කිව්වා.

"දැන් අපි වැදගත් දේ ගැන තේරුම්, කෙරුම් කර ගත්තා. අදට නවත්වමු. වෙනින් දවසක පටන් ගනිමු" යි තාත්තා යෝජනා කළා.

"කළු යුතු වැඩ ගැන අමතක වුනා" යැයි දිලාන්ති කියුවා.

"ළමයින් ඉක්මන් වෙන්න එපා. නිරීක්ෂණය කිරීමට අවශ්‍ය දේ සූදානම් කර ගන්න ඕන," තාත්තා ළමයිනට මතක් කළා.

හිරු බැලීමට ඇස් කණ්ණාඩි

"අවශ්‍ය දේ සූදානම් කර ගන්න ඕන කියලා තාත්තා කියුවේ මොනවා ගැන ද?" බාලාංශ පන්තිය ඉවර වෙලා ගෙදර එන ගමන් දිලාන්ති මල්ලි ගෙන් ඇහුවා.

"තැග්ගක් ගැන". දිමුතු එක වර ම උත්තර දුන්නා.

"සමහර විට තැග්ගක් වෙන්න පුළුවන්. නමුත් කොයි විදිහේ තැග්ගක් ද?"

මේ වේලාවේ දී තාත්තා ගෙදර ආවා. ළමයි දෙන්නා තාත්තා ළඟට දුවගෙන ගියා.

"ගෙනාවා ද? ගෙනාවා ද?"

"ඔවු. ගෙනාවා. චූටි සීයා ළමයින්ට තැගි දෙන්න කියලා මට බාර දුන්නා. ඔන්න ඉතින් මා කියන දේ කරපල්ලා. ඉස්සෙල්ලා ම දැන් පහත දමා ගන්නවා! ඊළඟට ඇස් වහ ගන්නවා! දැන් ඉතින් ඇස් හැර බලාපල්ලා!" තාත්තා කීවා.

"අනේ, අපට කිසි ම දෙයක් පේන්නේ නැහැ. අපේ ඇස්වලට කළු පාට වෙස් මුණු වගේ මොනවාදෝ අන්දවලා!" යැයි ළමයි කියුවෝ ය.



"ඒවා වෙස් මුහුණු නොවේ, චූටි සීයා ගෙනැත් දීපු තැගි. ඉර බලන ඇස් කණ්ණාඩි."

තාත්තා එසේ කියා ළමයිනට ඇන්දවූ හිරු බලන ඇස් කණ්ණාඩි ගැළවී ය. කාඩ්බෝඩ් වලින් සැදූ රාමුවට කළු පාට සැලෝලයිට් පටක අලවා ඇති කණ්ණාඩිය හිස වටේට දමා ගැනීමට රබර් තුනී පටියක් කාඩ්-බොඩ් රාමුවට සවි කරලා තිබුණා.

"මේක ත් තැග්ගක් ද? මේ වගේ දෙයක් මට වුනත් හදා ගන්න පුළුවනි." එසේ කීවේ දිමුතු.

"බොහොම අපූරු යි, පුතා ඒ වගේ කණ්ණාඩි හදන්නේ කොහොම ද?" තාත්තා ඇහුවා.

"කාඩ්බෝඩ් වලින් සහ රබර් පටියකින්. නමුත් මට කළු පාට පටක විතරක් නැහැ," පුතා පිළිතුරු දුන්නා.

"අමනාප වෙන්න එපා. අපට ඕනෑ තරම් පටක තියෙනවා," තාත්තා පුතාව සැනසුවා.

ඡායා රූපවල කළු පාට පටක තැන්පත් කළ පරණ පෙට්ටියක් තාත්තා අතට ගත්තේ ය. එයින් ඉතා ම කළු පාට පටක කිපයක් කපා ගත්තේ ය. ඉන් පසු ව ඒවා ළමයිනට බෙදා දුන්නේ ය.

"ඔය දෙදෙනා සාදන කණ්ණාඩිවලට අවශ්‍ය 'කළුවිදුරු' තම යි ඔවා."

"අපි මොකට ද ඒවා ආයෙමත් හදන්නේ? අපට ඒවා තියෙනවා නෙව."

"පුතාලා ගේ යාළුවන්ට ඕන වෙවි. ළමාගාරයේ ඒ ගොල්ලන් කැමති වෙවි ඒ වගේ ඇස් කණ්ණාඩිවලට. ඉතින් ඔයාලා ඒ ළමයින්ට හදලා දෙන්න."

"අපෝ. ඒ ගොල්ල කැමති වෙන්නේ නැහැ. මේ ඇස් කණ්ණාඩිවලින් කිසි ම දෙයක් පේන්නේ නැහැ!" යි දිමුතු කිව්වා.

"මේ කාමරේ ඇතුලේ නම් කිසි දෙයක් පේන්නේ නැති එක නම් සැබෑ තම යි. ඒවා ඉර බැලීමට විතර යි ඕන වෙන්නේ."

"කළු පාට කණ්ණාඩි මොකට ද?"

"මම දන්නවා. ඉරු රැස් වල සැර ඇස්වලට නොවදින්නට," දිලාන්ති කිව්වා.

"ඇත්ත. ඉර දිහා බලන්න බැහැ. විශේෂයෙන් දවල් කාලෙට. සැරට ඉර පායන විට. ඇස් ආරක්සා කරන කණ්ණාඩි නැතුව ඉර දිහා බලන්න බැහැ. එහෙම නැතුව නිකම් ඉර දිහා බැලුවොත් ඇස් පෙනීම නරක් වේවි. ඒ බව ඉතා හොඳින් මතක තබා ගන්න. **කළු පාට ඇස් කණ්ණාඩි දා ගෙන වුනත් වැඩි වෙලාවක් ඉර දිහා බලන්න හොඳ නැහැ.**" තාත්තා විස්තර කළා.

"ඔන්න දැන් පළමුවැනි නිරීක්ෂණය: ඉර දිහා බලාලා, ඉර කොයි වගේ ද කියලා මට විස්තර කරන්න," තාත්තා ඉල්ලා හිටියා.

දිමුතු, දිලාන්ති සහ ළමාගාරයේ අනික් ළමයින් සමග එකතු වෙලා, කළු කණ්ණාඩි ඇහේ ලා ගෙන ඉර බලාපු හැටි තාත්තාට විස්තර කළා.

"ඉතින් ඔය ගොල්ල දැක්කේ මොනවා ද? මතක තියෙන්නේ මොනවා ද?" තාත්තා ඇහුවා.

"ඉර වට රවුමක් වගේ," දිලාන්ති කිව්වා.

"ඔව්, හරියට වට රවුමක් වගේ ම යි," දිමුතු අක්කා ගේ කතාව ස්ථිර කළා.

"ඉතින් ඒක එහෙම තම යි. නමුත් ඉර හැබෑට ම වට රවුමක් විතරක් ද?" තාත්තා ඇහුවා.

"ඔව්, වට රවුමක් විතර යි," දිමුතු ස්ථිර කළා.

"පුතා එහෙම සිතන්නේ මක්නිසා ද?" තාත්තා ඇහුවා.

"ඒක වටකුරු වට රවුමක් හන්දා".

"හොඳ යි, පුතා ගේ සෙල්ලම් බඩු අතර වටකුරු දේ තියෙනවා ද?" තාත්තා විමසුවා.

"අපොයි තියෙනවා. ලොකු සහ කුඩා බෝල". දිමුතු පිළිතුරු දුන්නා.

වට රවුමක් ද? ගෝලයක් ද?



ඉර ගිනිගත් ගෝලයකි.







"ඒවා මෙහාට ගෙනෙන්න. දිලාන්ති දුවේ, ඔයා මට කාඩ්බෝඩ් කැල්ලකු යි, කතුරකු යි ගේන්න," තාත්තා ඉල්ලා හිටියා.

තාත්තා කව කටුව අරගෙනැ කාඩ් බෝඩය මත වට රවුම් කීපයක් ඇන්දා. ඉන් පසු ඒවා කතුරෙන් කපා ගත්තා.

"ඔන්න ඉතින් මේ වට රවුම්, බෝලය ත් එක්ක සන්සන්දනය කරලා බලන්න. ඒවා එකින් එකට සමාන ද?"

"බොහොම සමාන යි," දිමුතු කීවා.

"ඇත්ත තම යි" තාත්තා එකහ වුනා. "ඒවායේ සමානකම යි, වෙනස්කම යි මොනවා ද?"

"ඒවා වටකුරු යි, නමුත් බෝලය ඛණ්ඩිය වගේ පිරිලා." එහෙම කිව්වේ දිමුතු.

තාත්තා සහ දිලාන්ති හිනා වුනා.

"දුව දන්නවා ද පුතා ගේ කිම නිවැරදි බව. බෝලය ගැන කියන විට ඛණ්ඩිය කියලා නො වේ, පරිමාව කියල යි, වට රවුම් පැතලි කියලා යි ලොකු මිනිසුන් කියන්නේ. අපි කාඩ් බෝඩ් කැල්ලෙන් කපා ගත් දේ නම් කරන්නේ කොහොම ද?" තාත්තා ඇහුවා.

"වට රවුම්," දිලාන්ති කීවා.

"නමුත් බෝලය ත් ඒ වගේ නො වේ ද?"

"නැහැ, නැහැ! බෝලය වටකුරු වුනාට වට රවුමක් නො වේ." දිමුතු කීවා.

"අන්න හරි" යැයි තාත්තා ස්ථිර කළා. "බෝලය ගෝලාකාර දෙයක්. **ඉර** ත් **ගෝලාකාර වස්තුවක්**. බොහෝ කාලයක් තිස්සේ විද්‍යාඥයෝ ඒ ගැන දන්නවා."

චූටි සීයා ගේ අපූරු යාළුවා

"දිලාන්ති අක්කේ! ඉක්මනට එන්න! තාත්තා අපට මැජික් ලාම්පුවෙන් දර්ශන පෙන්වන්න යනවා!" දිමුතු අක්කාට අඬ ගැසී ය.

"අද මම අපේ චූටි සීයා ගේ ඉල්ලීමක් ඉටු කරන්න සිතා ගත්තා" යැයි තාත්තා මෙයින්ට කීවා. "මම චූටි සීයාට කිව්වා, ඔය ළමයි ඉර බලාපු හැටි. එතකොට චූටි සීයා කිව්වා, අලුත් පර්යේෂණ කරන්න ඉස්සර වෙලා ඔයාලා ආලෝක රශ්මි ධාරා හදුණා ගන්න ඕන කියලා. ආලෝක රශ්මි ධාරා චූටි සීයා ගේ ඉතා හොඳ යාළුවෙක්."

"ආලෝක රශ්මි ධාරා අපව බලන්න එනවා ද?" දිමුතු ඇසුවා.

"සත්තකින් ම එනවා" යැයි කී තාත්තා මැජික් විදුලි පහනේ ස්විචි යතුර දමන ලෙස දිලාන්තිට කීවා.





විදුලි පහන දල්වූ නමුදු තිරයේ කිසි ම චිත්‍රයක් තිබුණේ නැහැ.

තිරය ආලෝක රශ්මී ධාරා නිසා පැහැදිලි ලෙස බැබලෙනවා. "චැඩකට ඇති දෙයක් නැතැ!" යි ළමයින් දෙදෙනා කල්පනා කළා.

"අලෝක රශ්මී ධාරා ඇවිල්ලා. බලාපල්ලා ආලෝක රශ්මී ධාරා පහනේ ඉඳලා තිරයට වැටී ඇති හැටි."

"චිත්‍ර පට බලන්න ගියාම අපි හැමදා ම එය දකිනවා," දිලාන්ති කීවා.

"චිත්‍ර පටී බලන්න ආස යි. මෙතැන මොනවත් නැහැ. නිකම් ආලෝකය විතර යි," දිමුතු කීවේ හිතේ අමාරුවෙන්.

"අපට ඕන තිරයට ආලෝක ධාරා වැටීම විතර යි. අපි දැන් පර්යේෂණ පවත්වමු. ඔන්න පළමුවැනි පර්යේෂණය: අතේ හෙවනැල්ල තිරයට වැටිලා තියෙනවා." එසේ කී තාත්තා අත එසැවී ය. අතේ ඡායාව තිරයට වැටිණි. අතේ ඡායාව විශාලය, කළු පාට ය!

"දැන් මම නොයෙක් සතුන් ගේ හෙවණැලි හදලා පෙන්වන්නම්."

ළමයින්ට වචනයක් වත් කීමට ඉඩ ලැබුණේ නැහැ. තිරයේ සාවකු ගේ, බළල් පැටවකු ගේ සහ හංසයකු ගේ ඡායා මැවුනා.

"තිරයට හෙවණැල්ල වැටෙන්නේ මක්නිසා ද?" තාත්තා ප්‍රශ්න කළා.

"මැජික් ලාම්පුවෙන්," දිලාන්ති කීවා.

"අපේ අත් වලින්," දිමුතු එකතු කළා.

"එහෙනම් හෙවණැල්ලක් ඇතිවීමට කිසියම් ආලෝකයක් සහ වස්තුවක් ඕන.



හරි ද?"

"ඔව්, හරි" ළමයින් උත්තර දුන්නා.

"ඔනෑ ම වස්තුවක් හරියනවා ද?" තාත්තා ඇසුවා.

"හරියනවා." එහෙම කීවේ දිමුතු. තිරයේ බෝලයක, පැන්සලයක සහ සෙල්ලම් කාර් එකක හෙවනැලි පෙනුනා.

"ඔන්න මම එක් දෙයක් අරගෙන මැපික් ලාම්පුවට යි, තිරයට යි අතරින් තියනවා. නමුත් කිසි ම හෙවණැල්ලක් නැහැ!"

"තාත්තා ගත්තේ වස්තුවක් නො වෙයි, නිකම් විදුරු කැල්ලක්," දිමුතු හිනා වුනා.

"ඒක කිසි දෙයක් නො වේ ද?"

"ඒක වස්තුවක්," දිලාන්ති කීවා.

"ඉතින් මේ විදුරු කැල්ල සහ සෙල්ලම් බඩු අතර ඇති වෙනස මොකක් ද?" තාත්තා ඇසුවා.

"විදුරුව බොහොම තුනී යි", දිමුතු කිව්වා.

"ඉතින් ඒකට මොක ද? එහෙනම් මම කඩදාසි කොළයක් ගන්නම්. ඒකෙන් යස සෙවණැල්ලක් ලැබෙනවා. කඩදාසිය විදුරුවට ත් වඩා තුනී නෙව... එහෙනම් මෙතැන රහස මොකක් ද?"

"විදුරුවෙන් චිනිවිද පේනවා. කඩදාසියෙන් එහෙම පෙනෙන්නේ නැහැ," දිලාන්ති අනුමානයෙන් නිගමනය කළා.

"හරියට හරි," තාත්තා එකඟ වුනා. "මතක තියා

ගන්න: විනිවිද පෙනෙන්නේ නැති දෙයකට ආලෝක ධාරා වැටුනා ම, හෙවණැල්ල ඇති වෙනවා. එහෙම හෙවණැල්ල ඇති වෙන්නේ ආලෝක ධාරා වලට විනිවිද යාමට නො හැකි වූ විට යි".

"එහෙම වෙන්නේ මොක ද?" දිමුතු ප්‍රශ්න කළේ ඔහුට නො තේරෙන හන්දා.

"තේරුම් ගන්න ලේසි යි. ඔන්න පුතා බයිසිකලයක නැගලා යන විට, ඉස්සරහ ගහක් තියෙනවා, ඉතින් පුතා ගහ පළාගෙන එය අස්සෙන් රිංගන්න හදනවා ද?"

"අපොයි, නැහැ!" දිමුතු හිනාවුනා.

"එහෙනම් පුතා කරන්නේ මොනවා ද?"

"මම ගහට නො වැදී එය ළඟින් යනවා."

"හරියට හරි" යැයි එකඟ වූ තාත්තා මෙහෙම විස්තර කළා: පුතාට පුළුවනි, ගහ ළඟින් යන්න. නමුත් ආලෝක ධාරාවලට එහෙම යන්න බැහැ. ඒවාට හැරෙන්නේ නැතුව කෙළින් ම යන්න පුළුවනි, එවිවර යි. ඒ නිසා තම යි හෙවනැල්ල ඇති වෙන්නේ. ආලෝක ධාරාවලට යම්කිසි දෙයක් අසලින් යන්න පුළුවන් නම් හෙවනැලි ඇති වෙන්නේ නැහැ."

"ආලෝක ධාරාවලට ඉක්මණින් යන්නට හැකි ද?" දිලාන්ති ප්‍රශ්න කළා.

"බොහොම වේගයෙන්. ඉතා ම සිඝ්‍රගාමී දුම්රියට ත් වඩා වේගයෙන්..." තාත්තා විස්තර කළා.

"ගුවන් යානාවට ත් වඩා වේගයෙන් ද?" දිමුතු ප්‍රශ්න කළා.

"අජටාකාශ රොකට්ටුවට ත් වඩා වේගයෙන් ද?" එසේ දිලාන්ති ප්‍රශ්න කළේ අවිශ්වාසයෙන්.

"ඔව්. **ආලෝක ධාරාව මේ ලෝකයේ තියෙන සියලු දේට වඩා වැඩි වේගයෙන් ගමන් කරනවා**" කියලා තාත්තා කිවා. "මොස්කව් ඉඳලා විලදිවස්තෝක් දක්වා තත්පරයකින් යන්නට පුළුවනි. ආලෝක ධාරාව එතරම් වේගවත්. අපි ඇසි පිය හෙළන්නට ත් ඉස්සෙල්ලා ආලෝක ධාරාව එතරම් වේගයෙන් එහාට ගිහිල්ලා ත් ඉවර යි!"

"ඔන්න පුදුමයක හැටි!" දිමුතු ප්‍රබෝධයට පත් වුනා.

"ආලෝක ධාරා කොතරම් වේගයෙන් ගුවනවා ද! නමුත් මට තේරුම් ගන්න බැහැ චුට්ටි සීයා අපට ආලෝක ධාරාව හඳුන්වා දුන්නේ මොක ද කියලා. අපේ කැමැත්ත ඉර ගැන දැනගැනීම යි" දිලාන්ති කිවා.

"ඉර ගැන කරුණු දැන ගැනීමට අපට ආලෝක





ධාරා අවශ්‍ය වෙනවා," තාත්තා පිළිතුරු දුන්නා. "ඉර ලෝකයේ සෑම පැත්තට ම රැස් විහිදුවා යවනවා, ඒවා තම යි ආලෝක ධාරා. ඉර ගැන අපට බොහෝ දේ දැනගන්න ලැබෙන්නේ ආලෝක ධාරා නිසා."

"ආලෝක ධාරා වලින් අපට යමක් දැනගන්න පුළුවන් ද?" දිලාන්ති ඇහුවා.

"අපොයි පුළුවනි," තාත්තා පිළිතුරු දුන්නේ මඳ සිනා පාමිනි. "මී ළඟ වාරේ දී මම ඒ ගැන විස්තර කරන්නම්."

ඉර ඇත ද?

ළමාගාරයේ ළමයින් සෙල්ලම් කළා. පන්දු ගැහුවා, උඩ පැන්නා, තරහෙට දිව්වා. ගෙදර ඇවිත් දිලාන්ති යි, දිමුතු යි ඒ ගැන කතා කළා. තරහෙට දුවපු හැටි මතක් කළා.

තාත්තා ඒ කතා අහ ගෙන ඉඳලා ප්‍රශ්න කළා:

"පුතාට වැඩිය ඉක්මණින් දිව්වේ කවුද?"

"රුවන්. එයා ඉක්මණට දුවනවා. සයිකල් පදිනවා නම් මට පුළුවනි එයාට පරද්දන්න," දිමුතු පිළිතුරු දුන්නා.

"බයිසිකල් පදිනවා නම් මම ත් ඔක්කෝමල්ලාව පරද්දනවා" එහෙම කීවේ දිලාන්ති.

"ඒ කොහොම ද?" තාත්තා ඇහුවා.

"බයිසිකලේ වේගය වැඩි හන්දා. මිනිසා දුවනවාට වඩා වේගයෙන් බයිසිකල් පදින්න පුළුවනි," දිමුතු කිවා.

"සයිකලයට වැඩි වේගයන් යන්න පුළුවන් මොකෙන් ද?"

"මෝටර් සයිකලයෙන්!"

"එයට වැඩිය වේගයෙන්?"

"රේස් දුවන කාර් එකෙන්!"

"එයට ත් වැඩිය වේගයෙන්?"

"ගුවන් යානයෙන්!"

"ගුවන් යානයට ත් වැඩි වේගයෙන්?"

"රොකට්ටුවෙන් (මිසයිලයෙන්)!"

"රොකට්ටුවට ත් වැඩිය වේගයෙන්?"

දිමුතු කල්පනා කරන්න වුනා.

"අමතක වුනා ද?" තාත්තා ඇසුවේ තරමක සිත් තැවුලෙන්.

"මට මතක යි. ආලෝක ධාරා!" දිලාන්ති කියලා අත්පුඩි ගැහැව්වා.

"අපි ආලෝක ධාරාවක් උඩ නැග්ලා රුවන්ව පරද්දවමු!" යි කී දිමුතු හිනා වුනා.

"පුතා විකාර දේ සිතනවා. ආලෝක ධාරා ඔය තරම් ලුටි දුරක් යාවි ද!"

"එහෙනම් කොච්චර දුරක් ද?"

"ඔයාලා දිව්වේ මීටර කිපයක දුර විතර යි නෙව. පටන් ගැනීම යි අවසානය යි අතර දුර මීටර් පනහක් විතර ඇති නෙව. ආලෝක ධාරා ඉතා ම විශාල දුරක් යන්න කැමති යි."

"නැතිනම් හැතැප්ම පන්සියයක් විතර දුවන්න කියල කියනවා ද?" දිමුතු ඇහුවා.

"නැහැ. එයට ත් වඩා බොහොම ලොකු දුරක්," තාත්තා කිවා.

"එහෙනම් ඇමරිකාව දක්වා දුරක් ද?"

"ආලෝක ධාරාවට ඒ දුර බොහොම සුළු දෙයක්. ඔන්න හිරු ගේ සිට පෘථිවිය දක්වා දුරක් දුවන්නට නම් ආලෝක ධාරා කැමති වෙවි," තාත්තා විස්තර කළා.

"ඉර බොහොම ඇත ද?" දිලාන්ති ඇහුවා.

"ඔව්, බොහොම ඇත."

"තාත්තේ, සංචාරකයෙකුට ඉරට යන්නට පුළුවන් ද?" දිමුතු ඇහුවා.

"අපටාකාශයේ පයින් යන මාර්ග, වාහන වලට මාර්ග කිසිවක් නැහැ. අපි පිවත් වන ලෝකයේ ඉදලා ඉර දක්වා ඇති දුර ප්‍රමාණය බොහොම ලොකු යි. ඒ පාර මහ පොළව දිගේ තිබුණා නම් ඉර දක්වා යාමට අවුරුදු තුන්දාස් පන්සියක් යාවි," තාත්තා විස්තර කළා.

ළමයි පුදුම වුනා.

"කාර් එකෙන් යනවා නම් සමහර විට මිනිහෙකු ගේ පිවිත කාලය තුළ දි යන්න ඇහැකි වෙවි නේද?" දිලාන්ති ඇසුවා.

තාත්තා කොළයක ගණන් හදලා උත්තර දුන්නා:

"එහෙම ගියොත් අවුරුදු දෙසියක් විතර යාවි. නමුත් මිනිහෙක් සාමාන්‍යයෙන් පිවත් වන්නේ අවුරුදු හැත්තෑවක් පමණ යි. ඉතින් ඔහුට කාර් එකෙන් යන්න පුළුවන් ද?"

"බැහැ" යි දිලාන්ති පිළිතුරු දුන්නේ. හැත්තැව දෙසියයට වඩා අඩු බව දන්නා නිසා ය.

"ගුවන් යානයෙන් ගියොත් කොපමණ කල් යාවිද?" දිමුතු ඇහුවා.

"අපි දැන් ගණන් හදලා බලමු. ජෙට් ගුවන් යානයෙන් යනවා නම් ඒ දුර අවුරුදු විස්සෙන් යන්නට පුළුවන්! ඉතින් ඉර බොහොම ඈත නොවේ ද?" තාත්තා ඇහුවා.

"හුහක් දුර යි. අජටාකාශ ගාමියෙක් රොකට් එකෙන් යනවා නම් කොපමණ කල් ගත වේවි ද?" පුතා ප්‍රශ්න කළා.

තාත්තා නැවත ගණන් බලා පිළිතුරු දුන්නේ ය:

"මාස කිපයකින් යන්නට පුළුවනි!"

"ආලෝක ධාරාවලට හිරු ගේ ඉඳලා අප ගේ ලෝකයට පැමිණීමට කොපමණ වේලා ගත වෙනවා ද?"

"ආලෝක ධාරාවලට එතරම් වේලාවක් යන්නේ නැහැ. වේගය කොතරම් ද කියලා කිවොත් විනාඩි අටකින් ආලෝක ධාරාවලට හිරු ගේ ඉඳලා අප ගේ ලෝකයට එන්නට පුළුවනි."

"ඒක හරිම අපූරුයි!" දිමුතු කීවේ ඉමහත් උද්දාමයකින්. "ආලෝක ධාරා බොහොම දක්ෂ යි."

"තාත්තා ගිය වර අපට කීවා නේද ආලෝක ධාරා වලින් අපට ඉර ගැන දැනගන්න පුළුවන් කියලා?" දිලාන්ති මතක් කළා.

"ආලෝක ධාරා අපට ඉර ගැන දැනට ම ත් තොරතුරු කියා තියෙනවා. **ඉර අප ජීවත්වන මහ පොළොවෙන් බොහෝ ඈත තියෙන** බව අපි දැන ගත්තා. ඉතා ම ඉක්මණින් ධාවන ආලෝක ධාරා වලට පවා අප වෙත එන්නට විනාඩි අටක් ගත වෙනවා. ඒ විනාඩි අට තුළ දී ආලෝක ධාරා කිලෝමීටර දස ලක්ෂ 150 ක් දුර ගෙවනවා. **ඉර ඉතා ම අධික උෂ්ණයක් ඇති වස්තුවක්. ගිනි ගෙන දැවෙන විශාල ගෝලයක්.**"

"ඔය දේ ගැන අපට ආලෝක ධාරා කිවා යැයි මට තේරුම් ගන්න බැහැ," දිමුතු කීවා.

"ඔය ළමයින්ට මතක ද අපි ගං ඉවුරට වෙලා හිරු රැස් නාපු හැටි. අපි ඉර අවට අපේ පිට ඇල්ලුවා. රත් වුනා නේද?" තාත්තා ඇහුවා.

"පිච්චෙන්න තරම් රත්වුනා!" දිමුතු පැවසී ය.

"ඔන්න පේනවා ද! ඔය තරම් විශාල දුරක් ආපු ආලෝක ධාරා අපේ හම රත් කළා. එහි තේරුම, ඉර විශාල ගිනි බෝලයක් බව යි."



ඉර ලොකු ද, කුඩා ද?

"හෙට ඉරිදා. අපි ගහට යමු" යි තාත්තා යෝජනා කළා.

"බොහොම හොඳ යි!" දිමුතු සතුටු වෙමින් කීවා: "අපි ගහේ නාමු! හොඳ කාල ගුණයක් තිබුණොත්, ඒ ඇති!"

ඔවුනට එදා හොඳ දවසක් විය. ළමයි නාමින් දුව පැන ඇවිද්දෝ ය. නිල්වන් අහසේ ගුවන් යානා පියාඹන්නට වුනා. ඈත ඉතා කුඩාවට පෙනෙන ගුවන් යානයක් ළං වෙන විට, ගුවන් තොටු පොලේ ඇති යානාවක් තරම් ඇස් පනා පිට විශාල වන සැටි ත්, එය අහසේ ඇත යන විට යළි කුඩා වන සැටි ත් ළමයි දුටුවා.

"තාත්තේ, ගුවන් යානාවේ ඩාඩිවෙලා ඉන්න මිනිසුන් යානාව වගේ ම කුඩා වෙනවා ද?" දිමුතු ඇහුවා.

"නැහැ. ඒ ගොල්ල අප වගේ ම යි, කුඩා වෙන්නේ නැහැ," තාත්තා උත්තර දුන්නා.

"එහෙනම් ගුවන් යානාව ත් බිම තියන විදියට ම කුඩා නො වී තියෙනවා," දිමුතු කල්පනා කළා. "ගුවන් යානාව කුඩා වුනා වගේ අපට පෙනෙනවා විතරක් නේද?"



"ඔව්, එහෙම තමයි. එය අපේ ඇහැට පෙනෙන සැටි. අපට දුරින් තියෙන ඕනෑ ම ලොකු දෙයක් වුනත් අපට පෙනෙන්නේ කුඩාවට. ඇත්වීම වැඩි වන තරමට එය කුඩා වී පෙනෙනවා. තේරුණා ද?"

"ඔවු," ළමයි උත්තර දුන්නා.

"එහෙනම් අපි දැන් ඉර දිහා බලමු. ඉස්සෙල්ලා ම ඉර බලන කළු කණ්ණාඩි ඇඳ ගනිල්ලා."

"අනේ, අර බලන්නකෝ, ඉර පා පන්දුවක් තරම් කුඩාවට පෙනෙනවා!" දිමුතු කීවා.

"අපට ඉර පුංචියට පෙනෙන්නේ එය අපට ඉතාමත් ම දුරින් තියෙන නිසා," දිලාන්ති විස්තර කළා.

"ඇත්තට ම ඉර කොතරම් විශාල ද?" එහෙම ඇසුවේ දිමුතු.

"ඇත්තට ම නම් ඉර කොතරම් විශාල ද කියලා කීවොත් අපි පිවත් වන මහ පොළොව පවා එයට සන්සන්දනය කරන විට ඉතා කුඩා වස්තුවක්. **ඉර** ගිනි

ගෙන උතුරන ගෝලයක් විතරක් නොවෙයි, **මහා යෝද ගෝලයක්!**'' තාත්තා උත්තර දුන්නා.

''යෝද මහා ලොකු ගෝලයක්...'' යැයි ඇඳ-පැද කිසිලුකු නැවත ඉර බලන ඇස් කණ්ණාඩිය ඇහේ දමා ගෙන ඉර දිහා බැලුවා...

දවසක් දා හවස තාත්තා මෙහෙම කිවා:

''අද ආයෙමත් චූටි සීයා බහිරව ලෝකයේ ඉඳලා ඇවිත් මාව හමු වුනා. අපි ආකාශ වස්තු විද්‍යාව ඉගෙන ගන්නවා ද කියලා එයා මගෙන් විස්තර, තොරතුරු ඇහුවා.''

''ඇත්තට ම!'' ළමයි දෙදෙනා එකවර කිවා.

''අපි හැමදා ම ඉර දිහා හොඳට බලනවා,'' දිලාන්ති විස්තර කළා.

''ඉර බලන්නේ කොයි වෙලාවට ද?''

''ළමාගාරයට ගිය හැටියේ ම උදේට ඉර බලනවා. දවල් බතට ඉස්සෙල්ලා බලනවා, හවස ගෙදර එන්න ඉස්සෙල්ලා බලනවා.''

''බොහොම අගෙ යි! අපේ චූටි සීයා බොහොම

ඉර අහසේ ගමන් කරන හැටි



ඉස්සර කාලේ මද්දහන් වෙලාව දනුම් දුන්නේ වෙඩි තැබීමෙන්.

මේ 'කාලතුවක්කුව' හරියට දවල් මද්දහන් වෙලාවට වෙඩි තබයි.

සතුටු වෙව්. සීයා කිව්වා, ඔයගොල්ල දවසකට කිප වරක් ඉර බලන්න ඕන කියලා.''

''චුට්ටි සීයා උනන්දු වන්නේ මොක ද?''

''ඉර අහසේ ගමන් කරන සැටි බලන්න කියලා එයා අපට කිව්වා.''

''අපි එය බලන්නේ කොහොම ද?'' දිලාන්ති මවිත වුනා.

''උදේ, දවල්, හවස ඉර දිහා බලන්න. බලා ලා මතකා තබා ගන්න, ඉර අහසේ කොතැන ද තියෙන්නේ කියලා. අහසේ ඉර ගමන් කරන හැටි හොඳට බලන්න. ප්‍රධාන දෙය එක තැනක සිට හැමදා ම ඉර දෙස බැලීම ය. තේරුම් ගත්තා ද?''

''ඒ විතරක් ද?'' දිමුතු ඇහුවේ හිත නරක් කරගෙන. ''මම හැමදා ම ඉර දිහා බලනවා. උදේට බිරියෝසා ගහ ළඟ තියෙන ඉර දවල් වෙන විට තට්ටු ගොඩනැගිල්ල දෙසට යනවා. හවස් වුනා ම ගරාජයට එහා යනවා.''

''මේක ලේසි වැඩක් කියලා හිතන්න එපා. නියම

ලෙස දැනගන්න නම් තමා විහින් ම හොඳට බලන්න ඕන,'' තාත්තා කිව්වා.

''ඉර අහසේ ගමන් කරනවා කියලා හොඳට දැන ගන්නේ කොහොමද?'' දිමුතු ඇහුවා.

''ඒ සඳහා ග්නෝමොන් කියන උපකරණය ඉස්සර කාලේ ආකාශ වස්තු පරීක්ෂා කරන්නෝ පාවිච්චි කළා.''

''අපි ඒ වගේ දෙයක් කොහෙන් හොයා ගනිමු ද?'' දිලාන්ති ඇහුවේ සිත් තැවුලෙන්.

''එය ඔය ගොල්ලන්ට හදාගන්න පුළුවනි. ඇඳ නැති, දිග කෝටුවක් ඕන. ඉර බලන්නට ලෙහෙසි සමතලා බිමක ඒ කෝටුව උල්කරලා හිටවන්න. ඒ තමයි ග්නෝමොන් උපකරණය!'' තාත්තා ළමයිනට විස්තර කළා.

''ඉතින් අපි ඒ උපකරණය පාවිච්චි කරන්නේ කොහොම ද?'' ළමයින් උනන්දු වුනා.

''මේ කෝටුවට වැටෙන ඉර අවිවෙන් ඇති වන හෙවණැල්ල නිරීක්ෂණය කරන්න ඕන,'' තාත්තා කිව්වා.

''හෙවණැල්ල නිරීක්ෂණය කරන්නේ මොකට ද?'' දිමුතු පුදුම වුනා.

මද්දහන් හිරු සංචාරකයිනට වෙලාව දන ගැනීමට සමහර වෙලාවල දී උදව් විය.

''පුතා ගේ පරණ සෙල්ලම් පිරැමිඩ් එක ගෙනැල්ලා ඒකට අමුණලා තියෙන රෝද ගලවා දැම්මා ම ඉතිරි වෙන්නේ අඩියක් සහිත පුංචි රිටක් විතර යි. දැන් අපි උඩ තියෙන විදුලි පහන නිවලා, මෙස ලාම්පුව විතරක් පත්තු කරමු. එතකොට පහන් ආලෝකය පුංචි රිටට වැටිලා හෙවණැල්ලක් ඇති වෙනවා,'' තාත්තා විස්තර කළා.

''ඔව්. ඇත්තට ම හෙවණැල්ලක්!'' දිමුතු කිව්වා.

''හෙවණැල්ල ඉවර වෙන තැන ලකුණු කරන්න. ඔන්න දැන් ඉතින් බොහොම සැලකිල්ලෙන් බලන්න හෙවණැල්ල වෙනස් වන හැටි,'' තාත්තා ළමයිනට දන්වා සිටියේ ය.

''ඔන්න මම ලාම්පුව ඉහළ ඔසොවනවා!''

''හෙවණැල්ල අඩු වෙනවා.'' දිලාන්ති කිව්වා.

''ඔන්න දැන් ලාම්පුව තියෙන්නේ කොහේ ද?''

''තාත්තා එය ඔසවාපු හන්දා එය උඩින් තියෙනවා,'' දිමුතු උත්තර දුන්නා.

තාත්තා වරෙක ලාම්පුව ඉහළට ඔසොවමින් හා



හිරු ගේ ස්කන්ධය පෘථිවියේ ස්කන්ධයට වඩා තුන් ලක්ෂ තිස් දහස් ගුණයකින් වැඩි ය.

තවත් වරෙක එය පහළ දමමින් කිප වරක් එය ඒ අත, මේ අත ගෙන ගියා. එවිට වරක හෙවණැල්ල දික් වෙලා තවත් වරක එය කෙටි වුනා.

ඉන් පසුව තාත්තා දිග හැරපු අතේ ලාම්පුව තිබා ගෙන ඒ මේ අත වැනුවා. හෙවණැල්ල වෙනස් වන සැටි ළමයින් දුටුවා.

"එහෙනම් ග්නෝමොන් උපකරණට වැටෙන හිරු එළිය නිසා ඇති වන හෙවණැල්ල ත් වෙනස් වෙන්න ඕන," දිලාන්ති කියුවේ ලොකු විශ්වාසයකින් නොවේ.

"සත්තකින් ම. හෙට පුත යි, දුව යි ග්නෝමොන් උපකරණය හිටවලා උදේට යි, දවල්ට යි, හවසට යි ඉර එළිය නිසා වැටෙන හෙවණැල්ල දිහා හොඳට බලන්න ඕන. හෙවණැලි වෙනස් වන සැටි සලකුණු කරන්නැ" යි තාත්තා ඉල්ලා සිටියා.

"ලකුණු කරන්නේ කොහොම ද?" දිමුතු ඇහුවා.

"මෙන්න මෙහෙම" යැයි කී දිලාන්ති මේසය උඩ තිබුණු රිටට යටින් කඩදාසියක් තබා එයට වැටෙන හෙවණැල්ල පැන්සලයකින් සටහන් කළා.

"දිලාන්ති හරි!" යැයි තාත්තා දුව ගේ ක්‍රියාව අනුමත කෙළේ ය. "නමුත් මේ වැඩේ ලෙහෙසි නැහැ. ඉතා හොඳින් ලකුණු කරන්නට උත්සාහ ගන්න."

හිරු පායන දවස්වල දී ළමයි හිරු ගේ හෙවණැල්ල මැනීමේ කටයුතු පටන් ගත්තා.

මුල දී ඒ ගොල්ල ළමාගාරය ඉදිරියේ ඇති සමතලා පොළවේ දිගැති කෝටුවක් හිටවලා හිරු ගේ හෙවණැල්ල මනින්නට පටන් ගත්තා. දිලාන්ති හෙවණැල්ලේ දිගට ඉරක් ඇන්දා. දිමුතු හෙවණැල්ල අවසාන වන තැන ගල් කැටයකින් ලකුණු කළා. දවල් බතට ඉස්සෙල්ලා ළමයි ආයෙමත් හෙවණැල්ල මැන්නා. දිමුතු ඉර නිසා වැටෙන හෙවණැල්ල දිගට ඉරක් ඇඳලා ලකුණු කළා. හවස නැවත වරක් ඒ වගේ ම ඉර අව්ව නිසා වැටෙන ආලෝකයෙන් ඇතිවෙන හෙවණැල්ල ලකුණු කළා. හවස් වන විට ඉර අව්වෙන් ඇති වූ හෙවණැලි තුනක සටහන් ලකුණු කරලා තිබුණා. දෙකක් දිග යි, එකක් කෙටි යි. දවල් දොළහට ඉර අහස මුදුනට ගිය විගස ම හෙවණැල්ල කෙටි වුනා. හවස තාත්තා ගෙදර පැමිණි පසු, දුව යි, පුත යි විස්තර කළා, හිරු ගේ හෙවණැල්ල මැනපු හැටි.

"බොහොම හොඳ යි! දැන් ඉතින් මෙග් ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න! හෙ-

වණැලි එකිනෙකට වෙනස් මක්නිසා ද?'' තාත්තා ප්‍රශ්න කළා.

''ඉර එක තැනක නො සිටිය නිසා'' යැයි දිලාන්ති හනිකට පිළිතුරු දුන්නා.

''උදේ බිරියෝසා ගහට උඩින් ඉර පැවිවා. දවල් ගෙයි වහලට උඩින් හිටියා. හවස ඉර බැහැලා ගියා,'' දිමුතු විස්තර කළා.

''හරියට හරි. ඔයාලා දැක්කා ඉර අහසේ ගමන් කරන හැටි. ඒ ගැන ඔයාලාට විස්තර කරලා දුන්නේ ග්නෝමොන් උපකරණය යි.''

''ඒක කොහොම ද විස්තර කරන්නේ, ඒකට කතා කරන්න බැහැ!''

''නැහැ, එයට කතා කරන්න පුළුවන්. දිවෙන් නො වෙයි. හෙවණැල්ල දික්වීම හා කෙටිවීම අනුව යි. ඉර අහසට නගින විට හෙවණැල්ල කෙටි වෙනවා, බැහැලා යන විට එය දික් වෙනවා. අන්න ඒ විදියට ග්නෝමොන් උපකරණයට කතා කරන්න පුළුවනි. ඒ ගැන ඔය දෙන්නා හොඳට තේරුම් ගත්තා නේද?''

''අපේ දේශනය මින් අවසාන යි, ඔබ හැමට ස්තුති යි,'' දේශකයා සිය දේශනය අවසානයේ දී පැවසී ය. මොස්කව්හි ආකාශ වස්තු විද්‍යාගාරයේ පහන් දල්වන ලදී. දේශනයට සවන් දුන් මිනිස්සු නැගිට ඉවත ගියෝ ය. දිලාන්ති, දිමුතු සහ තාත්තා ද පිට වී ගියෝ ය.

''මිනිස්සු බොහොම ඉස්සර කාලේ ඉඳලා ඉර ගැන සැලකිලි දක්වන්නේ ඇයි?'' තාත්තා ප්‍රශ්න කළා.

දිලාන්ති සහ දිමුතු කල්පනා කරන්නට පටන් ගත්තා.

''ඉර නැතුව අපට ජීවත් වෙන්න පුළුවන් ද?''

''බැහැ.'' දිමුතු එහෙම කියුවේ, කිණුලා ඉර ගිලපු දවසේ ලෝකයේ මහා අන්ධකාරයක් ඇති වුණු සැටි විස්තර කරන ලමා කතාව මතක් වූ නිසා.

''හරි. ඉර නැතුව අපට මේ ලෝකයේ ජීවත් වීමට බැහැ. මක්නිසා ද?'' තාත්තා ප්‍රශ්න කළා.

''බොහොම හිතල ඇති වන නිසා,'' දිමුතු පිළිතුරු දුන්නා.

''බොහොම කළුවර වන නිසා.'' එහෙම උත්තර දුන්නේ දිලාන්ති.

''හරි!'' තාත්තා එකඟ වුනා. ''ඔයලා මගේ ප්‍රශ්නයට පිළිතුරු දීපු නිසා මොස්කව් ආකාශ වස්තු විද්‍යාගාරයේ ඉර සඳහා වෙන්කරලා තියෙන කොටස පෙන්වන්නම්.''

ඉර මිනිසාට සේවය කරයි

"මෙතැන ඉරට අයිති කොටසක් නැහැ, නේද? මෙතැන වතුර නාන්නට පයිප්පයක් තියෙනවා," මවිතයට පත් දිලුතු කීවා.

"හොඳ යි, ඒ වතුර ටැන්කියට අත දමන්න."

"අපොයි! වතුර උණු යි!" දිලාන්ති කීවා.

"දැන් අපි බලමු, මේ වතුර රත් කළේ කොහොම ද කියලා. කළු පාට අඩියක් තියෙන ටැන්කිය දැක්කා ද? එහි පියන සාමාන්‍ය වීදුරු වලින් හදලා තියෙන්නේ: එකේ ඇතුලේ තියෙන නල වලින් සාමාන්‍ය වතුර ලැබෙනවා. හිරු රැස් වීදුරු අතරින් ගිහිල්ලා ලෙහෙසියෙන් වතුර රත් කරනවා. උණු වතුර වලින් ටැන්කිය පිරෙනවා. හිරු රැස් වලින් රත් කරපු වතුර නාන්නට වුනත් පුළුවනි. මේ විදිහට වතුර රත් කරන ටැන්කි දැන් කිපයක් ම තියෙනවා."

රිළහට නාන්නා විශාල අවතල (ඇතුළට නැමුණු) කැඩපතක් ඉදිරියේ හිට ගත්තා. එය විශාල පිහානක් වගේ වටකුරු ය.

"හරියට ආලෝක ධාරා විහිදුවන ප්‍රොජෙක්ටර් එකක් වගෙ යි!" දිලුතු උනන්දුවකින් කීවා.

"ඔවු. ආලෝක ධාරාව කැඩපතට වැදුනොත් මොනවා වෙවී ද?"

"ඉර වගේ වටකුරු ආලෝක ලපයක් ලැබෙනවා" යැයි දිලාන්ති කීවා.

"ඒ ආලෝක ලපය ලැබෙන්නේ සාමාන්‍ය පැතලි කණ්ණාඩි කැල්ලක් ඉර අවිවට අල්ලා ගැනීමෙන්. නමුත් මේ වගේ අවතල කැඩපතකට වැටෙන හිරු රැස්වල ආලෝකය සියල්ල එයින් පිළිබිඹු වී එකට එක්වෙනවා."

"ඉතින් මොක ද?" දිලුතු ඇසුවා.

"කැඩපත හුහාක් ලොකු නිසා ආලෝක ධාරා ගොඩක් එකතු වෙනවා."

"ගිනි අවුලුවා ගන්නට පුළුවන් දෙයක් වගේ, වෙනවා නෙව," දිලාන්ති කියුවේ දෙගිඩියාවෙන්.

"ඔව්, එහෙම කියලා කියන්නට පුළුවන්. එය ගිනි හුලක් වගේ තම යි. මේ ගිනි හුලෙන් යකඩ, ලෝහ වුනත් උණු කරන්න පුළුවනි."

මේ වෙලාවේ දී විද්‍යාගාරය බැලීමට පැමිණි නඩයකුත් සමග එහි පැමිණි මග පෙන්වන්නා ඒ අවතල කැඩපතින් වැටෙන ආලෝක ලපයට ලෝහ කැල්ලක් ඇල්ලුවා. එය උණුවෙන හැටි සියලු දෙනා ම දැක්කා.





ඉර මැද උෂ්ණත්වය සෙල්සි අංශක දෙකෝටියකි. ඉර මතු පිට අංශක හයදාහකි.

"ඉර අව්වේ බලයෙන් ලෝහ උණු කරන උදුනක් දැන් ඔයාලා දැක්කා" යැයි තාත්තා කිව්වා. "ආකාශ වස්තු විද්‍යාගාරයේ දී නුඹලා මගෙන් ඇහුවා මතක ද, අජටාකාශ යානයෙක පියාපත් ගැන?"

"තාත්තා කිව්වා ඒක ඉරු ගේ රැස්වලින් ලබා ගන්නා බලය ඇති බැටරියක් කියලා," දිලුතු මතක් කළා.

"ඔව්, එය හැබෑට ම සූර්ය තාප බැටරියක් තම යි. අජටාකාශ යානයට අවශ්‍ය විදුලි බලය සපයා දෙන්නේ ඒවායින්."

"බැටරියට ඕන කරන බලය ලබා ගන්නේ කොහොම ද?"

"ඒ බැටරියට අපි කියන නම මොකක් ද?" තාත්තා ප්‍රශ්න කළා.

"සූර්ය තාප බැටරි."

"ඔන්න ඒ නමෙන් ප්‍රශ්නයට පිළිතුරු ලැබෙනවා. හිරු රැස් බැටරිය විසින් විදුලි බලයට හරවනවා!"

ඊට දවස් කිපයකට පසුව තාත්තා දිලිසෙන ලස්සන කවරයක් සහිත සඟරාවක් ගෙනාවා. එහි ඇති එක් සින්තූරයක් පෙන්නලා මෙහෙම කිව්වා:

ඉස්සර කාලේ මිනිසුන් ඉරට බයවුනේ මන්ද

"මේක මහා විශාල පිරිමිඩයක්. මිනිස්සු ඉරට

පුරාණ මිසරයේ මිනිසුන් ඉරට වඳින සැටි.

ගරු කිරීමට මේ පිරිමිඩය බොහොම ඉස්සර කාලේ හැදුවා."

"මොන හේතුවක් නිසා ද?" දිලාන්ති ප්‍රශ්න කළා.

"ඉස්සර මිනිසුන් සිතුවේ ඉර මහා බලගතු දිව්‍ය රාජයෙක් කියලා. ඉතින් ඒ දෙවියන්ට මිනිස්සු බය වුනා."

"ඒ ගොල්ල බය වුනේ ඇයි? හිර බොහොම හොඳ යි නෙව. මිනිසුන්ට බොහොම ලොකු සේවයක් කරනවා නෙව!" දිලාන්ති කිව්වා.

"ඇත්ත තම යි!" තාත්තා එකඟ වුනා. "නමුත් ඉර හැමදා ම බොහොම සැරට පායලා ගස් වෙලා දමලා ගිනි ඇති කරනවා. සමහර කාලෙට හිරු වලාකුළු වලට සැඟවිලා. තොර තෝ-ය්‍යක් නැතුව වහිනවා. එහෙම දේශ ගුණය වෙනස් වුනා ම ගොවිතැන් පාළු වෙලා යනවා."

"ඉතින් ඒකට වරදකරුවා ඉර ද?"

"සත්තකින් ම ඉර වරද කරුවා නො වෙයි. නමුත් මිනිසුන් කල්පනා කළේ ඉර ඔවුනට දඬුවම් කරනවා කියලා. ඒ නිසා ඉරට බය වෙලා එය සතුටු කිරීමට නොයෙක් දේ කළා."

"සතුටු කරන්නේ කොහොම ද?" පුතා ඇසුවා.

"නිදසුනක් හැටියට මේ වගේ පිරිමිඩ හදලා ඉරට පූජා කළා. හිරු ගේ කරුණාව ලබා ගැනීම පිණිස මිනිස්සු එකට රැස්වී දණගසා ගෙන හිරුට යාච්ඤා කළා."

"ඒ ගොල්ලා එහෙම කළේ මන්ද? කොහොම කියුවත් හිරුට ඇහෙන්නේ නැහැ නෙව!" දිලාන්ති අන්දමන්ද වෙලා කිව්වා.

"ඒක ඇත්ත තම යි, නමුත් ඒ වුනාට ඉස්සර කාලේ මිනිස්සු ඉර කියන්නේ මොකක් ද කියලා දැනගෙන හිටියේ නැහැ. ඉරට වැඳලා බැගැපත් වී ඉල්ලා හිටියොත් ඉර මිනිසුන්ට අනුකම්පා කරලා උදව් කරයි කියලා මිනිස්සු කල්පනා කළා."

"තාත්තේ, ඉස්සර කාලේ මිනිස්සු ඉර ගැන දැනගෙන හිටියේ මොනවා ද?"

"වැදගත් දෙයක් දැනගෙන හිටියේ නැහැ. ඉර ලෝකයෙන් ඉතා දුර පිහිටි දෙයක් බව ත්, එය ගිනි ගෙන දැවෙන අති විශාල ගෝලාකාර වස්තුවක් බව ත්, එහි පිව ප්‍රාණින්ට පිවත් විය නො හැකි බව ත් ඉස්සර කාලේ මිනිස්සු දැනගෙන හිටියේ නැහැ."

"අපි දැන් ඒවා සේර ම දේ දන්නවා!"

"දැනීම මිනිසාට හැමදා ම ප්‍රයෝජනවත් වෙනවා."

''අපේ චූටි සීයාට අද බොහොම තරහ ඇවිල්ලා,'' තාත්තා කිව්වා.

''ඒ මොක ද?'' දිමුතු ඇසුවේ නොසන්සුන් වෙලා.

''බහිරව ලෝකයේ නුගත් කුරුම්ට්ටෙක් ඉන්නවා. එයා නිසා අපේ චූටි සීයාට තරහ ඇවිල්ලා.''

''නුගත් කුරුම්ට්ටා කියන්නේ කාට ද?'' දිලාන්ති ඇසුවා.

''බහිරව ලෝකයේ කුරුම්ට්ටන් අතර එහෙම නුගත් කුරුම්ට්ටෙක් ඉන්නවා. කිසි දෙයක් හරි හැටි එයා දන්නේ නැහැ. නමුත් බොහොම වැදගත් බවක් මවා පානවා. හැම දෙයක් ගැන ම එය බොහොම පණ්ඩිත තාලෙට කතා කරනවා!''

''ඉතින් චූටි සීයා එයා ත් සමග තරහ වුනේ මන්ද?'' දිලාන්ති ඇහුවා.

''නුගත් කුරුම්ට්ටා පාසල් යන පුංචි දරුවන්ට කතාවක් පැවැත්වුවා. ඒ කතාව අහන්න චූටි සීයා ත් එහි ගියා. නුගත් කුරුම්ට්ටා කියාපු වල්-පල් අහලා, චූටි සීයා ගේ හිස කකියන්නට පටන් අරගෙන.''

නුගත් කුරුම්ට්ටා ඉර ගැන දන්නේ මොනවා ද

හිරුට කැප වූ කතා වලින් අවසාන කතාව මෙතෙක් හිරු ගැන දනගත් දේ යළි පිරික්සා බැලීම ය. නුගත් කුරුම්ට්ටා ගේ කතාවෙ ඇති වැරදි සොයා ගැනීමට මෙයිනට සළස්වනු ලැබේ. නුගත් කුරුම්ට්ටා ගේ කතාව දෙ-තුන් වරක් මෙයිනට කියා දී, සෑම කියැවීමක් ම අවසානයේ දී මෙයින් වැරදි සොයන සැටි සසඳා බලන්න.

"නුගත් කුරුම්ටියා මොනවා කිව්වා ද යන්න ගැන චූටි සීයා තාත්තාට දැන්නුවා ද?" දිලුතු ඇහුවා.

"සත්තකින් ම, චූටි සීයා නුගත් කුරුම්ටියා ගේ කතාව පටි ගත කළා. මම ඒ කතාව එහෙම පිටින් ම ඇහැව්වා."

"තාත්තේ ඒ ගැන කියන්නකෝ!" දිලුතු ඉල්ලා හිටියා.

"මොකට ද?" තාත්තා මවිතයට පත් වුනා. "නුගත් කුරුම්ටියා ගේ කතාව එහෙම පිටින් වැරදි යි."

"කොහොම හරි අපි කැමති යි, ඒ කතාව අහන්න," දිලුතු කිව්වා.

තාත්තා තරමක් වේලා කල්පනා කරලා මෙහෙම කිව්වා:

"හොඳ යි, එහෙනම් මම කියන්නම්. අපි මෙහෙම එකඟ වෙමු: මගේ කතාවට බාධා කරන්න එපා. බොහොම ලොකු සැලකිල්ලකින් කතාවට සවන් දෙන්න. හැම වැරද්දකට ම ඇඟිල්ලක් බැගින් නමා ගන්න. නවන ඇඟිලි ගණන නො පෙනෙන ලෙස ඕය දෙන්නා වාඩි වෙන්න. මගේ කතාවේ අවසානයේ දී අපි ගැනලා බලමු, නුගත් කුරුම්ටියා කොච්චර වැරදි කළා ද කියලා. තේරුණ ද?"

"හරි, අපට තේරුණා!"

තාත්තා දුව සහ පුතාව එකිනෙකා ගේ පිටට හේත්තු වන සේ වාඩි කරවා කතාව කිව්වා.

නුගත් කුරුම්ටියා ගේ කතාව

පුංචි කුරුම්ටියන් අවුන් ගේ පාසල් බංකු වල වාඩි වුනාට පස්සේ නුගත් කුරුම්ටියා බොහොම වැදගත් තැලෙට පංතියේ එහා-මෙහා ඇවිද්දා. ඔන්න ඉතින් ඊට පස්සේ කතාව පටන් ගත්තා: "අපේ විජ්ජාකාර කුරුම්ටි ගුරුතුමා මට ලොකු වැඩක් භාර



දුන්නා. එයා මට කිව්වා ඉරට ගිහිල්ලා එහෙ හොනවා වෙනවා ද කියලා බලාගෙන එරෙන් කියලා. ඒ කාලේ දී ඉර ගැන කිසි ම කෙනෙක්, කිසි දෙයක් දැනගෙන හිටියේ නැහැ. ඉර ගැන පළපුරුදු විද්‍යාඥයා වීම මට පැවරී තිබුණා. ඉසින් මම ඒ වැඩේ කිරීමට එකඟ වුනා. විජ්ජාකාර ගුරුතුමා මට දිපු තරමක සුංඩ ගුවන් යානයක නැගලා මම පියාසර කළා. පැයකින් මම ඉර ළඟට ම ආවා. මම බොහොම දක්ෂ ගුවන් නියමුවෙක්. ඒ නිසා මම සුංඩ ඉර පහු කර ගෙන ගියේ නැහැ. හිරු මතු පිට තියෙන එක් ගුවන් තොටු පොළකට මගේ යානය ගොඩ බැස්සුවා. ඉර මතු පිට වාසය කරන මිනිස්සු – ඉර වැසියෝ මාව පිළි ගැනීමට රොක් වුනා. ඒ රටේ සංගීත වාදක කණ්ඩායම බොහොම ලස්සනට සංගීතය වාදනය කළා. ඒ සංගීත වාදකයෝ බොහොම කෙටිටු යි, නමුත් හිරු රැස් වගේ දිලිසෙනවා. සංගීත වාදනය කළේ හිරු ගේ ආලෝක ධාරා. ඒ ගොල්ල හිරු ගේ රටේ රජ්ජුරුවන් ගේ මෙහෙකරුවන් බව මට කිව්වා. රටේ රජ්ජුරුවෝ ඒ ගොල්ලන්ව එවන දිහාවකට යවන්නේ නැහැ. විනාඩි කිපයකට පස්සේ කාර් එකක් ගෙනල්ලා මාව රටේ එළට ගෙනිව්වා, මට රට පෙන්වීමට. ඒ රටේ පාරවල් බොහොම අපූරු යි. කාර පාරවල් නොවෙයි, යකඩ පාරවල්. ඒ කාර් එක කොතරම් වේගයෙන් දුවන්නට පටන් ගත්තාදයත්,

සමහර වේලාවලට මට හිතලක් පවා දැනුනා. ඉරු ගේ රටේ මිනිස්සු කුරුමිට්ටන් කිව්වා ම එය හරි මදි. නුඹලා ත් කුරුමිට්ටන් නෙව. ඒ වුනත් හිරු ගේ රටේ ඉන්න මිනිසුන්ව නුඹලා ත් සමග සන්සන්දනය කළා ම, ඒ ගොල්ලා අහුටු මිට්ටෝ, නුඹලා යෝදයෝ. මම ඒ ගොල්ලන්ට අපේ රට ගැන විස්තර කළා. එතකොට, ඒ ගොල්ල අපේ රටට පැමිණීමට බොහොම කැමති වුනා. මට කිව්වා ඒ ගොල්ලන්ව අපේ රටට ගෙන යන්නැ යි කියලා. නමුත් මම එයට කැමති වුනේ නැහැ. මගේ ගුවන් යානාවේ ඉඩ තිබුණේ නැහැ. ඒ විතරක් ද ඉර මතු පිටින් හමන හිතල හුළඟ පහර. ඉතින් ඒ නිසා මට උගුරේ සෙම්ගෙඩි හැදුනා. කිසිවෙක් දැනගෙන හිටියේ නැහැ මට බොහෙත් කරන සැටි. බොහොම ඉක්මනට මහ පොළවට පැමිණීමට මට සිද්ද වුනා."



ළමයින් නුගත් කුරුමිට්ටා ගේ කතාව අහලා බක-බක ගාගා හිනා වුනා. ඔහු ගේ කතාවේ ඇති වැරදි අනුව ඇඟිලි නවන්නට ඒ ළමයි පටන් ගත්තා. දැතේ තියෙන ඇඟිලිවලට වඩා වැඩි යි, නුගත් කුරුමිට්ටා ගේ කතාවේ තියෙන වැරදි ගණන.



තාරකා

දෙවැනි කොටසේ අරමුණ: තාරකා චූකලී හිරු මෙන් ම ගිනි ගෙන දැවෙන දැවැන්තමය ගෝලාකාර ආකාශ වස්තු බව මෙයින්ට කියා දීම ය. මේවා පෘථිවියෙන් බොහෝ ඈත පිහිටි නිසා අපට ඒවායේ තාපය නො දැනෙන අතර ඒවා කුඩාවට පෙනෙයි. අහසේ තරුවල් සංඛ්‍යාව ගිණිය නො හැකි ය. ඒ නිසා මිනිස්සු ඒවා හඳුණා ගැනීම පිණිස ඒවා එක්, එක් ගුරුත්තකට එකතු කොටැ, ඒවාට නම් තැබුහ. අහසේ පායන තරු බැලීම පිණිස ජනේලවලින් පිටත වැටෙන පහන් ආලෝකය සහ විදිවල පහන් කණුවල පහන් ආලෝකය අඩු ස්ථානයක් සොයා ගත යුතු ය. නාත්තා මෙයිනට කියන කතාවලින් දැන්වෙන තරු මණ්ඩල සියල්ල අහසේ සෙවීම අවශ්‍ය නො වේ. මහා වලසා නමින් හැඳින්වෙන තාරකා මණ්ඩල සහ ධ්‍රැව තාරකාව මෙයිනට හඳුණා ගත හැකි නම් එය සැහේ. (මෙය සෝච්යට සංගමයේ මෙයිනට බව සඳහන් කරමු) ධ්‍රැව තාරකාව සූචි වලසා නමින් හැඳින්වෙන තාරකා මණ්ඩලයට අයත් විශාල ආකාශ වස්තුව වේ. සෝච්යට සංගමයේ පාසල් මෙයින් සඳහා වසරක් පාසා නිකුත් කරන සංග්‍රහය මගින් ඒ ඒ දිනට අහසේ දැකිය හැකි තරු ගැන විස්තරයක් ඇත.

"තාත්තේ, බහිරව රටේ චුට්ටි සීයා ගේ දුක් සැප කොහොම ද?" දිමුතු ප්‍රශ්න කළා.

"චුට්ටි සීයා දහසක් ඉර ඇති රටට ගිහිල්ලා ආවේ අද යි," තාත්තා පිළිතුරු දුන්නා.

දිමුතු ගේ ඇහ කිලි පොලා ගියා. ඔන්න වැඩක හැටි: ඉරු දහසක් තියෙන රටවල් පවතිනවා නෙව!

"චුට්ටි සීයා බොහොම ලොකු වාසනාවන්තයෙක්. අනේ අපට ත් ඒ රට බලන්නට පුළුවන් නම්!"

"අපි දැන් ඒ රට දිහා බලමු. පාරේ යැට් කනු වලින් අපට බාධා නොවන එළිමහන් තැනකට ගිහිල්ල අහස දිහා බලමු."

ඔවුන් එවැනි ස්ථානයක් සොයා ගත් පසුව "තාත්තේ, මට කිසි ම දෙයක් පේන්නේ නැතැ" යි දිමුතු මැසිවිලි කිය.

"පුතා කලබල නොවී අහස දෙස බලන්නැ" යි තාත්තා පැවසී ය.

දිමුතු සහ දිලාන්ති අහස දෙස බලා සිට ඉමහත් ප්‍රබෝධයකින් මෙසේ කිවෝ ය:

"ආන්න අර තරුව මගේ!"

"අනික් තරුව මගේ!"

"දැන් ඉතින් යමු. ගෙදර යමු!" යි තාත්තා කිවා.

"ගෙදර යන්නේ මක්කට ද?" මවිත වුනු දිමුතු ප්‍රශ්න කළා. "තාත්තා අපට පොරොන්දු වුනා ඉර දහසක් තියෙන රට පෙන්වන්න!"

"මම කියාපු පොරොන්දුව ඉෂ්ට කළා... නුඹලා දැන් ඔය දැකපු තරු තමා දහසක් ඉර හැටියට් මා කිවේ!" තාත්තා පිළිතුරු දුන්නා.

"දහසක් ඉර කිව්වට හරි ම කළුවර යි නෙව! එහෙමත් ඉරවල් තියෙනවා ද?" දිලාන්ති පුදුම වෙලා ඇහුවා.

"ඒවා ඉරවල් තම යි. ඒවා එහෙම අපට පෙනෙන්නේ බොහෝම ඈත, ඈත ඒවා තියෙන නිසා."

උදැසන ළමා නිකේතනයට ගිය දිලාන්ති සහ දිමුතු ඉරු දහසක් ඇති රට ගැන තොරතුරු අනික් ළමයිනට කිවෝ ය.

දහසක් ඉරු ඇති රට

ආකාශ වස්තු විද්‍යාව තාරකා, ග්‍රහ ලෝක සහ වෙනත් වස්තු අධ්‍යයනය කරයි (පිටුව 46).

අහසේ තරු කොපමණ ද

මන්දාකිණියෙන් කොටසක්.

හවස කළුවර වැටුණු පසු ළමයි අහසේ තාරකා බැලීමට ගියෝ ය. ඊයේ දුටු තරු ආයෙමත් හොයා ගන්නා ලෙස දිලාන්ති දිමුතු ගෙන් ඉල්ලා හිටියා. නමුත් ඒ තරු සොයා ගැනීම ඉතා අමාරු වුනා.

"ආකාසේ තාරකා මහා ගොඩාක්. ඉතින් කොහොම ද ඒ තරු හොයා ගන්නේ!"

"පුතා ගේ කතාව වැරදි යි! අහසේ තියෙන තරු එකට එක්කරලා රූප වගේ දේ හදාගෙන තාරකා හඳුනා ගන්නා විදිහක් ඉස්සර කාලේ මිනිස්සු දැනගෙන හිටියා. බොහොම දීප්තිමත් ලෙස බැබලෙන තරුවලට නම් දැම්මා. ඒවා ගණන් කරන්නට දැනගෙන හිටියා."

"තාරකා ගණන් කරන්න බැහැ. ඒවා දස ලක්ෂ ගණනක් නෙව!" දිමුතු පුදුම වෙලා කීවා.

"දස ලක්ෂ ගණනක් නොවෙයි! ළුටි සියා දහසක් තරු තියෙන රටට ගිහින් ආපු බව දිමුතුට අමතක වුනා නේද?" එහෙම කීවේ දිලාන්ති.

එවිට තාත්තා මෙහෙම කීවා:

"අපට ලොකු තට්ටු ගෙවල් සහ ගස් වලින් බාධා ඇති නොවුනා ද අපට තාරකා තුන් දහසකට වැඩියෙන් දකින්නට ඉඩ නැත... දැන් බලාපල්ලා, මුළු අහස හරහා යම්තමින් පෙනෙන ආලෝකය සහිත පටියක් වැනි දුමාරය පෙනෙනවා ද?"

"ඔවු, පේනවා" යැයි ළමයින් කීවා.

"ඒ තම යි මන්දාකිණිය, ඒකට තරු වැළ, ක්ෂීර පථය කියලා ත් කියනවා. එය තාරකා දස ලක්ෂ ගණනකින් යුක්ත යි. ඒවා අපට වඩා කොතරම් දුරින් පිහිටා තිබෙනවාදයත්, අපට ඒවා පෙනෙන්නේ දුලි පටලයක් වගෙ යි..."

"ඉතින් මම කීවා නේද තාරකා දස ලක්ෂ ගණනක් තියෙනවා කියලා," දිමුතු උඩ පැන්නා.

"ඔව්, ඒක ඇත්ත තම යි. නමුත් අපට පෙනෙන්නේ තුන් දහසකට වැඩි ගණනක් විතර යි," තාත්තා කීවා.

තාරකාවලින් හැදුනු හැන්ද

"මිනිස්සු ඔය තාරකා ගණන් කරන්නට ගිහින් ගණන් වරද්දා ගත්තේ නැද්ද?" දිමුතු ඇහුවා.

"බොහොම සැලකිල්ලෙන් අහස දිහා බැලුවා ම තාරකා එකතු කරලා නොයෙක් රේඛා චිත්‍ර හිතින් මවා ගන්නට පුළුවන්," තාත්තා කීවා.

"චිත්‍ර ද?" දිමුතු ඇහුවා.

"ඔව්, ඔව්. තරු වලින් රේඛා චිත්‍ර හදාගන්නට ඇහැකි."

"මට තේරුම් ගන්නට බැහැ. තාරකා වලින් චිත්‍ර හදාගන්නේ කොහොම ද? ඒවා ඇත්තේ බහිර්ව ලෝකයේ වුට් සියා ද?" දිලාන්ති ඇහුවා.

"ඔය ගොල්ල ප්ලාස්ටික් බොත්තම් වලින් ගෙදර දි නොයෙක් රූප හදනවා නේද?" තාත්තා ඇසුවා.

"ඒ ප්ලාස්ටික් බොත්තම් වලින් ඕනෑ ම හැඩයකට මල් හදන්න පුළුවනි," දිලාන්ති කීවා.

"ඒක හරි, ඉතින් ඒ වගේ ම අහසේ තාරකා එකට එකතු කරලා නොයෙක් චිත්‍ර හිතින් මවා ගන්න පුළුවන්, තේරුණා ද?" තාත්තා ඇසුවා.

"මට තාරකා එකතු කරලා රූප හිතින් මවා ගන්න බැහැ" යි දිමුතු ස්ථිර ලෙස කීවා.

"හොඳට බලාපල්ලා. දිග මීටක් සහිත හැන්දක් පෙනෙන්නේ නැද්ද?"

"ඉතින් හැන්ද කොහි ද?!" ළමයින් ඇහුවා.

"ඔයාලා ගේ හිසට උඩින් අහසේ. තාරකා හතරක් එකතු වෙලා හැන්ද හැදිලා තියෙනවා," තාත්තා කීවා. "තවත් තරු තුනක් එක් වෙලා හැඳි මීට හැදිලා තියෙනවා. පේනවා ද?"

"මට පේනවා" යැයි දිලාන්ති සතුටින් කීවා.

"මට කිසි ම හැන්දක් පෙනෙන්නේ නැහැ," දිමුතු කීවා.

"හොඳ යි. මම එය වෙනත් විදිහකට තේරුම් කිරීමට උත්සාහ ගන්නම්," තාත්තා පැවසුවා.

තාත්තා සාක්කුවෙන් විදුලිය පන්දම (ටෝච් එක) ගෙන එහි ආලෝකයේ ආධාරයෙන් ලොකු හැන්දක් වගේ චිත්‍රයක් පොළොවේ ඇන්දා.

"හැන්දට තාරකා කියක් අයිති ද?" තාත්තා ඇසුවා.

"තාරකා හතක් අයිති යි," පුතා පිළිතුරු දුන්නා.

"හරි. ඔන්න ඒ චිත්‍රය මතක තියාගන්න. ලොකු

හැන්දක් වගේ තරු හත තියෙන තැන වෙනත් දිප්තිමත් තාරකා නැහැ. දැන් අපි ඒ තාරකා තියෙන තැන හොයා ගනිමු. ලොකු හැන්දක හැඩය ගන්නට පුළුවන් දිප්තිමත් තරු හත අපි හොයමු."

දිලාන්ති විදුලි පන්දම නිවා දැම්මා. දිමුතු ගේ ඇස් කළුවරට පුරුදු වුනාට පසුව, ඔහු ලොකු හැන්ද හැඩයට හිතින් මවා ගන්නට පුළුවන් වුනා. තරු හත ඔහු දුටුවා.

"පුතාට හරි හැටි එය පේනවා ද? නැතිනම් ඒවා හිතින් සිතා ගත්තා විතරක් ද?"

"ඒ මොක ද? තරු හත මට හොඳට පෙනෙනවා!"

"හොඳ යි. මම එය දැනගන්නම්. දැන් මා කියන විදිහට කරන්න. ඉස්සෙල්ලා ඇස් දෙක වහ ගන්න. හැරෙන්න. ඇස් හැරලා බලන්න. ලොකු හැන්ද පේනවා ද?"

"නැහැ, දැන් පේනෙන්නේ නැහැ. මෙතැන සම්පූර්ණයෙන් ම වෙනත් තරු!" පුතා පිළිතුරු දුන්නා.

"අපූරු යි! එහෙනම් දැන් එය හොයා ගන්න!" තාත්තා කිවා.

දිමුතු බෙල්ල හරව, හරවා අහස දෙස බලා සිට ලොකු හැන්දට අයත් තාරකා හත සොයා ගෙනැ එය තාත්තාට ත්, අක්කාට ත් පෙන්නුවා.



දිමුතු සහ දිලාන්ති එම තාරකා සමූහය හොඳ හැටි දැනගත්තාට පසුව තාත්තා මෙසේ කිවා:

"ලොකු හැන්දක හැඩයට ඇති තරු හත හැරුණු විට, අහසේ මේ කොටසෙහි ඒවාට වඩා දිප්තියෙන් අඩු තවත් තාරකා ගොඩක් තියෙනවා. ඉස්සර කාලේ සිට මිනිස්සු දිප්තිමත් තාරකා හත ඇරුණු විට දිප්තියෙන් අඩු තරු ගොඩක් දෙස හොඳට බලා ලා ඒවාට මහ වලහා කියා නම් තැබුවා. ඒවා එකට එකතු කරලා වලසකු ගේ හැඩයකට රේඛා චිත්‍රයක් ඇඳුන් ඇන්දා."

තාත්තා ළමයින්ට පින්තූර දෙකක් පෙන්නුවා.

"මේ පින්තූර දෙක හොඳට බලා ලා ලොකු හැන්දට අයත් තරු වෙන්කර හඳුනා ගන්න. හොයා ගත්තා ද? දැන් ලොකු හැන්දේ මිටට අයත් අන්තිම ලොකු

මහ වලහා තරු සමූහය

සෝවියට් සංගමයට ඉහළින් ඇති අහසේ මේ තරු මණ්ඩල වර්ෂයේ ඕනෑ ම සෘතුවක දී දකින්නට පිළිවන:

මහ වලහා
කුඩා වලහා
කැසියෝපියා
සෙපේයුස්
ඩ්‍රැගන්

මහ වලහාට අයත් තරු සමූහය.





තරුව හොයා ගන්න පුළුවන් ද?"

"ඒ තරුව වලසා ගේ නහයට අයිති යි," දිමුතු පැවසුවා.

"නැහැ, ඒ තරුව උගේ වලිගයට අයිති යි," දිලාන්ති කිවා.

"නුඹලා දෙදෙනා ගෙන් නිවැරදි කවුද?" තාත්තා ඇහුවා.

"මම!" යි දිමුතු කීවා.

"මල්ලි නෙ වෙයි, මම!" යි එහෙම කියුවේ දිලාන්ති.

"එහෙනම්, අක්ක යි, මල්ලි යි පින්තූර දෙක මාරු කර ගන්න."

මෙයි පුදුම වුනා. දෙදෙනා ම නිවැරදි බව ඔවුනට පෙනුනා. එක් පින්තූරයක ලොකු හැන්දට අයත් තරුව වලසා ගේ නහය අග තිබුණා. දෙවැනි පින්තූරය අනුව එම තරුව උගේ වලිගයේ තිබෙන සැටි දුටුවා.

"එහෙනම් හරි පින්තූරය මොකක් ද?" දිලාන්ති ඇහැව්වා.

"පින්තූර දෙක ම හරි," තාත්තා පිළිතුරු දුන්නා. "ලොකු හැන්දට අයත් තාරකා

හත මිනිසුන්ට පෙනෙන්නේ එක ම විදිහට යි. නමුත් දිප්තියෙන් අඩු තාරකා එකතු කරලා හිතින් මවා ගන්නා වලහා 'ගේ චිත්‍රය නොයෙක් ආකාරයට ඇඳලා තියෙනවා."

"හැබැට ම ආකාසේ ලොකු වලසෙක් ඉන්නවා ද?" පුතා ඇසුවා.

"අපොයි, නැහැ! ඒ තරු ඔක්කොම එකට එක්ක හු වෙන විදිහට රේඛා චිත්‍රයක් ඇඳපුවා ම එය වලසකුට සමාන වෙනවා. ඒ නිසා ඒ තරු ගොඩට මිනිස්සු මහ වලහා කියලා නම් කළා," තාත්තා කිවා.

"එහෙනම් මහ වලහා කියලා කියන්නේ තරු හතක් තියෙන ලොකු හැන්දට ද?"

"පුතා ම කල්පනා කරන්න ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නේ කොහොම ද කියලා!"

"හරි, හරි, මට තේරුම් ගන්න පුළුවනි!" දිමුතු සතුටු වෙලා කිවා. "ලොකු හැන්ද සම්පූර්ණ වලසා නොවේ!"

"පුතා ගේ නිගමනය නිවැරදි යි. මතක ද මම වේලාසනින් ඔයාලට විස්තර කළා, වලසාට අයත් තරුවලින් ඉතා දිප්තිමත් තරු තම යි ලොකු හැන්දට අයත් තරු හත කියලා. ලොකු වලහා ගේ රූපය හැදෙන දිප්තියෙන් අඩු තාරකා හොයා ගැනීමට අපට ලොකු හැන්දේ තරු හත උදව් වෙනවා," තාත්තා විස්තර කළා.

ඉන් පසු දවසෙක අහසේ වලාකුළු රහිත ව, තාරකා බැලෙන්නට ඉන්නා. 'මහ වලහා' සොයන ලෙස තාත්තා මෙයිනට කිවා.

"ආන්න, අතන ලොකු හැන්ද, එහෙනම් එතැන මහ වලහා ඉන්න ඕන," දිමුතු පැවසුවා.

"සැලකිල්ලෙන් බලන්න හැදි මීටට අයත් මැද තාරකාව. එයට කියන නම මීසාර් ය. ඒ නම දැම්මේ අරාබිවරු. අරාබි බසින් මීසාර් කියන්නේ අශ්වයාට යි," තාත්තා කිවා.

"අස්පයා වෙන්නේ කොහොම ද?" දිමුතු ඇහුවා.

"මීසාර් තරුව අසලින් තවත් පුංචි තරුවක් තියෙනවා. එය හොඳට බැලීමට උත්සාහ ගන්න."

"මට පේනවා!" යැයි දිලාන්ති සතුටෙන් කෑ ගැසුවා.

"අනේ දැන් නම් මට ත් පෙනෙනවා!" දිමුතු කිව්වා.

"එහෙනම්, මෙයිනේ, නුඹලා ගේ ඇස් පෙනීම





බොහොම හොඳ යි,'' තාත්තා සතුටු වුනා. මිසාර් ළඟ තියෙන අනික් තරුවට අරාබිවරුන් දැම්මු නම තම යි අල්කෝර්. අරාබි බසින් එහි තේරුම අසරුවා, අසු පිටින් යන්නා ය. මිසාර් විතරක් නො වෙයි, අල්කෝර් තරුව ත් දකින අයට ඉලක්කෙට දුන්නෙන් ඊතල විදින්නට පුළුවන් කියලා පුරාණ මිනිස්සු කල්පනා කළා.''

දිසාව පෙන්වන මාලිමා තරුව

අද දිමුතු අසතුටින් ඉන්නවා. හේතුව එයා ගේ මාලිම උපකරණය නැති වෙලා.

ඒ බව දැනගත් තාත්තා මෙහෙම කිවා:

''දැන් ඉතින් පුතාට උතුර දකුණ හොයා ගන්නට සිද්ද වෙන්නේ ආකාශ වස්තු දිහා බලා ගෙන.''

''මොන ආකාශ වස්තු අනුව ද?'' පුතා ඇහුවා.

''ඉර සහ තාරකා අනුව. ඒවා තම යි අහසේ තියෙන වස්තු'', තාත්තා උත්තර දුන්නා.

''ඉර සහ තාරකා අනුව පුළුවන් ද, මාලිමා යන්ත්‍රයක් නැතුව?'' පුතා ඇසුවේ අවිශ්වාසයෙනි.

''මාලිමාවට වඩා කොහෙත් ම නරක නැහැ ඉර සහ තාරකා'' යැයි තාත්තා කීවේ මඳ සිනාවක් පාමින් ය. ''පුත යි, අක්ක යි එකතු වෙලා ග්නෝමොන් උපකරණයෙන් හෙවණැල්ල බලාපු හැටි මතක ද?''

''සත්තකින් ම මතක යි!'' දිමුතු ඉතා සතුටින් එකවර පිළිතුරු දුන්නා.

''ඉතා ම කෙටි හෙවණැල්ල ඇති වන්නේ කොයි වේලාවට ද?''

''දවාලට.''

''හරි. දවල් දොළහ වන විට. හරියට ඒ වේලාවට ඉරට මුණ ලා සිට ගත්තොත් ඉදිරියෙන් දකුණු දිසාව ත්, පිටුපසින් උතුරු දිසාව ත් තිබෙනවා. ඒ වේලාට ග්නෝමොන් උපකරණයේ හෙවණැල්ල වැටෙන්නේ දකුණේ සිට උතුරට බව සළකන්න.''

''තාත්තේ, රෑට ඉර නැහැ. තරුවල හෙවණැල්ල ත් නැහැ. ඉතින් රෑට උතුර දකුණ හොයා ගන්නේ කොහොම ද?''

''මාලිමාව වෙනුවට ප්‍රයෝජනය වන තරුවක් අහසේ තියෙනවා. ඒකට කියන්නේ උතුරු දිග තරුව කියල.''



මහ වලහා නමැති තාරකා මණ්ඩලය.

З
В
В
ПО

"අහසේ එය හොයා ගන්නේ කොහොම ද?" දිමුතු ඇහුවා.

"මෙන්න මේ සිතියමේ උදව්වෙන්" යැයි කී තාත්තා තාරකා සිතියමක් මෙසය උඩ තැබුවා.

"ලොකු හැන්දේ මිටේ ඇතින් ම තියෙන තරු දෙක හොයන්න."

ළමයින් එය හොයා ගත්තා.

"දැන් අපි පහළ තියෙන තරුවේ ඉඳල ඉහළ තියෙන තරුවට රිපු රේඛාවක් අඳිමු. අපේ ඉරට ප්‍රථම තරුව හමුවන තුරු අපි එය දිගට ම අඳිමු. අපට හමුවන පළමු-වන තරුව තම යි උතුරු දිග තාරකාව," තාත්තා විස්තර කළා.

දුවට සහ පුතාට තාත්තා පැන්සල් ද කඩදාසි ද දුන්නේ ය. දෙදෙන තරු හතකින් යුත් ලොකු හැන්ද සහ උතුරු දිග තරුව ඇන්දෝ ය.

එදින රාත්‍රියෙහි ළමයින් අහසේ උතුරු දිග තරුව දුටුවා. තාරකා සිතියමේ තියෙන ආකාරය ම යි ඔවුන් ඒ තරුව හොයා ගත්තේ. මුල දී ඒ ගොල්ල ලොකු හැන්දේ මිටෙන් වඩාත් ම ඇතට ඇති තරු දෙක හොයා ගත්තා. ඊළඟට උතුරු දිග තාරකාව හොයා ගත්තා.

"ඉතින් උතුර හොයා ගන්නේ කොහොම ද?" දිලාන්ති ඇහුවා.

"උතුරු දිග තරුව බලන විට, මුණ ඉස්සරහට තියෙන්නේ උතුර තම යි! පිටුපසින් තියෙන්නේ දකුණ," තාත්තා විස්තර කළා.

"දැන් ඉතින් උතුරු දිග තාරකාව තම යි මගේ මාලිමාව!" දිමුතු සතුටින් කීවා.

වලසුන් දෙදෙනකු ගැන කතා

එක් හවසක දී ළමයින් මහ වලහා ගේ රූපයට අයත් තාරකා දෙස සැලකිල්ලෙන් බැලුවා.

"උතුරු දිග තරුව කොහේ ද?" එකවරට ම දිමුතු ප්‍රශ්න කළා. "මහ වලසා ගේ නහය උඩ ද, නැතිනම් වලිගයේ ද?"

දිලාන්තිට මල්ලි ගේ ප්‍රශ්නයට පිළිතුරු දීමට බැරි වුනා. මහ වලහට අයත් තාරකා වලින් උතුරු දිග තරුව කොයි එක ද කියලා දැනගැනීමට ඈ තාත්තා සොයා ගෙන ගියා.

"කොහේ වත් නැහැ," තාත්තා කීවා.

"කොහේ වත් නැති වෙන්නේ කොහොම ද?" ළමයින් ඒ කිව විශ්වාස කළේ නැහැ.

"මම නුඹලාට විස්තර කළේ එක් තාරකා කණ්ඩා-යමක් ගැන විතර යි. නමුත් අහසේ ඒ වගේ තාරකා කණ්ඩායම් මහ ගොඩක් තියෙනවා. උතුරු දිග තා-රකාව අයත් වෙන්නේ වෙනත් තරු සමූහයකට. ඒවා-

යේ නම කුඩා වලසා.''

''තාත්තා අපට පුංචි වලසාව පෙන්වනවා ද?'' දිමුතු ඇහුවා.

''පෙන්වන්න නම් පුළුවනි. අහසේ එය හොයා ගැනීම ලෙහෙසි වන්නේ නැහැ. පුංචි වලසාට අයත් තරු පංතිය බොහොම අඩු දීප්තියකින් බැබලෙන හන්දා.''

''පුංචි වලසාට ත් ලොකු හැන්දක් වැනි තරු කාණ්ඩයක් තියෙනවා ද?'' දිමුතු ඇසුවා.

''ඔව්. නමුත් හැන්ද පුංචි යි. ඔන්න ඔය හැන්දේ මීට අගට තියෙන තරුව තම යි, උතුරු දිග තරුව.''

තාත්තා කඩදාසියක් රැගෙන එහි ලොකු හැන්දට අයත් තාරකා හත ඇන්දා. ඊළඟට උතුරු දිග තරුව ත්, එයට අයත් තාරකා හත හැන්දක් වගේ හිටින්නට ඇන්දා. හැන්දට අයත් තරු හතර දීප්තියෙන් බොහොම අඩු යි. හැදි මීටට අයත් තරු තුන දීප්තියෙන් වැඩි යි. විශේෂයෙන් ම උතුරු දිග තාරකාව.

එක් රාත්‍රියෙක අහස වලාකුළු රහිත ව, තද කළුවට පෙනෙන විට, තරු වඩා ත් පැහැදිලි ව පෙනුනා. එදා තාත්තා මෙයිනට පුංචි වලසාට අයත් තාරකා කණ්ඩායම පෙන්වා දුන්නා.

''ඉස්සර කාලේ කාසාහ් ජාතිකයෝ උතුරු දිග තරුව හැඳින්වූයේ රිටි තරුව යන නමිනි. පුංචි හැන්දට අයත් අනික් තරු බැටළුවන් යන නමින්. රැට මේ බැටළු තාරකා රිටි තාරකාව වටේ ගමන් කරනවා කියලා ඒ ගොල්ල කිව්වා. දකුණු ඇමරිකාවේ රතු ඉන්දියන්වරු කුඩා වලහා තාරකා මණ්ඩලය වඳුරා වශයෙන් හැඳින්වූවා. මේ වඳුරා උගේ වලිගය උතුරු දිග තරුවට අමුනලා වටේට කැරකෙනවා කියලා ඒ ගොල්ලා සිතුවා,'' තාත්තා මෙයිනට කියා දුන්නා.

''තාත්තේ, පුංචි වලසා ගැන ගොතලා තියෙන කතන්දර එච්චර ද?'' දිමුතු ප්‍රශ්න කළා.

''නව ගොඩක් කතා තියෙනවා. එක් කතාවක් අනුව ලස්සන කැලිස්ටෝ නැමති තරුණියව මායාකාර නපුරු ගැණි විසින් මහ වලසා හැටියට පරිවර්තනය කළා,'' තාත්තා විස්තර කළා.



කුඩා වලහා තරු මණ්ඩලය.

"පුංචි වලසාව ත් මායාකාරිය ගේ මායාවට අසුවෙලා ද?" දිමුතු ඇසුවා.

"කැලිස්ටො ගේ මෙහෙකාරිය පුංචි වලසා හැටියට පරිවර්තනය කළා. එදා ඉඳලා මහ වලසා ගේ පසුපසින් පුංචි වලසා ගමන් කරනවා. ඒ නිසා අහසේ **මහ වලසා** **ළඟින් හැමදා ම පුංචි වලසාව දකින්නට පුළුවනි.**"

නිර්භය පර්සියස් ලස්සන අන්ද්‍රොමේදාව බේරා ගත් සැටි

එක් දවසක දිමුතු තාත්තා ගෙන් මෙසේ විමසුවා:

"තාත්තා අපට විස්තර කළේ මහ වලසාට සහ පුංචි වලසාට අයත් තරු ගැන විතර යි. තවත් ඒ වගේ තාරකා කණ්ඩායම් තියෙනවා ද?"

"ඔව්, තියෙනවා. සිංහයා, ධ්‍රුවයා, හංසයා, තල්මසා, රාජාලියා වගේ රූපවලට අයත් තාරකා මණ්ඩල අහසේ තියෙනවා," තාත්තා කීවා.

"ඒ රූපවලට අයිති කතන්දර තියෙනවා ද?"

"ඔවු, හැම රූපයකට ම පාහේ කතන්දර ගොතලා තියෙනවා."

"තාත්තා අපට ඒවා කියා දෙනවා ද?"

"සමහර ඒවා කියා දෙන්නම්. ඉතුරු ඒවා ඔයාලා ලොකු ළමයින් වුනා ම පොත්වලින් කියවා දැනගන්න."

පුතා නම් තරු මණ්ඩල ගැන සියලු කතා ඇසීමට සුදානම්. නමුත් එසේ කළ නො හැකි ය. මල්ලි දිලාන්තිට ත් අඬ ගහලා තාරකා පිළිබඳ අලුත් කතාවක් අහන්නට සුදානම් වුනා.

"ඔන්න ඉතින් ඉස්සර කාලේ අප්‍රිකාවේ තියෙන එතියෝපියාවේ සෙපේයුස් රජ්ජරුවෝ සහ එයා ගේ බිරිඳ කසියෝපියා වාසය කළා. ඒ ගොල්ලන් ගේ දූ කුමරිය ගේ නම අන්ද්‍රොමේදා. මේ දූ කුමරිය තරම් ලස්සන වෙනත් කවුරුන් වත් නැහැ කියලා කසියෝපියා බොහොම පාරටටු කළා. මහා සාගරයේ පිවත්වන ලස්සන මායාකාරියන්ට මේ කතාව ඇහුණා ම, ඒ ගොල්ලන්ට බොහොම තරහ ගියා. ලෝකයේ ඉන්න ඉතා ම ලස්සන අය තමන් කියලා මායාකාරියෝ සිතා ගෙන හිටියා. මේ ලස්සන මායාකාරියන් බොහොම දුකින් අඬලා මහා සාගරයට අධිපති ඒ ගොල්ලන් ගේ තාත්තා ගෙන් ඉල්ලා හිටියා කසියෝපියා ට සහ අන්ද්‍රොමේදාට දඬුවම් කරන්න කියලා. සාගර අධිපතියා එතියෝපියා රට විනාශ කිරීම පිණිස සාගර රකුසකු යැව්වා. ඒ භයානක රකුසා ගේ කටින් ගිනි පිටවෙනවා. දෙකන්වලින් දුම් පිටවෙනවා. උගේ වලිගය වටරවුම් වලින් සහ උල් දැති වලින් පිරිලා. රටේ රජ්ජුරුවෝ සහ බිසව ඔවුන් ගේ දූ කුමරිය රකුසාට

පර්සියස් තරු මණ්ඩලය.

බිලි නො දුන්නොත්, මුළු රට ම විනාශ කරනවා කියලා රකුසා තර්ජනය කළා. රට බේරා ගැනීම සඳහා දූ කුමරිය අන්ද්‍රොමේදාව රකුසාට බිලි දුන්නා. අන්ද්‍රොමේදාව වෙරළේ ලොකු පරුවතයකට දම්වැල් වලින් බැඳ දැම්මා. මේ වේලාවේ දී අපරාජිත යුද්ධ වීරයා පර්සියස් එතැනට ආවා. ඇවිල්ලා අන්ද්‍රොමේදා කුමරියව බේරා ගත්තා.''

සෙපේයුස් තරු මණ්ඩලය.

''එය රකුසාව පරාජය කළේ කොහොම ද?'' දිලූතු ප්‍රශ්න කෙළේ නො ඉවසිල්ලෙන්.

''පර්සියස් වීරයා මේ වේලාවේ දී එයා ගේ පියාපත් සහිත පාවහන් පය ලා ගෙන අහසේ පියාසර කරමින් හිටියා. රකුසාව ඔහු දැකලා ඔහු ගේ කඩුවෙන් රකුසා ගේ පිටට ඇන්නා. රකුසා හැරිලා සටනට ගියා. එවිට තවත් පහර තුනක් රකුසා ගේ පපුවට එල්ල කළා, පර්සියස් වීරයා. පහර කෑ රකුසා සාගරයේ ගිලී මිය ගියා.

''පර්සියස් අන්ද්‍රොමේදා කුමරිය මුදා ගෙන රජු ගේ මාලිගාවට ගෙන ගියා. පිය රජ බොහොම සතුටු වෙලා තමා ගේ දූ කුමරි – අන්ද්‍රොමේදාව පර්සියස්ට සරණ පාවා දුන්නා. දවස් ගණනක් තිස්සේ ලොකු රාජකීය මංගල්ලයක් පැවැත්වුවා. ඔන්න ඉන් පසුව තම යි කසියෝපියා, අන්ද්‍රොමේදා සහ පර්සියස් තරු කණ්ඩායම් අහසේ මැවී පෙනුනේ.''

''තාත්තාට පුළුවන් ද මේ තුන් දෙනාව අහසේ හොයා ගන්නට?'' දිලාන්ති ප්‍රශ්න කළා.

''ලෙහෙසියෙන් ම හොයා ගන්න පුළුවන් කැසියෝපියා තාරකා මණ්ඩලය. එය හොයා ගන්න සැටි මම කියා දෙන්නම්. මට කඩදාසියකු යි පැන්සලකු යි ගෙනෙන්න.''

තාත්තා ලොකු හැන්ද යි, උතුරු දිග තරුව යි, පුංචි හැන්දට අයත් සෙසු තාරකා යි ඇන්දා. උතුරු දිග තරුව අසලින් M හෝ W හෝ ඉංග්‍රීසි අකුර හැඩයට හිටින්න තාරකා පහක් ඇන්දා.

අන්ද්‍රොමේදා තරු මණ්ඩලය.

''මේ තාරකා පහ තම යි කැසියෝපියා කියලා නම් කරලා තියෙන්නේ,'' තාත්තා කිවා.

''රජ බිසවට කොහෙත් ම සමාන නැහැ'' යි කියලා දිලාන්ති කීවේ දුකින්.

''ඇත්ත තම යි. නමුත් ලොකු වලසා සහ පුංචි වලසා තාරකා මණ්ඩල දෙක ම හැබෑ වලසුන්ට කොහෙත් ම සමාන නැහැ. ඒ වුනාට ඒ ගොල්ල ඒ තරු වලස් රූප වගේ හිටින්නට ඇන්දා. තරු පහ ඇන්දේ



රජ බිසව සිංහාසනයේ ඉන්නා හැඩයට යි... පරණ තාරකා සිතියමෙන් මම ඒ තාරකා මණ්ඩලය පෙන්වන්නම්.''

''ඇත්තට ම ඒ වගේ සිතියමක් තාත්තා ළඟ තියෙනවා ද?'' පුදුමයට පත් වුනු දිමුතු ඇහුවා.

''ඔව්, තියෙනවා. මේ ලේඛන පින්තූර දිහා බලන්න. මේවායේ ලොකු වලසා සහ පුංචි වලසා ත් තවත් සතුන් හා කතන්දර වල වීරයින් ගේ රූප වලට සමාන තාරකා මණ්ඩල ත් තියෙනවා. දැන් ආකාශ වස්තු පිළිබඳ විද්‍යාඥයෝ අදින්නේ තරු පමණ යි. මේ සිතියම තම යි අලුත් ම තාරකා සිතියම. මෙහි මහ වලහා තරු මඬල හොයන්න,'' තාත්තා කීවා.

''මේ තියෙන්නේ!'' යැයි දිමුතු කැගහලා කීවා. ලොකු හැන්දට අයත් තරු හත ඔහු ඉක්මනට හොයා ගත්තා.

''දැන් පුංචි වලහා හොයන්න!''

''මෙන්න පුංචි වලහා!'' දිලාන්ති උත්තර දුන්නා.

''මීළඟට හොයන්න කැසියෝපියා තරු මණ්ඩලය!''

මෙයින් දෙදෙනා එය ත් හොයා ගත්තා.

තාරකා ත්‍රිකෝණය

එක් රාත්‍රියෙක දී අහසේ තරු තිබුණේ ඉතා ස්වල්පයක් පමණ යි.

''අද අහස බොහොම අවලස්සන යි'' දිමුතු අසතුටු වුනා.

''පුතා ගේ අදහස හරි,'' තාත්තා එකඟ වුනා. ''බහිරව ලෝකයේ වුට් සියා ඔය ගොල්ලන්ට පෙන්වන්න කියාපු තාරකා අද අහසේ පෙනෙනවා. මහ වලහාට අයත් තාරකා මණ්ඩලය ඉහින් දිප්තිමත් තාරකා තුනක් තියෙනවා. මේ තාරකා තුන සිතින් මවාගත් රේඛාවකින් එකතු කරන්න. එවිට අපට විශාල ත්‍රිකෝණයක් ලැබෙනවා. එයට කියන්නේ ගිම්හාන-සරත් කාලවල ත්‍රිකෝණය කියලා. මෙය උතුරු දිග රටවල අයට ගිම්හාන සහ සරත් කාලවල දී පෙනෙන නිසා එහෙම නම් කරලා තියෙනවා,'' තාත්තා විස්තර කළා.

''එහෙනම් මෙය ත්‍රිකෝණ තාරකා මණ්ඩලය වගේ දෙයක් ද!'' එහෙම කියුවේ දිමුතු.

''නැහැ. ඒක තාරකා මණ්ඩලයක් නොවේ. මා දැන් නුඹලාට පෙන්නපු තාරකා තුන තාරකා මණ්ඩල තුනකට අයිති යි. එක්, එක් මණ්ඩලයකට වෙන,

හංසයා තාරකා මණ්ඩලය.

ලීරා තරු මණ්ඩලය.

වෙන ම නම් තියෙනවා. හංසයා, ලීරා සහ රාජාලියා. හංසයා තාරකා මණ්ඩලයට අයත් දීප්තිමත් තරුවේ නම දෙනෙබ. ලීරා මණ්ඩලයට අයත් දීප්තිමත් තාරකාව – වේගා. ඊට තරමක් පහළින් රාජාලියා තාරකා මණ්ඩලයට අයත් අල්තයිර් තරුව තියෙනවා. එය තම යි රාජාලියා තරු මඩලේ ඉතා දීප්තිමත් තාරකාව. මේවා වල නම් මතක තබා ගැනීම ලෙහෙසි නැහැ. නමුත් ඒවා හොයා ගැනීම ලෙහෙසි යි. මන්දයත් ඒවා එකට එක්කකාසු කරන විශාල ත්‍රිකෝණයක් වැනි යමක් ඉස්සෙල්ලා කියාපු දීප්තිමත් තාරකා තුනෙන් අපට ලැබෙන නිසා.''

ගෙදර දී තාත්තා දුවට සහ පුතාට තාරකා සිතියමේ අලුත් තාරකා මණ්ඩල පෙන්වා දුන්නා.

''තාත්තේ, මේවා ගැන ත් ඉස්සර මිනිස්සු කතා ගොතලා තියෙනවා ද?''

''තාරකා මණ්ඩල තුන ම ගැන කියන එක කතාවක් නැහැ.''

''ලීරා කියන්නේ මොනවාට ද?'' දිලුතු විමසන්නට වුනා.

''ඒක සංගීත භාණ්ඩයෙක නමක්. ඉතා දක්ෂ ගායකු වන ඔර්පේයුස් ඒ භාණ්ඩය වාදනය කළා කියලා පුරාණ කතාවක් තියෙනවා. ඔහු ලීරාව වාදනය කරමින් ගායනා කළා.''

''හංසයා ගැන කතාවක් තියෙනවා ද?'' පුතා ඇසුවා.

''හංසයා කිව්වාට නිර්භය කික්න් නමැති වීරයා. ග්‍රීක් භාෂාවෙන් 'කික්න්' යනු හංසයා ය. රාජාලියා නමින් හැඳින්වෙන තාරකා මණ්ඩලය ගැන කතා මා දන්නේ නැහැ. ඉස්සර කාලේ සිට ම රාජාලියා හැඳින්වූයේ එක ම නමින් තම යි. මේ රාජාලියා බොහොම නපුරු යි. ප්‍රොමේතියස් නැමති වීරයාව දම්වැලින් බැඳලා තිබුණු පරුවතයට ඇවිත් ඌ ඔහුට හොටින් අනිනවා. රාජාලියා කිසි ම අනුකම්පාවක් පෙන්වන්නේ නැතිව...''

රාජාලි තරු මණ්ඩලය.

''එයාට එතරම් වද දීමට ඇති හේතුව කුමක් ද?'' දිලාන්ති ඇසුවා.

''ප්‍රොමේතියස් දෙවියන් ළඟ තිබුණු ගිනි සොරකම් කරගෙන ඇවිත් මිනිසුන්ට දුන්නා. දෙවිගොල්ලන්ට බොහොම කේන්ති ගිහිල්ලා ප්‍රොමේතියස්ව අල්ලා දම්වැලින් පරුවතයට බැඳලා දැම්මා. රාජාලියාට අණ කළා අවුරුදු ගණනක් තිස්සේ ම ප්‍රොමේතියස්ට වද දෙන්න කියලා,'' තාත්තා විස්තර කළා.

ගවයා සමග සටන් කරන දඩයක්කාරයා

සරත් සමය ගෙවී ගියා. හිම වැටෙන සීත කාලය ආවා. එවැනි හිම කුෂාරය පවතින විට රෑට ඇවිදීම ලෙහෙසි නැහැ. නමුත් හවස් වන විට සමහර දාට තාත්තා ළමයින් සමග ඇවිදීමට ගියා. ළමයින් අහස දිහා බලා ඉක්මණින් ම මහ වලහා තාරකා මණ්ඩලය හඳුනා ගත්තා. කැසියෝපියා තාරකා මණ්ඩලය වත් ඔවුනට හොයා ගන්නට හැකි වුනා. නමුත් හංසයා, ලීරා සහ රාජාලියා තාරකා මණ්ඩල හොයා ගන්නට ඔවුනට බැරි වුනා. ඉස්සර හොඳට පෙනුණු ඒ තාරකා මණ්ඩල කොහේ ගියා ද කියලා වත් දැන ගන්නට නැත. කොතරම් උත්සාහ ගත්ත ද ඒවා හොයා ගත නො හැකි විය.

දිලාන්ති කනගාටුවට පත් වුනා:

"තාත්තේ, අපට හැම දෙයක් ම අමතක වෙලා නේද?"

"නැහැ, දුවේ, දැන් බොහෝ තාරකා මණ්ඩල පෙනෙන්නට නැහැ. අපි ඒවා දක්කේ ගිම්හාන සහ සරත් කාලවල දී නෙව. දැන් සීත කාලය. උතුරු දිග රටවල පිවත්වන අපට ගිම්හානයේ දී සහ ශීත කාලයේ දී මහ වලහා, පුංචි වලහා සහ කැසියෝපියා තරු මණ්ඩල දකින්නට පුළුවන්. ඉතිරි තාරකා අපට පෙනෙන්නේ ගිම්හාන කාලයේ දී විතර යි, නැතිනම් හිම කාලයේ දී විතර යි."

ඔරියන් තාරකා මණ්ඩලයට අයත් විශාල දුමාරය.

"හිම කාලයට පෙනෙන තාරකා මණ්ඩල ගැන විස්තර කරන්න, තාත්තේ!" දිමුතු ඉල්ලා හිටියා.

"හිම කාලෙ දි බොහොම දීප්තිමත් ව පෙනෙන තාරකා මණ්ඩලවලින් එකක් තම යි ඔරියන්. එය තියෙන්නේ සෝවියට අහසේ දකුණු දිග. එය ලොකු පටියකට සමාන යි. ලංකාවේ සිට බලන විට ඔරියන් හිරු මෙන් නැගෙනහිරින් පායා බටහිරින් බැස යයි."

එම තාරකා මණ්ඩලය ළමයින් සොයා ගත් පසු ව තාත්තා ප්‍රශ්න කළා:

"ඔරියන් තාරකා මණ්ඩලයට අයත් තරු වැල ඔය ගොල්ලන්ට පේනවා ද? ඒවා බොහොම දීප්තිමත්. එතැන තාරකා කියක් ද?"

"තාරකා තුනක් තියෙනවා" යැයි දිමුතු පිළිතුරු දුන්නා. ඒවා එක දිගට පිහිටා තිබෙන සැටි ඔහු පෙන්නුවා.

"දැන් ඉතින් ඔරියන් තාරකා මණ්ඩලයට තරමක් දුරින් පිහිටා තියෙන පුංචි ලපයක් වැනි තරු ගොඩ හොයාපල්ලා. දීප්තිය අඩු ඒ පුංචි තාරකා දිහා බොහොම සැලකිල්ලෙන් බලන්න. ඔය දෙන්නා දකින්නේ මෝ-

නවා ද?'' තාත්තා ඇසුවා.

''මොනවත් නැහැ,'' ළමයින් පිළිතුරු දුන්නා.

''ආයෙමත් මහ වලහා සහ පුංචි වලහා හොයා ගන්න. නැවත එරක් දිප්තිය අඩු ඒ තාරකා දෙස බලන්නැ,'' යි තාත්තා කීවා.

''තාත්තේ, තාත්තේ!'' දිමුතු කැගසා කීවා: ''ආන්න අතන බොහොම පුංචි හැන්දක් වගේ හැඩයට තරු කිපයක් තියෙනවා!''

''මට ත් පෙනෙනවා ඒ හැන්ද! අනේ ඒක හරි ම චූටි යි!'' දිලාන්ති ආශාවෙන් කීවා.

''ගෙදර ගියා ම මම නුඹලාට මේ අලුත් තාරකා මණ්ඩල දෙකක් ගැන විස්තර කියන්නම්,'' තාත්තා කියේ ය.

''තාත්තා අපට කිවේ ඔරියන් ගැන විතර යි. තාරකා මණ්ඩල දෙකක් ගැන නො වෙයි,'' පුතා විමැයි ය.

''ඒක හරි. පටියකට සමාන ලෙසින් එක පෙළට සිටින තරු තුන සහිත තාරකා මණ්ඩලයට තම යි ඔරියන් කියන්නේ. ඔයාලා දැකපු අර සිහිති හැන්දට සමාන තරු අයිති වෙනත් තාරකා මණ්ඩලයකට. එහි නම වෘෂභ.''

''වෘෂභ ද?'' දිමුතු යළි ඇහුවා.

''ඔව්, වෘෂභ නැතිනම් ගවයා.''

ගෙදර පැමිණි පසු තාත්තා ළමයින්ට පුදුමාකාර පැරණි තාරකා සිතියමක් පෙන්නුවා.

''මෙන්න බලාපල්ලා! මේ තම යි ඔරියන්. ගවයකුට විරුද්ධ ව සටන් කරන දඩයක්කාරයා. නුඹලා දැකපු දිප්තිමත් තාරකා තුන දඩයක්කාරයා ගේ බඳ පටිය අලංකාර කරනවා. එය අසලින් වෘෂභ තාරකා මණ්ඩලය.''

ඔරියන් තාරකා මණ්ඩලය

ඊළඟ සෙනසුරාදා අහස පැහැදිලි වූයෙන් ඔරියන් තාරකා මණ්ඩලය සොයන ලෙස තාත්තා ළමයින් ගෙන් ඉල්ලා සිටියේ ය. ඔරියන් ගේ බඳ පටියට අයත් තාරකා තුන දිප්තිමත් ව බැබලෙන නිසා ළමයින්ට එය හොයා ගන්නට පුළුවන් වුනා. ඉන් පසුව වෘෂභ ලග්නයට අයත් ඉතා පුංචි හැන්දක් වැනි රූපයක් සොයා ගත්තා. ආකාශ වස්තු හදාරන අය මේ තරු වලට 'ප්ලේඩ්' කියා නම් කරලා තියෙනවා. මෙම ප්ලේඩ් තාරකා ළඟින් ම තියෙනවා දිග නමක් ඇති තරුවක්. එහි නම අල්දෙබරාන්. කෝපයට පත් ගවයා ගේ ඇස ලෙස ගණන් ගන්නා මේ තරුව රතු පාට යි.

තරුවල පිවත් විය හැකි ද?

දිලාන්ති සහ දිමුතු ගෙනා තාරකා මණ්ඩලවල සිතියම ළමා නිකේතනයේ අනික් ළමයින් සමග එකතුවෙලා ආසාවෙන් බැලුවා.

හිටි හැටියේ ම ල්යෝන්යා ප්‍රශ්නයක් ඇසුවා:

"තාරකාවල කවුරු හරි පිවත් වෙනවා ද?"

දිලාන්ති සහ දිමුතු කට අරින්නට ත් ඉස්සෙල්ලා සිරියෝෂා මෙහෙම කියාපි:

"සත්තකින් ම පිවත් වෙනවා! වලසා තරුවල වලස්සු, ගවයා තරුවල ගවයෝ, වෙනත් තරුවල කුමාරියෝ, රජ බිසෝවරු ආදීන්!"

දිමුතු කෝපයට පත් වුනා.

"සිරියෝෂා බොරු කියනවා. තාරකාවල කිසි ම කෙනෙක් පිවත් වෙන්නේ නැහැ!"

නමුත් සිරියෝෂා පරජය වීමට සූදානම් නැහැ.

"එහෙම කොහොම ද? කැලෑවේ සත්තු ඉන්නවා. සත්තු වත්තේ ත් උන් ඉන්නවා. ආකසේ තරුවල විතරක් නැහැ!"

තාරකාවල පිවි ප්‍රාණීන් නැත්තේ මන්ද කියලා විස්තර කරන්න දිලාන්ති සහ දිමුතු දැනගෙනැ හිටියේ නැහැ. සිරියෝෂා සමග තර්ක කිරීමට ඒ ගොල්ලන්ට බැරි වුනා. හවස තාත්තා ගෙදර ආ පසු, සිදු වූ සියල්ල තාත්තාට කීමට ඔවුන් ඉදිරිපත් වුනා.



"ඔන්න පේනව ද? ඔයාලා හරි, නමුත් ඔයාලව ළමයි විශ්වාස කළේ නැහැ! මොක ද දන්නව ද, ඔයාලා නිවැරදි බව ඔයාලාට ඔප්පු කිරීමට බැරි වුන නිසා," තාත්තා කීවා.

කැසියෝපියා තාරකා මණ්ඩලය

"ඉතින් ඔප්පු කරන්නේ කොහොමද?" දිමුතු කනගාටුවෙන් ඇහුවා.

"ආකාසේ සතුන් සහ රජවරුන් නැති බව නුඹලාට කියා දෙන්නට තිබුනා. තාරකා මණ්ඩල මිනිසුන් ඇඳලා තියෙන්නේ නිකම් හිතින් මවාගෙන. ඒ කතා ගොතලා තියෙන්නේ බොහොම ඉස්සර කාලේ. ඒ කාලෙ දී මිනිස්සු ආකාසය බොහොම ගුප්ත, කතන්දර ලෝකයක් හැටියට විශ්වාස කළා. තාරකාවල මිනිසුන්ට වත්, සතුනට වත් පිවත් විය නො හැකි බව නුඹලා දන්නවා නො වේද?"

"දන්නේ නැහැ," දිමුතු මුමුණා කියේ ය.

"තාත්තා අපට ඒ ගැන විස්තර කළේ නැහැ," යි දිලාන්ති මල්ලි ගේ කතාවට අනුබල දුන්නා.

"දහසක් ඉර ඇති රට ගැන මා කීවේ නැද්ද?" තාත්තා මවිතයට පත් වුනා.

"ඒ කතාව කීවා" යැයි දිමුතු පැවසුවේ ඔහුට එය මතක් වූ නිසා.

"දහසක් හිරු කියලා නම් කෙළේ මොනවාට ද?"

"දහසක් හිරු කියන්නේ දහසක් තාරකා වලට" යැයි දිලාන්ති පිළිතුරු දුන්නා.

"ඉතින් ඔයාලාට මතක තිබුනා නම්, දහසක් හිරු කියන්නේ දහසක් තාරකාවලට කියලා. හිර මතු පිට පිච්චත් වෙන්න බැහැ. බොහෝම තද උෂ්ණය නිසා කියන එක අමතක වුනා නෙව," තාත්තා කීවා.

"ඇත්තට ම තාරකා වල ඉර තරම් ම ගිනිගහන උෂ්ණයක් තියෙනවා ද?" දමුතු ප්‍රශ්න කළේ අවිශ්වාස කරමින්.

"ඔවු, තියෙනවා. සමහර තාරකා ඉරට ත් වැඩිය උෂ්ණ යි!" තාත්තා පිළිතුරු දුන්නා.

ඇත බොහෝ හිරු ඇති ලෝකයේ

පැහැදිලි හිම තුෂාරය සහිත සවස් කාලයක දී තාත්තා සහ මෙයි ඇවිදින්නට ගියා. අහස බොහොම කළු පාට යි. තරු බොහොම පැහැදිලි ව දිලිසෙනවා.

"තාත්තේ, ආන්න අතන තියෙන තාරකාව මොකක් ද?" දිලාන්ති ඇසුවා.

"කොතැන ද?" දිමුතු හිස හරවා විපරම් කළා.

"ඔරියන් ගේ බඳපටියට අයත් තරු දුටුවා ද? එතැනින් වුටටක් පහළින් වමට තියෙන තාරකාව," දිලාන්ති විස්තර කළා.

"ඒක තම යි සිරියුස් තාරකාව. අහසේ ඉතා ම දිප්තිමත් තාරකාව එය තම යි. ඔරියන් ගේ තරු මඩලට ඉහළින් තවත් එක වැදගත් තාරකාවක් තියෙනවා. එහි නම කපෙල්ලා. එය කහ පාට යි," තාත්තා කීවා.

"තාත්තේ, තාරකා නොයෙක් පාටවලින් බැබලෙන්නේ මක්නිසා ද?" දිලාන්ති ප්‍රශ්න කළා.

"මේ තාරකා වල උෂ්ණත්වය එකින් එකට වෙනස් හන්දා. සිරියුස් වගේ **සුදු පාට තාරකා බොහොමත් ම ගිනි උෂ්ණ යි. ඉරට ත් වැඩිය රස්නෙ යි.** කපෙල්ලා වගේ **කහ පාට තාරකා අපේ ඉර වගේ උෂ්ණ ඇති ඒවා.** රෑට තරු මඩලට අයත් අල්දෙබරාන් වැනි



ඉස්සර කාලේ රාත්‍රියේ ආකාශ වස්තු නිරීක්ෂණය කළ හැටි.

සුදු පාට තාරකා මතු පිට උෂ්ණත්වය සෙල්සි අංශක දෙක්ෂයකි; කහ පාට තාරකා මතු පිට—අංශක හයදාහකි; රතු පාට තාරකා මතු පිට අංශක තුන්දාහකි.

රතු පාට තාරකා ඉරුට වඩා තරමක් අඩු රස්නයක් ඇති ඒවා.''

''තාත්තේ, ඉතින් ඒවා එතරම් තදට ගිනිරත් වෙලා නම් අපට රස්නෙ නො දැනෙන්නේ මන්ද? හිතලට හොඳට ම අහුවෙලා මම ඉන්නේ.''

''හිතල හැදුනා ද? එහෙනම් වහා ම ගෙදර යන්න ඕන. ගෙදර ගිහිල්ලා උණුසුම් වෙලා පසුව කතා කරමු,'' තාත්තා යෝජනා කළා.

''මම එකක් දැන ගන්න කැමති යි. චුටි සියා ගේ හොඳ ම මිතුරා ගේ නම මතක ද?'' තාත්තා ඇසුවා.

''ඔව්, මතක යි! ආලෝක ධාරාව!''

''හරී. එයා ගේ නම සූර්යාලෝක ධාරාව,'' තාත්තා පැහැදිලි කළා.

''තාරකාවලින් ආලෝක ධාරා ඇති වෙනවා ද?'' දිලාන්ති විමසුවා.

''සත්තකින් ම ඇති වෙනවා. හැම තරුවකින් ම අප දෙසට ආලෝක ධාරා ගලා එනවා. ඒ ගැන විද්‍යාඥයෝ බොහොම වැදගත් පුවත් දන්වා තිබෙනවා. මේ ආලෝක ධාරාවලින් තම යි අපට දැනගන්නට පුළුවන් මොන තරුව ද වඩා ත් උණුසුම් කියලා. ඒ



ලෝකයේ විශාලතම දුරදක්නය (දුරේක්ෂය). මෙහි කණ්ණාඩියේ විෂ්කම්භය මීටර හයකි. සෝවියට සංගමයේ විදහා ඇකඩැමියට අයත් විශේෂ ආකාශ වස්තු භෞතික විදහා පරීක්ෂණාගාරයෙහි මෙය සවි කොටු ඇත. ඉතා ම ඈත පිහිටි තාරකා සහ තාරකා පද්ධති නිරීක්ෂණය කිරීම සඳහා මෙම දුරේක්ෂය පිහිටා ඇත.

වගේ ම ආලෝක ධාරා අප වෙත පැමිණීමට කොපමණ කල් ගියා ද කියන එකත් දැනගන්නට පුළුවන්.''

''කල් යනවා ද?'' දිලුතු පුදුම වෙලා ඇහුවා.

''බොහොම කල් යනවා! උදාහරණයක් හැටියට සිරියුස් තාරකාවේ ආලෝක ධාරා අපේ මහ පොළවට ළඟා වීමට අවුරුදු අටකට ත් වඩා වැඩි කලක් යනවා! අද අපේ මහ පොළවට ළඟා වුණු ආලෝක ධාරාව ඒ තරුවෙන් පිට වන විට නුඹලා දෙදෙනා මෙලොව ඉපදිලා වත් නැහැ! නමුත් සිරියුස් තරුව අපට කිට්ටු ආකාශ වස්තුවක්. අනික් තාරකා වඩා ත් ඈත තියෙන්නේ...''

''අල්දෙබරාන්, සිරියුස් තාරකාවට වඩා ඈත ද?''

''වඩා ඈත. එම තාරකාවේ ඉඳලා අපේ මහ පොළවට ආලෝක ධාරාවක් ළඟා වීමට අවුරුදු හැත්තෑවක් පමණ ගත වෙනවා. උතුරු දිග තාරකාවේ සිට මහ

අප-ගමෙයිලි කැමරාව මගින් ගන්නා ලද, අහසේ තියෙන තාරකා පෙන්වන ඡායාරූපයේ පසුතලය ඇති, තරමක් විශාල රේඩියෝ දුරදක්නයක් (ගුරේක්ෂයක්).

පොළවට ළඟා වීමට අවුරුදු සිය ගණනක් ගත වෙනවා!''

තාත්තා ගේ කතාව නිසා මෙයි අති මහත් ප්‍රබුද්ධයට පත් වූවෝ ය.

''දැන් ඉතින් ඔය මෙයි දන්නවා **තාරකා බොහොම ඇත පිහිටා තියෙන බව**. හොඳ යි, කියන්න තාරකා ලොකු ද? කුඩා ද?'' තාත්තා ප්‍රශ්න කළා.

''මා හිතන්නේ තාරකා ලොකු යි කියලා. ඒවා අපට ඉතා ම දුරින් තියෙන්නේ. ඒ වුනාට ඒවා අපට පේනවා. එහි තේරුම ඒවා බොහෝ ම විශාල බව යි,'' දිලාන්ති පිළිතුරු දුන්නා.

''මම ලොකු වුනා ම අජටාකාශ ගාමියෙක් වෙලා ඇත තාරකා වලට පියාඹා යනවා,'' දිමුතු සිහින දකිමින් පැවසී ය.

''තාරකා වලට කිට්ටු වෙන්න වත් බැහැ. එහි බොහොම රස්නෙ යි!'' දිලාන්ති කිවේ අමනාපයෙනි.

''එහෙනම් ඒවාට තරමක් ළං වෙලා අජටාකාශ යානය ආපහු හරවා ගෙන එනවා!'' දිමුතු තම අදහස කියා පෑවා.

''ඒ වගේ අජටාකාශ යානා තව ම හදලා නැහැ. තව ම ඒවාට ඇත පිහිටි තාරකා වලට යාමට බැහැ,'' තාත්තා විස්තර කළා.

''එහෙනම් මම වුට් සියා ත් එක්ක පියාඹා යනවා,'' දිමුතු කලබල නො වී පැවසුවා.

''ඒ විධියට ගියොත් පුතාට ඉතා ම ඇත තාරකාවලට වුනත් පියාඹන්නට හැකි වේවි...''

''එක් තාරකාවක ඉඳලා තවත් තාරකාවකට යනවා'' යැයි තම අදහස් දිමුතු කියන්නට පටන් ගත්තා.

''ඒක බොහොම මායාකාර සංචාරයක් වීමට ඉඩ තියෙනවා. එතකොට පුතාට අපේ ඉරට ත් වඩා කිප ගුණයකින් විශාල ගිනිගෙන දැවෙන මහා දැවැන්ත ගෝලාකාර වස්තු දකින්නට හැකි වේවි. එකක් අපේ ඉර වගේ කහ පාටට හුරු යි. අනික සිරියුස් වගේ සුදු පාට යි. තෙවැනි තාරකාව අල්දෙබරාන් වගේ රතු පාට යි. ඒවා සියල්ල ගිනි ගෙන දැවෙන වස්තු. ඒ නිසා පුතාට සිද්ධ වෙනවා ඇතට වෙලා ඒ තාරකා දෙස බැලීමට,'' තාත්තා විස්තර කළා.

සෞර ග්‍රහ මණ්ඩලය

සෞර ග්‍රහ මණ්ඩලය ගැන ද, එයට අයත් ග්‍රහ ලෝක සහ ස්වාභාවික චන්ද්‍රිකා ගැන ද දැනීමක් ලබා දීම මේ පරිච්ඡේදයේ අරමුණ වේ. ග්‍රහ ලෝකවලට විශේෂ වූ ආලෝක නො මැත. ඒවා අපට පෙනෙන්නේ ඒවා හිරු එළියෙන් ආලෝකය ලබන බැවිනි. එසේ වුව ද, බැලූ බැල්මට ඒවා කාන්තිමත් තාරකාවලට සමාන බව පෙනෙයි. දුර දක්නයෙකින් (දුරේක්ෂයකින්) බලන විට, මේ ග්‍රහ ලෝක තාරකා මෙන් දිලිසෙන නින් සේ නොව, කුඩා තැටි ලෙස පෙනෙයි. මේ ග්‍රහ ලෝක දීර්ඝ කාලයක් නිස්සේ නිරීක්ෂණයට හසු කරමු නම් (සති කිපයක් හෝ මාස කිපයක් වුව ද) එක් තරු මණ්ඩලයක (රාශියක) සිට තවත් තරු මණ්ඩලයක් (රාශියක්) දක්වා මේ ග්‍රහයන් මාරු වන සැටි දැකිය හැකි යි. ග්‍රහයන් අරබයා විවිධ රටවල මිනිසුන් අතර විවිධ මිථ්‍යා මත ඇති වී තිබෙන බැවින්, මෙයිනාට ග්‍රහ සහ තරු පිළිබඳ ව නියම තතු ව්‍යාජ දීම ඉතා වැදගත් ය. මේ පරිච්ඡේදයෙන් ප්‍රථම වරට සෞර ග්‍රහ මණ්ඩලයේ නියම චලනය පිළිබඳ ව විස්තර ඉදිරිපත් කර ඇත. මෙතෙක් අප කතා කළේ සෞර ග්‍රහ මණ්ඩලයේ හිරු සහ අනික් ආකාශ වස්තුවල ඇසට පෙනෙන චලනය ගැන ය. මේ චලනය අපට පෘථිවියේ සිට නැරඹිය හැකි ඒවා ය. මේ ප්‍රශ්නය ඉතා සංකීර්ණ ය. එබැවින් ඒ ගැන නිසි අවධානය යොමු කළ යුතු වේ. මෙයිනාට පැහැදිලි කර දිය යුතු ප්‍රධාන කරුණු මෙවා ය: හඳ පෘථිවිය වටා ගමන් කිරීම – හඳ පෘථිවියේ චන්ද්‍රිකාවක්, පෘථිවිය හිරු වටා ගමන් කිරීම – පෘථිවිය හිරු ගේ එක් චන්ද්‍රිකාවක් සහ එය සෞර ග්‍රහ මණ්ඩලයේ එක් ග්‍රහයෙක් බව ය. එය පැහැදිලි කිරීම සඳහා ඔබට ඉතා සරල ආදර්ශ මොඩලයක් (නිදසුනක්) ඉදිරිපත් කළ හැකි ය. ගසයේ කාසියක් පෘථිවිය වෙනුවට ගැනීම සහ එම කාසියට වඩා හතර ගුණයකින් කුඩා වටකුරු දෙයක් හඳ වෙනුවට ගැනීම ය. සෙන්ටිමීටර 164 ක විෂ්කම්භයක් සහිත වටකුරු කඩදාසියක් ගෙන එය හිරු වෙනුවට කහ පාටින් පාට කැරි ගැනීම ය. ඒ පමණක් නොව මේ සඳහා මෙයින් හිරු, පෘථිවිය හා චන්ද්‍රයා මෙන් ගෙන විස්තර කළ හැකි ය.

සිකුරු, අඟහරු සහ බ්‍රහස්පති ග්‍රහයන් ගේ ගමන් නිරීක්ෂණය කිරීම පිණිස සෝවියට් සංගමයේ පාඨශාලීය ආකාශ වස්තු දිනා දර්ශනයක් භාවිතා කළ යුතු ය. මෙම පාඨශාලීය ආකාශ වස්තු දින දර්ශනය එක්, එක් දිනයකට නිරීක්ෂණය කළ හැකි ග්‍රහයන් පිළිබඳ විස්තර සපයයි.

හඳ නිරීක්ෂණය කිරීම පසළොස්වන දිනයෙකින් ආරම්භ කළ හැකි ය. මෙයින් සිය නිරීක්ෂණ අනුව හඳ වෙනස්වන සැටි පසක් කර ගත යුතු ය. ඉන් පසුව පමණක් මේ පොතින් සපයා විස්තර හා පිටින්සුම් ඔවුනට පැහැදිලි කළ යුතු ය.



දවසක් දා තාත්තා දෙනෙති දුර දක්ණය (දුරේක්ෂය) අරගෙනැ ළමයින් සමග හවස ඇවිදීමට ගොස් අහසේ ප්ලේඩ් තරු සමූහය ඔවුනට පෙන්නුවා. ඉතා අපහසුවෙන් වෙන් කර හඳුණාගත හැකි (හැන්දක්) කෙණෙස්සක් වැනි දෙයක් වෙනුවට දිමුතු සහ දිලාන්ති තාරකා ගොඩක් බැලීමට ත් සමත් වුනා.

"දුර දක්ණය නැතුව පියවි ඇසින් බලනවාට වඩා බොහොම ලොකුවට දුර දක්ණයෙන් පෙනෙනවා" යැයි තාත්තා ළමයිනට කීවා.

ළමයින් එක් එක්කෙනා දුර දක්ණයෙන් අහසේ නොයෙක් පැනි දෙස බලා තරු හා ආකාශ වස්තු නිරීක්ෂණය කළා. දුර දක්ණයෙන් බලන විට තරු වඩා ත් ලොකුවට පෙනෙන බව ඔවුනට ඒත්තු ගියා.

"ප්ලේඩ් මොන තාරකා මණ්ඩලයට අයිති ද කියලා ඔය දෙදෙනා ගෙන් මනක කාට ද?" තාත්තා ඇසුවා.

"වෘෂභ තරු මණ්ඩලයට. වෘෂභ රාශියට අයිති යි. එතන රතු පාට තරුවකු ත් තියෙනවා." එහෙම කීවා දිලාන්ති.

"ඒ තරුවේ නම අල්දෙබරාන්. දැන් ඒ තාරකාව කොතැන ද?" තාත්තා ඇසුවා.

ප්ලේඩ් අසලින් 'අල්දෙබරාන් දෙකක්' හෙවත් රතු තරු දෙකක් තිබෙන සැටි ළමයින් දුටුවා!

"තාත්තේ, තාත්තේ! තවත් අල්දෙබරාන් තරුවක් පෙනෙනවා!" දිලාන්ති කෑ ගැසුවා.

"ළමයිනි, එය අල්දෙබරාන් තරුවක් නො වෙයි. ඒ විතරක් ද, එය කොහෙත් ම තරුවක් නො වේ..."

"එහෙනම් එය මොකක් ද?" දුව ඇසුවා.

"නුඹලා දුර දක්ණයෙන් වරින් වර එක්, එක් රතු තරුවක් දෙස බලන්න උත්සාහ කරපල්ලා."

ඒ වැඩේ අසීරු ය. ඒවා බැලීම පිණිස බොහෝ වේලාවක් ගත කිරීමට ළමයිනට සිදු වුනා.

ළමයිනට ඒ තාරකා පෙනුනේ මේ විධියට ය: එකක් රතට හුරු තිතකි. අනික කුඩා වටකුරු පෙත්තක් බදු ය.

"සැබෑ අල්දෙබරාන් තරුව රතු තිතක් වගේ. වටකුරු පෙත්තක් වගේ පෙනෙන්නේ අහඹරු ග්‍රහයා

තවත් එක අල්දෙබරාන් තරුවක් ද?

හඳ තෙ පිට ඉහළින් පෘථිවිය (පිටුව 78).

මිස තරුවක් නොවේ,'' තාත්තා විස්තර කළා.

''අහහරු ග්‍රහයා මීට පෙර තිබුණේ කොහේ ද? අපට එය නොපෙනුනේ මන්ද?'' දිලාන්ති ඇසුවා.

''ඇත්ත, අහහරු අහසේ ගමන් කරනවා. දැන් එයා වෘෂභ ලග්නයට ඇවිත් ඉන්නවා. එම ලග්නයේ සුමාන කිපයක් ඉඳලා ඉවත යනවා,'' තාත්තා විස්තර කළා.

''එහෙනම් අහහරු සංචාරකයෙක් ද?''

''ඔව්. අහහරු සංචාරය කරනවා විතරක් නොවෙයි. ඉස්සර කාලේ සිට මිනිසුන් නිරීක්ෂණය කළා. තරු අතරින් එහා-මෙහා යන දිප්තිමත් ආකාශ වස්තු වගයක් ඒ ගොල්ල දුටුවා. ඒවාට ග්‍රහයා යන නාමය තැබුවා. අහහරු එවැනි ග්‍රහයෙක්.''

''තාත්තේ, හඳ තරුවක් ද, නැතිනම් ග්‍රහයෙක් ද?'' පුතා ප්‍රශ්න කළා.

''හඳ තරුවක් නොවේ, ග්‍රහයෙක් ද නොවේ,'' තාත්තා පිළිතුරු දුන්නා.

''එහෙනම් හඳ මොකක් ද?'' දුව මවිත වෙලා ප්‍රශ්න කළා.

''හඳ ගැන අපි විශේෂ විස්තරයක් දැන ගනිමු. නමුත් අද නොවේ. හඳ පායන රෑයෙක අපි ඒ විස්තරය ගැන කරුණු සොයා බලමු,'' තාත්තා කිවා.

හඳ යනු කුමක් ද?

''අද අහසේ තරු බොහොම ටික යි!'' දිමුතු කිවා.

''ඒ වුනාට හඳ බොහොම ලස්සන යි. බොහොම වටකුරුවට පේනවා,'' දිලාන්ති දිමුතු ගේ මතයට විරුද්ධ වුනා.

''හඳ නැති රාත්‍රී අපේ නිරීක්ෂණ සහ ඇවිදීම් සඳහා මා තෝරා ගත්තේ නිකමට නොවේ. නමුත් අද අපට හඳ ඕන. තරු අවශ්‍ය නැහැ. ළමයිනි, නුඹලා හඳ ගැන දන්නේ මොනවා ද?'' තාත්තා ඇසුවා.

''රොකට්ටුවකින් හඳ වෙත යන්නට පුළුවනි!'' දිමුතු කිවා.

''දැනට ම ත් හඳට මිනිසුන් ගොඩ බැහැලා තියෙනවා!'' කියලා දිලාන්ති එකතු කළා.

''හොඳ යි. කියන්න, අපට වඩා ත් දුරින් පිහිටා





හඳ – පෘථිවියට ඉතා ම ළඟින් පිහිටි ආකාශ වස්තුව ය. එය පෘථිවියේ ගමන් සගයා ය (චන්ද්‍රිකාව ය). පෘථිවියේ සිට හඳට ඇති දුරප්‍රමාණය කිලෝමීටර 3,84,000 ක් පමණ වේ.

තියෙන්නේ හඳ ද, නැතිනම් තාරකා ද?'' තාත්තා ප්‍රශ්න කළා.

''තාරකා'' යැයි දිලාන්ති කිවේ දැඩි විශ්වාසයකින්.

''ඔවු, තාරකා තම යි. තරු දක්වා කිසිවකුට පියාඹා යන්න බැහැ. හඳට යත හැකි යි!'' දිමුතු විස්තර කළා.

''එය නිවැරදි යි. හඳ ඉරට ත් වඩා මහ පොළවට කිට්ටු යි. **අපට ඉතා ම කිට්ටු ආකාශ වස්තුව හඳ ය.**''

''ආලෝක ධාරාවට හඳේ ඉඳලා මහ පොළවට පැමිණීමට කොච්චර වේලාවක් ගත වෙනවා ද?'' දිලාන්ති විමසුවා.

''තත්පරයකට ත් ලුටටක් වැඩියෙන්!'' යැයි තාත්තා පිළිතුරු දුන්නේ ය. ''ඔය ගොල්ල 'එ-ක-යි' කියලා සෙමින් කියන්නත් ඉස්සෙල්ලා ආලෝක ධාරා අපේ පෘථිවියට ඇවිල්ලත් ඉවර යි. නමුත් අජටාකාශ රොකට්ටුවට හඳට යාමට දවස් කීපයක් ගත වෙනවා. රොකට්ටුව වේගයෙන් ගියත්, ආලෝක ධාරාව තරම් වේගයෙන් යන්න බැහැ.''

"හඳ ද ලොකු, තාරකා ද ලොකු?" දිමුතු ප්‍රශ්න කළා.

"ඒ ප්‍රශ්නයට ඔය ළමයින් ම පිළිතුරු සොයා ගත යුතු යි. ඔය දෙදෙනා දන්නවා තාරකා තියෙන්නේ හඳට වඩා බොහෝ ඈතින් බව. ඒ නිසා අපට තරු බොහොම කුඩාවට පේනවා. නමුත් ඇත්ත වශයෙන් නම් ඒවා හඳට වඩා බොහොම විශාල යි."

"එහෙනම් ඉර ත් හඳට වඩා විශාලයි ද?" පුතා ප්‍රශ්න කළා.

"ඔවු. හඳ අපේ පෘථිවියට ඉතා ම ළඟින් පිහිටා තිබෙන නිසා අපට එය ඉතා විශාල ලෙස පෙනෙනවා. නමුත් ඇත්තට ම නම් හඳ ඉරට සහ තරුවලට කිප ගුණයකින් පුංචි යි."

"තාත්තේ, හඳ බැබලෙන්නේ කොහොම ද? හඳ තරුවක් නො වන බව තාත්තා ම කිවා නේද?"

"හඳ බැබලෙන්නේ ඉරු රැස් හඳට වැටෙන නිස යි. නැතුව ස්වයං ආලෝකයක් නිසා නො වෙයි. දුර දක්ණයෙන් හඳ දෙස බලන්න."

"කොතරම් ලස්සන පන්දුවක් ද?" හඳ නිරීක්ෂණය කළ දිලාන්ති කිවා.

"ඔවු, හඳ ලස්සන යි. හඳ පන්දුවක් වගේ වස්තුවක් බව දුර දක්ණයට හොඳින් පේනවා," තාත්තා කිවා.

"හඳේ තවත් මොනවා තියෙනවා ද? ඇස් සහ කට කොහේ ද? දුර දක්ණයෙන් මට ඒවා පෙනෙන්නේ නැහැ." දිමුතු කනගාටු වුනා.

"හඳේ ඒ වගේ දේ නැහැ. හඳේ තියෙන විශාල කළු පාට ලප අපට පෙනෙන්නේ ඇස් සහ කට වගේ තම යි. නමුත් හැබැවට නම් හඳේ මතුපිට සමතලා බිමක් වගෙ යි. ඒවාට කියන්නේ සාගර කියලා."

"මම කැමති යි හඳේ සාගරවල පිහනන්නට," දිමුතු හිනා වුනා.

"ඔවු, ඒ සාගර වල පුතාව නො ගිලෙන්නට ඉඩ තියෙනවා," තාත්තා කිවා.

"මක්නිසා ද?" පුතා ඇසුවා.

"හඳේ සාගරවල වතුර බින්දුවක් වත් නැති නිසා!"

සති දෙකක් දිර්ඝ දිවා කාලයේ දී හඳ මතු පිට උෂ්ණය අංශක +150 (සෙල්සි) දක්වා රත් වේ. අනතුරු ව එතරම් දිර්ඝ රාත්‍රියේ දී අංශක −120 දක්වා එය සීතල වේ.



"එහෙනම් ඒවා සාගර වෙන්නේ කොහොම ද?" පුතා ඇසුවා.

"ඒවාට සාගර කියලා නම් කළේ හදේ ජලය, වාතය නැති බව දැන ගැනීමට ඉස්සෙල්ලා. එහි වැසි නැත. හිම නැත. අඳුරු දවස් නැත..."

"හදේ ජලය සහ වාතය නැති නම් එහි ජීවත් වන්නේ කොහොම ද?" දුව විමසුවා.

"හදේ ජීවත් විය නො හැකි යි. හදට ගොඩ බැහැපු අජටාකාශ ගාමියෝ අජටාකාශ ඇඳුම (ස්කපාන්දරය) ඇඳ ගෙන තම යි ඇවිද්දේ," තාත්තා විස්තර කළා.

"තාත්තේ, මට පෙනෙනවා හදේ විශාල වළක් වගේ දෙයක්, එය වටේට ආලෝක ධාරා තියෙනවා වාගේ. ඒ මොනවා ද?" දිමුතු ප්‍රශ්න කළා.

"ඒවාට කියන්නේ කුහර (ක්‍රේටර්) කියලා, ඒ වගේ කුහර හදේ ගොඩක් තියෙනවා."

"කුහර කියන්නේ මොනවාට ද?" දුව ප්‍රශ්න කළා.

"හදට අයත් කුහර, විශාල වළවල් හැදිලා තියෙන්නේ අති විශාල ගල් කැට වැටීම නිසා."

"තාත්තේ, අජටාකාශ ගාමියෝ හදට ගිහිල්ලා කළේ මොනවා ද?" දුව ඇසුවා.

"නොයෙක් උපකරණ මගින් හදෙ පිරික්සා බැලුවා. හදේ තියෙන ගල්කැට එකතු කරලා ගෙනාවා."

"තාත්තේ, හදේ සිට බලන විට තාරකා පේනවා ද?"

"ඔවු, පේනවා. දවාලට වුනත් හදේ සිට දිප්තිමත් තරු බලන්නට පුළුවන්. තාරකා සහ ඉරු හැරුණු විට, අපේ පෘථිවිය ත් එහි සිට බලන්නට පුළුවනි."

"මහ පොළව පේනවා ද?" පුතා පුදුම වුනා.

"ඔවු! අපි දැන් හඳ දෙස බලා ප්‍රීති වෙනවා වගේ හදේ සිට පෘථිවිය බලා ප්‍රීති වෙන්නත් පුළුවනි!"

අපේ අජටාකාශ යානය

අජටාකාශයේ සිට ගන්නා ලද පෘථිවියේ ජායා රූප සහිත පොතක් එක් දවසක හවස තාත්තා සහ ළමයින් බලන්නට පටන් ගත්තා. හදේ සිට ත්, කෘත්‍රිම චන්ද්‍රිකා මගිනු ත් පෘථිවියේ ජායා රූප ගෙන තිබෙන බව ත්,







සමහර ඡායා රූප අජටාකාශ යානා මගින් ගත් බව ත් තාත්තා විස්තර කළා. හඳේ සිට බලන විට අහසේ පෘථිවිය නිල්වන් ගෝළයක් සේ පෙනෙන ඡායා රූපයට ළමයින් බොහොම කැමති වුනා.

"පෘථිවිය එල්ලී තිබෙන්නේ මොකකින් ද?" එලෙස ප්‍රශ්න කළේ පුතා.

"කිසි ම දෙයකින් එල්ලී ලා නැහැ! හඳ ත් ඒ වගේ ම තම යි."

"හඳ අපේ මහ පොළව උඩට කඩා වැටෙන්නට පුළුවනි නේද?"

"බය වෙන්න එපා: හඳ මහ පොළවට උඩින් එල්ලිලා නැහැ! එය අපේ පෘථිවිය වටා ඉක්මණින්

ගමන් කරනවා. හඳ පෘථිවියේ ගමන් සගයෙක්", තාත්තා විස්තර කළා.

"කෘත්‍රිම චන්ද්‍රිකාවක් වගේ දෙයක් ද?"

"නැහැ. කෘත්‍රිම චන්ද්‍රිකා කියලා කියන්නේ මිනිසුන් හදලා අප්ටාකාශ ගත කළ වස්තුවලට. හඳ සැබෑ ආකාශ වස්තුවක්."

"එවිට පෘථිවිය?" පුතා ප්‍රශ්න කළා.

"පෘථිවිය ත් ආකාශ වස්තුවක්. ග්‍රහයන් ගෙන් එකක්" යැයි තාත්තා කිවා.

"එහෙනම් ඉර ගැන කොහොම ද?" දුව ප්‍රශ්න කළා.

"ඉර ත්, තාරකා ත් සියල්ල ආකාශ වස්තු!" තාත්තා විස්තර කළා.

"අහහරු ගැන ත් එහෙම ද?"

"අහහරු ද අපේ පෘථිවිය වගේ ම ආකාශ වස්තුවක්. **ආකාශ වස්තු මහ ගොඩාක් තියෙනවා. ඒවා අතර තාරකා, ග්‍රහයෝ සහ ග්‍රහයන් සමග ගමන් කරන චන්ද්‍රිකා ආදිය තියෙනවා.** තාරකා ගිනි ගෙන දැවෙන වස්තු බව දුව යි, පුතා යි දන්නවා. ඒවා ගිනි ගෙන තිබෙන නිසා තම යි දිලිසෙන්නේ. **ග්‍රහ ලෝක සහ චන්ද්‍රිකාවල ගින්දර නැහැ. ඒවා ශීතල වස්තු. ඒවා දිලිසෙන්නේ නැහැ. ඒවා හිරු රැස් නිසා ආලෝක වෙනවා. ඒ නිසා තම යි අපට ඒවා පෙනෙන්නේ.**"

"එහෙනම් ඉර හරියට විදුලි පන්දමක් වගේ දෙයක්!" පුතා ඇසුවා.

"එහෙම කියලා කියන්ට පුළුවනි," මඳ සිනා පාමින් තාත්තා කිවා.

"ඉර ලෝකය වටේ කරකැවෙන ගිනි පන්දමක් කියලා කිව හැකි යි," පුතා පැවසුවා.

"ඒ කතාව සම්පූර්ණයෙන් වැරදි යි," පුතා ගේ කතාවට තාත්තා බාධා කළා. "ඉර කොහොමට වත් පෘථිවිය වටේ කරකැවෙන්නේ නැහැ."

"අපට පෙනෙනවා නෙව, ඉර ආකාසේ ගමන් කරන හැටි!" දිමුතු අමනාපයෙන් කිවා.

"ඔව්, අපට එහෙම පෙනෙනවා තම යි. නමුත් අපේ දෙනෙත් අපට හැම තිස්සේ ම විශ්වාස කිරීම

පෘථිවියේ ප්‍රථම කෘත්‍රිම චන්ද්‍රිකාව.



මෝරා වැඩෙන හඳ

දැපහසු යි. ඉර පෘථිවිය වටා යන සැටි අපට දැනුනත්, ඇත්ත වශයෙන් සිදු වන්නේ ඊට ප්‍රතිවිරුද්ධ දෙයක්: **පෘථිවිය ඉර වටේට ගමන් කරනවා...**

"අපි ත් එහෙම ගමන් කරනවා ද?" පුතා පුදුම වුනා.

"අපි නිකම් ගමන් කරනවා පමණක් නොවෙයි. වේගයෙන් දුවනවා. අපි පෘථිවිය ත් සමග අජටාකාශයේ පියාඹනවා!" යැයි තාත්තා පැහැදිලි කළා.

"එහෙනම් අපි ත් අජටාකාශ ගාමීන් වගේ ද?" දිමුතු ප්‍රශ්න කළා.

"ඊට ත් වඩා වැඩි වේගයෙන්! අපේ පෘථිවිය තම යි ඉතා ම සැප පහසු අජටාකාශ යානය. අපේ පෘථිවිය ඕනෑ ම අජටාකාශ යානයකට ත් වඩා වැඩි වේගයකින් හිරු වටා යනවා.." තාත්තා පුතා ගේ ප්‍රශ්නයට පිළිතුරු දුන්නා.

"අපේ පෘථිවිය ඉරට හැප්පේවි ද?" පුතා ඇසුවා.

"නැහැ. කොහෙත් ම නැහැ. අපි ඉරට හැප්පෙන්න යන්නේ නැහැ. ඉර වටේට ගමන් කරනවා. අපේ ගමන් මාර්ගය පිහිටා තිබෙන්නේ ඉරට කිලෝමීටර කෝටි ගණනක් ඇතින්. පෘථිවිය ඉර වටා යන්නේ කොහොම ද කියලා හොයා බලමු ද?"

තිදෙනා එකතු වෙලා ලොකු ගෝලයක් ඇන්දා. දිමුතු එය කහ පාටින් පාට කළා. ඒ තම යි ඉර. තාත්තා පොඩි කවයක් ඇඳලා ඉවර වුනා ම දිලාන්ති එය නිල් පාටින් පාට කළා. එය පෘථිවිය ය. ඉන් පසු තාත්තා ඉර වටා රතු පැන්සලයකින් පෘථිවිය ගමන් කරන මාර්ගය ඇන්දා.

හඳ වෙනස් වන්නේ මක්නිසා ද?

හඳ දෙස බලා හැමදා ම එහි රූපය අඳින ලෙස තාත්තා ළමයින් ගෙන් ඉල්ලා හිටියා. දුව සහ පුතා හවස සංචාරයෙන් පසුව හඳේ රූප අඳින්නට පටන් ගත්තා. ඉක්මනින් ම, ඔවුන් ගේ කොපි පොත්වල හඳේ රූප බොහොමයක් ම ඇඳ ඇති සැටි දුටුවා. හඳ කවයක්, වට රවුමක් වගේ පෙනී සිට පසුව කෙමෙන් අඩ කවයක් දක්වා අඩු වන සැටි ඒ රූපවලින් දැක ගත හැකි විය. අන්තිමට එය මිට නැති හීන් දැකැත්තක් වගේ පෙනුනා.

"හඳ මේ විධියට වෙනස් වන්නේ මක්නිසා ද?" දිමුතු සුදුමයෙන් ප්‍රශ්න කළා.

"අපි දැන් එය තෝරා බේරා ගන්නට මහන්සි ගනිමු" යි කී තාත්තා රබර් බෝලයක් සහ විදුලි පන්දමක් ගෙනෙන ලෙස පුතාට කිවා. "මේ රබර් බෝලය හඳ හැටියට ත්, පුතා වාඩි වෙලා ඉන්න පුටුව පෘථිවිය හැටියට ත් අපි සිතා ගනිමු. දුව රබර් බෝලය ත් අරගෙන පුටුව වටේ යන්න. ඒ අනුව අපි හඳ පෘථිවිය වටේ යන සැටි සිතා ගනිමු. මම විදුලිය පන්දම ත් අරගෙන ඇතට යන්නම්. විදුලිය පන්දම තම යි ඉර."

තාත්තා විදුලිය පහන නිවා දැම්මා.

"හඳ හොඳට පේනවා ද?" තාත්තා පුතා ගෙන් ඇසුවා.

"කොහෙත් ම පේන්නේ නැහැ."

"ඒක හරි. හඳට ස්වයං ආලෝකයක් නැහැ. ඔන්න දැන් මම පෝච් එක පත්තු කළා. ඒ තම යි ඉර එළිය. දැන් දුව 'ඉර'ට යි 'පෘථිවිය'ට යි මැදින් හිට ගන්න. විදුලිය එළිය නිසා 'හඳ' (රබර් බෝලය) හොඳට ආලෝක වෙලා ද?"

"නැහැ, අඩුවෙන්." පුතා පිළිතුරු දුන්නා.

"ඔන්න ඔය විධියට ම හඳ හිරුට යි, පෘථිවියට යි මැදින් සිටින විට අපට හඳ පෙනෙන්නේ නැහැ. දැන් දුව බෝලය ත් අරගෙන 'පෘථිවිය' (පුටුව) වටා ගමන් කරන්න. හෙමිහිට පියවර දෙකක් යන්න."

"දැකැන්නට සමාන සිහින් එළියක් බෝලයට වැටිලා තියෙනවා!" පුතා සැලකිල්ලෙන් බලා කිවා.

"දුව තවත් පියවර කිපයක් යන්න! දැන් පුතාට බෝලයට වැටී ඇති ආලෝකය පෙනෙන්නේ කොහොම ද?"

"බෝලයෙන් අඩකට ආලෝකය වැටිලා!" පුතා කිවා.

"හොඳ යි. දැන් දුව බෝලය ත් අරගෙන තවත් පියවර කිපයක් යන්න. දැන් නවතින්න. 'පෘථිවිය' වට යන 'හඳ' එහි ගමනින් අඩක් ගිහිල්ලා තියෙනවා."

"දැන් මුළු බෝලය ම ආලෝක වෙලා!" යැයි පුත කියුවේ කෑ ගසමිනි.

හඳ කෙමෙන් අඩු වෙයි (අවපක්ෂයට යයි).



"පුර සඳ හෙවත් පසළොස්වක ඇති වන්නේ කවදාට ද?" තාත්තා ප්‍රශ්න කළා.

"පෘථිවිය හඳට සහ හිරුට මැදින් හිටියා ම," දිලාන්ති දුව පිළිතුරු දුන්නා.

"ඔන්න ඔහොම තම යි හඳ අඩු වැඩි වෙලා අපට පෙනෙන්නේ. හඳ වෙනස් වෙමින් අපට පෙනෙන සැටි දන් ඔය දෙදෙනා තේරුම් ගත්තා ද? **පෘථිවියේ ඉන්න අපට හිරු ගේ ආලෝකයට හසුවන හඳේ කොටස පමණක් පෙනෙනවා.**"

දවල් වෙලා රෑ වුනා ම, එක දවසක් ගෙවී යනවා

තාත්තා මේසය උඩ ලෝක ගෝලය සහ විදුලි පහන තැබුවා.

"මේ ලෝක ගෝලය අපේ පෘථිවියේ ඉතා කුඩා ආදර්ශ රූපයක් විතර යි. නමුත් එහි රටවල් නිසි පරිදි ඇඳලා තියෙනවා. ගොඩබිම සහ සාගර ලකුණු කර ඇත. ලෝක ගෝලය සිය අක්ෂය වටා කරකැවෙන ඔයාලට පෙනෙනවා නේ ද! අපේ පෘථිවිය ත් එලෙස ම භ්‍රමණය වෙනවා."

"පෘථිවිය බම්රයක් වගේ කැරකැවෙනවා ද?" පුතා ප්‍රශ්න කළා.

"ඔව්! **අපේ මේ විශාල පෘථිවිය බම්රයක් වගේ කරකැවෙනවා. නමුත් එසේ භ්‍රමණය වන්නේ හෙමින්. එහෙම එක වරක් කරකැවෙන විට පැය විසි හතරක් ගත වෙනවා. පැය විසිහතරක් එක දවස යි.**"

"සෑම පැයකට ම විනාඩි හැටක් තිබේ!" එහෙම කියුවේ දිලාන්ති.

තාත්තා අල්පෙනෙත්තක් අරගෙන එය ලෝක ගෝලයට ඇන සිටවී ය.

"තාත්තා එහෙම කළේ මොකට ද?" දුව ප්‍රශ්න කළා.

"අප වාසය කරන ස්ථානය ඔයාලට පෙන්වීමට" යැයි කී තාත්තා මේසය උඩ තියෙන විදුලි පහන පත්තු කරන ලෙස පුතාට ද, කාමරයේ ඇති ලොකු විදුලි පහන නිවා දමන ලෙස දුවට ද දැන්වුවා. "ඔන්න විදුලි පහන තම යි හිරු. ලෝක ගෝලය – අපේ පෘථිවිය. අල්පෙනෙත්තෙන් පෙන්වන්නේ අප වාසය කරන





ස්ථානය. ඔන්න දැන් අපේ රටට එළිය වැටෙනවා ද?''

''ඔවු, එළිය වැටිලා,'' මෙයි කීවා.

''එහෙනම් අපේ නගරයට දැන් දවල් කාලය යි. දැන් මම ලෝක ගෝලය කරකවන්නම්. ඔන්න දැන් අපේ රටට සහ නගරයට එළිය වැටෙන්නේ නැහැ. ලෝක ගෝලයේ ඒ පැත්ත කළුවර වෙලා. දැන් එතකොට අපේ රටේ උදුවිය මොනවා කියනවා ද?''

''අපට රෑ වෙලා යැයි කියාවි,'' පුතා පිළිතුරු දුන්නා.

''අයෙමත් අපට දවල් වෙන්නේ කොයි වෙලාවට ද?'' තාත්තා ඇසුවා.

''අපට දවල් වෙන්නේ පෘථිවිය ඉර තියෙන පැත්තට





චන්ද්‍රයා ගේ විෂ්කම්භය හිරු ගේ විෂ්කම්භයට වඩා 400 ආරයකින් කුඩා ය.



හැරුණා ම'' දුව කිව්වා.

''පෘථිවියේ රෑ දාවල් වන්නේ මක්නිසා ද?'' තාත්තා ප්‍රශ්න කළා.

''ඉර එතාවක් අපට ආලෝකය දෙනවා, තවත් එතාවක් ආලෝකය දෙන්නේ නැති නිසා,'' පුතා පිළිතුරු දුන්නා.

''පෘථිවිය භ්‍රමණය වන හන්දා,'' දුව කිව්වා.

''හරියට හරි! අපේ පෘථිවිය වරක් එක් පැත්තකු ත් අනික් වර තවත් පැත්තකු ත් හිරු දෙස හරවමින් භ්‍රමණය වන නිසා, දවල් වෙලා, රෑ වෙනවා, එක් දවසක් ගෙවී යනවා.''

ඉන් පසුව ළමයි ඒ පාඩම ක්‍රීඩාවක් බවට හරවා

ගෙන නොයෙක් නගරවලට අල්පෙනෙත්තිය ඇණලා විමසන්නට පටන් ගත්තා: "මම ඉන්නේ මේ රටේ. දැන් මේ රටට රෑ වෙලා ද, නැතිනම් දවල් වෙලා ද?" ලෝක ගෝළය හරව, හරවා අල්පෙනෙත්තෙන් ඇනලා මේ විධියට සෙල්ලම් කරන්නට පුතා.

"පෘථිවිය ඉර වටා ගමන් කරනවා කියලා තාත්තා කිව්වා නේ ද?"

"ඔව්. මම කිවා. **අපේ පෘථිවිය එහි අක්ෂය වටා භ්‍රමණය වනවා පමණක් නොව, ඉර වටේට ත් ගමන් කරනවා.** කොතරම් වේගයෙන් ගියත් ඉර වටා එක් වරක් යාමට පෘථිවියට අවුරුද්දක් ගත වෙනවා. ඒ ගමන් මාර්ගය බොහොම දිග යි! ඔන්න දැන් පාසල් යන වයස ඇවිල්ලා. දැන් දුවට වයස හත යි. ඒ අනුව දුව පෘථිවිය සමඟ ඉර වටේ කී වරක් ගිහිල්ලා තියෙනවා ද?"

"හත් වරක්!" දුව පිළිතුරු දුන්නා.

"මේ කාලය තුළ දී හිම වැටෙන සීත ඍතු කියක් ඇති වුනා ද?" තාත්තා ඇසුවා.

"හතක්!"

"ගිම්හාන ද?"

"ගිම්හානය ත් හත් වරක් ඇති වුනා!" දුව පිළිතුරු දුන්නා.

"හැම අවුරුද්දක ම ශීත කාලය සහ ගිම්හාන කාලය ඇති වෙන බව මම දන්නවා" යැයි පුතා කීයේ ය.

"අපේ පෘථිවිය ග්‍රහයෙක් බව පුත යි දුව යි දන්නවා ද?" වරක් තාත්තා මෙයින් ගෙන් ප්‍රශ්න කළා.

"අපි දනිමු!"

"පෘථිවිය හැරුණු විට තවත් ග්‍රහ ලෝක තියෙනවා ද?"

"අහහරු!" පුතා කිවා.

"සිකුරු!" දුව උත්තර දුන්නා.

"අහහරු සහ සිකුරා පමණක් නො වෙයි. හිරු වටා ලොකු ග්‍රහයන් නව දෙනෙක් කරකැවෙනවා," තාත්තා විස්තර කළා.

"නවයක් ද?" පුතා ඇසුවේ මවිතයෙන්. "මා

ධූම කේතුවක්.

දන්නේ පෘථිවිය, අඟහරු සහ සිකුරු ගැන විතර යි."

"තවත් බ්‍රහස්පති!" දුව කිව්වා.

"ඒ හැර සෙනසුරු සහ තවත් ග්‍රහ ලෝක තියෙනවා," කී තාත්තා ඒවා ඇඳලා පෙන්නුවා. "ඒවා හැම එකක් ම හිරු වටේට ස්වකීය ගමන් මාර්ග ඔස්සේ යමින් සිටිනවා."

"එහෙනම් හිරුට ළමයින් නව දෙනෙක් ඉන්නවා නේද?" දුව එලෙස ප්‍රශ්න කළා.

"ඒවා අප ගේ හිරුට අයත් ප්‍රධාන නැයන් නව දෙනා ලෙස හඳුන්වන්න පිළිවනි" යි තාත්තා කීවේ පිළිතුරු වශයෙනි.

"තවත් නැයන් ඉන්නවා ද?"

"ඔව්, ඒවා මහා ගොඩක්!" තාත්තා කිව්වා.

"ඒවා අහසේ පෙන්වීමට තාත්තාට පුළුවන් ද?"

"පොරොන්දු වීමට බැහැ."

"මක්නිසා ද?"

"ඒ කුඩා ග්‍රහයන් දැකීම බොහොම අමාරු යි. නැතිනම් ඉතා කලාතුරකින් වල්ගා තරු වගේ අපට පෙනෙනවා. ඒවාට **ධූම කේතු** කියලා ත් කියනවා."

"ඇහැට නො පෙනෙන ඒ කුඩා ග්‍රහයන් තියෙන්නේ කොහේ ද?" පුතා ප්‍රශ්න කළා.

"ඒවා වැඩි හරියක් තියෙන්නේ අඟහරු සහ බ්‍රහස්පති අතර යි."

"ධූම කේතු තියෙන්නේ කොහි ද?" දුව ඇසුවා.

"ධූම කේතු අහසේ සංචාරකයෝ. ඒවා තියෙන්නේ හිරු ගෙන් බොහෝ ඈත. හිරු දෙසට එන විට මේවාට වලිග ඇති වෙනවා. ඒ වලිග අජටාකාශ ධූලි සහ ගෑස් වායුවෙන් ඇති වෙන දේ බව දැන ගෙන තිබේ."

ළමයි තාත්තා ඉදිරිපත් කළ චිත්‍ර බොහෝ වේලාවක් වුවමනාවෙන් බැලුවා. පසුව දිමුතු සහ දිලාන්ති හිරු ගේ මිතුරන් ඇඳලා විවිධ පාට වලින් පාට කළා.

"අපි මේ හිරු ගේ මිතුරන් ගැන මොකක් හරි ක්‍රීඩාවක් ඇති කරමු!" යි දිලාන්ති යෝජනා කළා.

"එහෙනම් ඉතින් ඔය ගොල්ල ම එය හිතා ගන්න!"

"අපි ඉර සහ ග්‍රහයන් හිමවලින් හදමු!" එහෙම යෝජනා කළේ දිමුතු.

හිරු ද, ලොකු සහ කුඩා ග්‍රහ ලෝක ද, ග්‍රහ ලෝකවලට අයත් ස්වාභාවික චන්ද්‍රිකා ද, ධූම කේතු ද එකතු වී සෞර ග්‍රහ මණ්ඩලය සැදී ඇත. මෙම මණ්ඩලයට ලොකු ග්‍රහයන් නවයක් අයත් ය:

බුදහු
සිකුරු
පෘථිවිය
අඟහරු
බ්‍රහස්පති
සෙනසුරු
යුරේනස්
නෙප්චූන්
ප්ලූටෝ

මහ පොළවේ කෙළවරට ගිහිල්ලා අහසේ පියස්සට එහා වෙන දේ දැක බලා ගත්ත හැකි යැයි ඉස්සර මිනිසුන් සිතුවා. එය නිවැරදි අදහසක් ද?

"හොඳ යෝජනාව! ඉතා ම ලොකු හිම බෝලය හිරු. එය එටේ කෙළෙන් කුඩාවට ග්‍රහයන් වෙනුවට හිම බෝල හදන්න ඕන. ඒවා හිරු ගෙන් ඇතට, ඇතට තැබිය යුතු ය. බුදහු හිරු ළඟින් ම තියන්න ඕන. ඊළඟට සිකුරු. සිකුරු හා පෘථිවිය ප්‍රමාණයෙන් එක හා සමාන යි. හිරු ගේ සිට තෙවැන්නා පෘථිවිය. හතරවැනියා අඟහරු. එය පෘථිවියට වඩා කුඩා ය. පස්වැන්නා බ්‍රහස්පති. එය හිරු හැරුණු විට ලොකු ම ග්‍රහයා වේ."

"මම වෙනත් ක්‍රීඩාවක් හිතින් මවා ගත්තා! අපි ළඟාගාරයට ගියා ම ළමයින් ග්‍රහයන් හැටියට ගෙන සෙල්ලම් කරනවා," දුව කිවා.

"හොඳ යි, එහෙම සෙල්ලම් කරන්න!" තාත්තා සිනා වෙලා පැවසුවා.

වෙනත් ග්‍රහ ලෝකවල ජීවත් විය හැකි ද?

දවසක් දා තාත්තා මෙහෙම කිවා:

"අපේ චූටි සීයා මට අළුත් ආරංචියක් කිවා! ඉක්මණට ම ඔබට අහසේ සිකුරු, අඟහරු සහ බ්‍රහස්පති දකිමට හැකි වේවි."

1961 අප්‍රේල් මස 12 දා මිනිසා ප්‍රථම වරට අජටාකාශ ගත විය. ප්‍රථම අජටාකාශ ගාමියා සෝවියට් රට වැසි යූරි ගගාරින් ය.

එක් දවසක් හවස ඇඳිරි වැටුණු පසුව නාත්තා මෙයිනට ග්‍රහ ලෝක තුන පෙන්වා දුන්නා. ඒවා තාරකා මෙන් සෙලවුනේ නැහැ. නුමුත් සථිර ලෙස ආලෝකයක් විහිදුවනවා. අහසරු යම්තමින් රතු පාට යි. සිකුරු සහ බ්‍රහස්පති බොහොම සුදු පාට යි. මේ ග්‍රහ ලෝක දෙක තාරකාවලට ත් වඩා දිප්තිමත්.

"නාත්තේ, ග්‍රහ ලෝක තරු නො වන නිසා ඒවායේ පිවත් විය හැකි, නේද" යි පුතා පියා ගෙන් විමැසී ය.

"සත්තකින් ම," නාත්තා කීවා. "ඔයා පෘථිවිය නමැති ග්‍රහ ලෝකයේ පිවත් වෙනවා නෙව."

හඳ මතු පිට ගමන් කළ රිය - ලූනාහොද්.

ඇමරිකානු ගගන ගාමිනු සඳට ගොඩ බසිති.

"වෙනත් ග්‍රහ ලෝකවල මිනිසුන් ජීවත් වෙනවා ද?" දුව ඇසුවා.

"හිරු ගේ මෙම සහෝදර පවුලේ සාමාජිකයන් අතරින් ජීව ප්‍රාණින් වසන්නේ අපේ පෘථිවියේ පමණ යි" යනු පියා ගේ පිළිතුර විය.

"අජටාකාශ ගාමීන් වෙනත් ග්‍රහ ලෝකවලට ගිහිල්ලා තියෙනවා ද?" පුතා උනන්දුවෙන් ඇසුවා.

"මෙතෙක් වෙනත් ග්‍රහ ලෝකවලට ගිහිල්ලා නැහැ. අපේ පෘථිවිය වටා කක්ෂ ගත වෙලා තියෙනවා. හඳට ගොඩ බැහැලා තියෙනවා. **මිනිස් ඉතිහාසයේ ප්‍රථම වරට අජටාකාශ ගත වූ පුද්ගලයා සෝවියට් රටවැසි යූරි ගගාරින් ය.** විද්‍යාඥයෝ සහ ඉංජිනේරුවරු ග්‍රහ ලෝකවලට නොයෙක් ස්වයංක්‍රිය උපකරණ ගොඩ බස්සවනවා. ඒවායින් අපේ පෘථිවියට ගුවන් විදුලි සංඥා ලැබෙනවා. ඒ සංඥාවලින් බොහෝ තොරතුරු විද්‍යාඥයින්ට දැනගන්නට ලැබෙනවා" යැයි තාත්තා විස්තර කළා.

"අපේ චූටි බහිරව සියා කිසියම් ග්‍රහ ලෝකයකට ගිහිල්ලා තියෙනවා ද?"

"සත්තකින් ම ගිහිල්ලා තියෙනවා! චූටි සියාට විජ්ජාකාර රොකට්ටුවක් තියෙනවා නෙව. වෙනත් සෞර ග්‍රහ මණ්ඩලවලට අයත් ග්‍රහ ලෝකවලට අපේ චූටි සියා යනවා..."

"වෙනත් සෞර ග්‍රහ මණ්ඩලවල ත් ග්‍රහ ලෝක තියෙනවා ද?" දුව විමසුවා.

"බොහෝ දුරට තියෙන්නට පුළුවනි. අපේ හිරු තාරකාවක්. හිරු වගේ තාරකා බොහොම තියෙනවා. එසේ නම් ඒ සෞර ග්‍රහ මණ්ඩලවලට ත් ග්‍රහ ලෝක තියෙන්නට පුළුවනි."

"අපේ පෘථිවිය වගේ ග්‍රහ ලෝක ද?" පුතා ඇසුවා.

"මේ වගේ පෘථිවි ග්‍රහයන් වෙන්නත් පිළිවනි. සමහර විට වෙනත් ග්‍රහ ලෝක වෙන්නත් පිළිවනි..."

"මම බොහෝ ම, ඉතා ම කැමති යි වෙනත් ග්‍රහ ලෝකයකට ගිහිල්ලා බලන්න!" දිලාන්ති කීවා.

"මේ ත් ඉතා ම කැමති යි." දිමුතු ද ඒ අදහසට එකඟ වෙලා කීවා.

ග්‍රහ ලෝක

මේ කොටසේ අරමුණ සෞර ග්‍රහ මණ්ඩලය ගැන වඩා ත් හොඳ අවබෝධයක් ලෙයිනාට ලබාදීම ය.
ගත වර්ෂ ගණනාක් තිස්සේ මීනිස්සු ආකාශ වස්තු පියවි ඇසින් පිරීක්ෂා බැලූහ, නිරීක්ෂණය කළහ. අනතුර ව 17 වැනි ශත වර්ෂයේ දී දුර දක්නයෙන් (දුරේක්ෂයෙන්) නිරීක්ෂණය පටන් ගත්තාට පසුව දැන් මෙම ක්ෂේත්‍රයේ සැහෙන දියුණුවක් ලබා ඇත. දුරේක්ෂ යන්ත්‍රවල ද විශාල වර්ධනය ඇත වී තිබේ. ග්‍රහ ලෝක අධ්‍යයන කිරීමේ නව යුගය ආරම්භ වී දැනට ගෙවී ඇත්තේ වසර විස්සක කාලයක් පමණි. ස්වයංක්‍රීය යන්ත්‍ර ග්‍රහ ලෝකවලට යැවීම ත් සමග මෙම නව යුගය ආරම්භ විය. මේ යන්ත්‍ර දැනට ම ත් හඳට පමණක් නොව සිකුරු සහ අඟහරු ග්‍රහ ලෝකවලට ද යවන ලදී. බුදහු, බ්‍රහස්පති සහ සෙනසුරු ග්‍රහයන් ද, ඒවා වටා ගමන් කරන චන්ද්‍රිකා ද වෙනත් ස්වයංක්‍රීය අන්තර් ග්‍රහ ලෝක යන්ත්‍ර මාර්ගයෙන් ඡායාරූප ගත කරනු ලැබී ය. මේ නිසා ලබා ගෙන ඇති විද්‍යා දත්තයන් ඊට පෙර පැවති ගත වර්ෂ ගණනාවක් තිස්සේ ලබන ලද දැනුමට වඩා බිල ගුණයකින් වැඩි ය.

ඔය ළමයින්ට පාලු ගති නැහෙන දවස් තියෙනවා ද? සත්තකින් ම, සමහර දාට තියෙනවා. අද දිලුතුට සහ දිලාන්තිට පාලු ගතියක් දැනී ඇත.

"අක්කේ, අපි මොකක් හරි සෙල්ලම් කරමු..." මල්ලි අක්කාට අමතා කිවා.

"හොඳ යි. මොන විධියේ සෙල්ලම් ද?"

අලුත් සෙල්ලම් ගැන දෙදෙනා ම දන්නේ නැහැ. තාත්තා ගෙන් ඇසුවා. අලුත් ක්‍රීඩාවක් කියා දීමට තාත්තාට ත් බැරි වුනා. මේ වේලාවේ දී ගෙදර ටෙලිපෝනය හඬ නැගුවා. තාත්තා ටෙලිපෝනයෙන් කතා කරලා සතුටින් මෙසේ කිවා:

"අපට අලුත් ක්‍රීඩාවක් කරන්න පුළුවන් වගෙ යි!"

"මොකක් ද?" ළමයි සතුටින් ඇසුවෝ ය.

"අපි සංචාරයක් පටන් ගනිමු. එය මෙහෙයවන්නේ අපේ ටුටටි බහිරව සීයා."

"එහෙනම් අපි පියාඹනවා ද?" දිලුතු ඇසුවා.

"අපේ ක්‍රීඩාව අජටාකාශ පියාසැරිය යි. ඔය ගොල්ලන් ගේ කාමරය අජටාකාශ යානයක් වෙනවා. දැන් ඉතින් අපි සෞර ග්‍රහ මණ්ඩලයේ ග්‍රහ ලෝක වෙත යමු."

"තාත්තේ, අපි හඳට යමු," දුව යෝජනා කළා.

"මොන පිස්සුවක් ද! හඳට දානට ම ත් මිනිස්සු ගිහිල්ලා තියෙනවා නෙව..." මල්ලි විරුද්ධ වුනා.

"කොහොම වුනත් හඳ සිත් ගන්නා තැනක්," අක්කා යළි කියා සිටියා.

මල්ලි අක්කා ගේ යෝජනාවට එකඟ නැහැ. විප්‍රකාර අජටාකාශ පියාසැරියෙක යෙදෙනවා නම්, මෙතෙක් මිනිසා නො ගිය ග්‍රහ ලෝකවලට යා යුතු යැයි ඔහු කිවා. සිකුරු සහ අඟහරු ග්‍රහ ලෝකවලට යාම වඩා ත් හොඳ ය. මහ විශාල බ්‍රහස්පති ග්‍රහයා වෙත, නැතිනම් වඩා ත් ඈත ග්‍රහ ලෝකවලට යාම සිත් ගන්නා දෙයක් නො වේ ද?

ඔන්න ඉතින් ඒ ගැන වාද විවාද ඇති වුනා. අන්තිමට තීරණය කළා, පෘථිවිය හෙ ම ඇති ග්‍රහයා වෙත යාමට. එය බුදහු බව ළමයි දනිති.

මෙම අජටාකාශ යානයේ ප්‍රධානියා තාත්තා ය.

බ්‍රහස්පති ග්‍රහයා සහ එයට අයත් චන්ද්‍රිකා දෙක (පිටුව 104).

සෝවියට් අජටාකාශ ගාමියෝලියනිද් පපොව් සහ වලේරි රියුමින්.

ඉංජිනේරුවා පුතා ය. මග පෙන්වන්නා දුව ය. අජටාකාශ යානයේ නම 'ගගණ ගාමී ථිතල' ය.

තුන්දෙනා ම ගමන නිසා කැළඹිලා හිටියා.

"අජටාකාශ ගාමියනි, ගමනට සූදානම් වීමේ කාලය විනාඩි දහයකි!" යමකිසිවකු ගේ කටහඬ ඇසෙත් ම තාත්තා, පුතා සහ දුව ආසනවල හරි-බරි ගැසී වාඩි වී ගමනට සූදානම් වූහ.

"සූදානම් වීමේ කාලය විනාඩි දහය යි කිවේ කවුද?" දිලාන්ති මල්ලි සහ තාත්තා වෙත හැරෙමින් ප්‍රශ්න කළා.

නමුත් ඒ ගොල්ල පුදුම වෙලා රූප වාහිණිය දෙස බලා සිටියා මිස කතා කළේ නැහැ. රූප වාහිණියේ ස්විච් යතුර වසා තිබුණ ද එයින් ආලෝකයක් පිටවන සැටියක් දිලාන්තිට දැනුණා.

"නිවේදනය කළේ මා" ය රූප වාහිණි තිරයෙන් චුට්ටි සීයා කතා කරන සැටි ඇසුණා.

"තාත්තේ, අර බලන්නකෝ, අපේ චුට්ටි සීයා!" යැයි පුතා සතුටින් කෑ ගැසුවා.

"තව විනාඩි පහකින් අජටාකාශ යානය මහ පොළොවෙන් ඉහළට නගිනු ඇත. මේ යානය සම්පූර්ණයෙන් ම මෙහෙයවන්නේ මා විසිනි. ඉඳ හිට නුඹලා ගේ ආධාර මට ඕන වෙන්නට පිළිවනි. ඉක්මණින් අපි අජටාකාශ ගතවෙමු. ඉංජිනේරුවා සහ මග පෙන්වන්නිය සුදුසු ආසන වල වාඩි විය යුතු යි. මහ පොළොවෙන් ඉහළ නගින විට අධික පීඩනයක් ඇති වීමට ඉඩ තියෙනවා. නමුත් මගේ මායාකාර රොකට්ටුව නිසා එම පීඩනය ඉතා අඩුවෙන් දැනේ වී," චුට්ටි සීයා කිවා.





බර සහ පීඩනය අධිකවීම යන වචන දිලාන්තිට සහ දිමුතුට නිතර ඇසී ඇත. මහ පොළවේ ගුරුත්වාකර්ෂණයෙන් මිදී ඉහළ නගින විට අජටාකාශ ගාමීන්ට මෙම අධික බර සහ පීඩනය දැනේ. ඔවුනට ආසනවලට ඇලී තිබෙන සැටියක් දැනේ. එහෙනම් එම අධික බරට සහ පීඩනයට පුරුදු විය යුතු යි නේද?

"තව විනාඩිය යි!" චුට්ටි සීයා ගේ කට හඬ ඇසුණා. "අණ තේරුම් ගත්තා!" තාත්තා පිළිතුරු දුන්නා.



"පටන් ගැනීමට ඇත්තේ තත්පර තිහ යි!" තිදෙනාට ම ඇසුණා. "තාත්පර විස්ස යි! පහළොව යි! දහය යි! අට යි! හත යි! හය යි! පහ යි! හතර යි! තුන යි! දෙක යි! එක යි! පටන් ගත්තා!!!"

අජටාකාශ ගතවන විට, රොකට් එන්ජින්වල ඇති වන මහා සෝෂාව, ඇස් අන්ධ කරවන ගිනි දැල්ල වැනි දේ ගගන ගාමීන් තිදෙනා දුටුවේ නැහැ. නමුත් පියාසැරිය ආරම්භ වුනා. මායාකාර බහිරව සියා උදව් වුනා, මේ තිදෙනාට අජටාකාශ ගතවන විට ඇති වන අධික බර සහ පීඩනය විඳ දරා ගැනීමට. ඊළඟට ඇති වුනේ අජටාකාශ සැහැල්ලු බව ය. එය මවිතය ඇති කළා.

බුදහු ග්‍රහයා මත ගොඩබැසීම

"බලන්න! බලන්න, ළමයිනි!" තාත්තා ළමයින් අමතා කිවා. අප ඉදිරියේ බුදහු ග්‍රහයා. එය බොහෝ දුරට හඳට සමාන යි!"

තිදෙනා අජටාකාශ කවුළුවලින් බලන්නට පටන් ගත්තා. බුදහු ග්‍රහයා පුරා මහා විශාල කඳු වැටී සහ

බුදහු ගේ මතු පිට හු දර්ශනය.

කුහර හා විවර, ක්‍රේටර් වගේ දේ තිබුණා. ඒවා බොහෝ දුරට හඳේ විවර සහ වළවලට සමාන යි.

"තාත්තේ! මෙවා සියල්ල අපට පෘථිවියේ ඉඳලා දුර දක්නයකින් බලන්නට පුළුවන් නේද?" දුව ප්‍රශ්න කළා.

"සත්තකින් ම නැහැ! මහ පොළවේ ඉඳලා බුදහු නිරීක්ෂණය කිරීම බොහොම අමාරු යි. මේ පුංචි ග්‍රහයා හිරුට බොහොම ළඟින් ඉන්නවා. බුදහු ගේ කඳු සහ කුහර-ක්‍රේටර් ගැන අපට චාර්තා කළේ ස්වයංක්‍රිය අන්තර් ග්‍රහ ලෝක යානා විසින්. ඒ යන්ත්‍ර බුදහු ග්‍රහයා ගේ ඡායා රූප ගත්තා," තාත්තා කිවා.

"සවන් දෙන්න!" වුට් සියා ගේ කට හඬ රැව්දුන්නා. "අපේ මායාකාර අපටාකාශ යානය දැන් බුදහු ග්‍රහයා වටා සියාඕනවා. මග පෙන්වන්නිය! දකින හැම දෙයක් ම ප්‍රධානියාට චාර්තා කරන්න!"

"ලොකු හා කුඩා විවර, කුහර පැල්ම සහ වළවල් මට පෙනෙනවා. විශාල ක්‍රේටර පතුලේ කුඩා කඳු වගේ දේ පෙනෙනවා. ක්‍රේටර් වලින් සමහරක් පුංචි හිරුට සමාන යි. ඒවායින් හැම පැත්තට ම හිරු රැස් වැනි දේ විහිදා යනවා... ඔන්න බලන්න, බලන්න කොතරම් විශාල පැල්මක් ද කියලා!" දිලාන්ති දුටු දේ චාර්තා කළා.

"ඒ පැල්ම කිලෝමීටර් දහස් ගණනක් දිගට තියෙනවා වෙන්නට ඕන!" තාත්තා කිවා.

"ඒක මහ පුදුමයක් තම යි!" දිමුතු පුදුම වුනා.

"ප්‍රධානියෙනි! බුදහු වටා වලාකුළු නැති නිසා අපට කඳු සහ පැල්ම හොඳට බලා ගන්න හැකි වෙලා තියෙනවා," මග පෙන්වන්නිය කිවා.

"මේ ග්‍රහයාට උඩින් කිසි ම දාක වලාකුළු ඇති වන්නේ නැහැ. මන්දයත්, මේ ග්‍රහයා මත සුළං කොහෙත් ම පාහේ නැති නිසා," ප්‍රධානියා විස්තර කළා.

"මේ අපටාකාශ ගාමීන් තිදෙනාට බුදහු ග්‍රහයා මත ගොඩ බැසීමට අවසර නැත! මෙය භයානක ග්‍රහයෙකි. මෙහි වාතය නැත. ජලය නැත. දිවා කාලයේ උෂ්ණය ඉතා අධික ය."

"අපේ සෝවියට් දේශයේ දකුණු පෙදෙස වගෙ යි!" එහෙම කිවේ අපටාකාශ ඉන්ජිනේරු තැන ය.

"එයට වඩා බොහෝමත් ම අධික උෂ්ණයක් මෙහි තියෙනවා."



"මෙහි මේ තරම් උෂ්ණයක් තියෙන්නේ බුදහු ග්‍රහයා හිරුට බොහෝ ළඟ තියෙන නිසා," දිලාන්ති කීවා.

"ඒ නිසා විතරක් නොවේ. බුදහු ගේ එක දවසක් අපේ පෘථිවියේ දවස් 176 කට සමාන යි. පෘථිවියේ හයමාසයකට කිට්ටු කාලයක් ගෙවී ගියා ම තමයි බුදහු ග්‍රහයා ට දවසක් ගත වන්නේ. මේ තරම් දීර්ඝ දවසක් නිසා බුදහු ග්‍රහයා හිරු රැස්-වලට බොහොමයේ රත් වෙනවා," ඩූටි සියා කීවා.

"එහෙනම් බුදහු ග්‍රහයා මත සීත කාලයක් ඇති වන්නේ නැද්ද?" පුතා ඇසුවා.

"සත්තකින් ම තද හිතල ඇති වෙනවා. රෑ කාලය ත් දවල් කාලය වගේ ම දිග යි. ඒ නිසා ඒ කාලය තුළ දී බුදහු ග්‍රහයා බොහෝ ම තද සීතලට අසු වෙනවා."

"ශීත කාලයේ දී කොහොම ද?"

"අපේ පෘථිවියට වඩා බොහෝ ම ශීතල යි."

"බුදහු ග්‍රහයා කොතරම් පුදුම ලෝකයක් ද? විශාල කුහර, ක්‍රේටර්, විශාල පැලීම්. මහා විශාල උෂ්ණයක්, ඒ වගේ ම මහා විශාල සීතලක්!" දිලාන්ති කීවා.

"සුළං, වාතය ඇත්තේ ම නැහැ!" දිමුතු පැවසුවා.

"සවන් දෙන්න! සවන් දෙන්න! දැන් අපේ අජටාකාශ යානය බුදහු ග්‍රහයා ගෙන් ඈත් වෙලා සිකුරු ග්‍රහයා වෙත යාමට පටන් ගෙන තියෙනවා."

කුණාටු සහිත ග්‍රහයා විජ්ජාකාර අජටාකාශ යානය සිකුරු ග්‍රහයා වෙත යන්න පටන් ගත්තා. හිටි හැටියේ ම යානයේ සංඥා සහ නළා හඬ නැගුවා. පහන් පත්තු වුනා. යානයේ ප්‍රධානියා මෙසේ කීවා:

"අනතුරක්!"

"මොනවා වෙලා ද?" ඔයවුණු ළමයි ප්‍රශ්න කළා.

"සන්සුන් වෙයල්ලා!" තාත්තා කීවා. "අජටාකාශ ගාමීන් හැමදා ම ඕනෑ ම දේකට දෙවරක් සූදානම් විය යුතු යි."

"ප්‍රධානියා යානයේ සියලු යන්ත්‍ර ගැන විමසිල්ලෙන් සිටිය යුතු යි!" පියා-සැරියේ නායකයා අණ කළා. "ඉංජිනේරුවා සහ මග පෙන්වන්නිය අපේ යානයට සිකුරු ග්‍රහයා ළං වන සැටි දුටුවා නම් වාර්තා කරනු."

යානයේ කවුළුවලින් නාඳුනන අඳුරු ග්‍රහ ලෝකය පෙනුණා.

"ඇත්තට ම ඒ සිකුරු ග්‍රහයා ද?" දිලාන්ති ඉබේට ම වාගේ ප්‍රශ්න කළා.

"ඔව්, ඒ තමයි සිකුරු ග්‍රහයා. අපි පියාඹන්නේ හිරු ගේ ආලෝකයට හසු නොවුණු පැත්තෙන්. ඒ නිසා සිකුරු ග්‍රහයා අපට කළුවරට පෙනෙනවා," ප්‍රධානියා කීවා.

"නමුත් අපට නිතර, නිතර ආලෝකය වැටෙනවා!" පුතා කීවා.

මේ වේලාවේ දී යානයේ සංඥා යළිත් හඬ නැගුවා. යානයේ අනතුරු අහවන

ලාම්පු පත්තු වුනා. විවිධ උපකරණ වල තත්ත්වයන් පෙන්වන කටු සෙළවුනා.

"දැන් සිකුරු ග්‍රහයා මත බලගතු කුණාටු හමන වේලාව යි. ආන්න අකුණු ගසන සැටි බලන්න. යානය බාර ප්‍රධානියා තීරණය ගත යුතු යි!" එසේ කීවේ බහිරව චූටි සීයා.



"අපේ යානය සිකුරු ග්‍රහයා ගේ කෘත්‍රිම චන්ද්‍රිකාවක් බවට පරිවර්තනය කරමු!"

"එහෙනම් අපි සිකුරු ග්‍රහයා මත ගොඩ බහින්නේ නැද්ද?" දිමුතු ඇසුවේ කනගාටුවෙනි.

"සවන් දෙන්න! යානයේ ප්‍රධානියා සහ ඉංජිනේරුවා ස්වයං ක්‍රිය ඔත්තු බලන යන්ත්‍රය සිකුරු ග්‍රහයා මත ගොඩ බැස්සවීමට සූදානම් වන්න!" චූටි සීයා ගේ කටහඬ ඇසිණි.

"අපි සූදානම්! මායාකාරී බට්ස්කාප් යන්ත්‍රය දැන් සිකුරු ග්‍රහයා මත ගොඩ බස්සවමු!" යි තාත්තා පිළිතුරු දුන්නා.

රූපවාහිනී තිරය මත මායාකාරී අජටාකාශ යන්ත්‍රය සිකුරු ග්‍රහයාට ගොඩ බසින සැටි ළමයි දුටුවා.

"සවන් දෙන්න! සවන් දෙන්න! මේ කතා කරන්නේ මායාකාරී බට්ස්කාප් යන්ත්‍රය වන මම ය. භයානක සිකුරු ග්‍රහයා මත තිබෙන දේ ගැන මම ඔබට වාර්තා කරමි..."

"භයානක වන්නේ මක්නිසා ද?" දිලාන්ති ප්‍රශ්න කළා.

"ඔවු, භයානක යි. මක්නිසාදයත්, මේ ග්‍රහයා මත විදුලි කෙටීම්, සුළි සුළං නිතර පවතින නිසා..." බට්ස්කාප් යන්ත්‍රය පිළිතුරු දුන්නා.

"එහෙනම් ඔයා දැන් වැස්සට තෙම්ලා ඇති නේද?" දිලාන්ති ප්‍රශ්න කළා.



"මග පෙන්වන්නිය, ඔයා කලබල වන්න එපා. සිකුරු ග්‍රහයා මත වැසි ඇති නො විය යුතු යි... ඔන්න මම තවත් පහළට බහිනවා!"

රූපවාහිනී යන්ත්‍රයේ තිරය කළු පාට වෙලා කිසිවක් පෙනුණේ නැහැ. එහෙත් හිටි හැටියේ ම බට්ස්කාප් යන්ත්‍රය පෙනුණා.

"අපොයි, අපොයි! කොයිතරම් දැඩි උෂ්ණයක් ද! නුඹලා මේ ග්‍රහයා මත ගොඩ බහින්න හිතන්න

වත් එපා. උෂ්ණය බොහොම වැඩි යි.''

''බට්ස්කාප්, ඔයාට හුස්ම ගැනීම අමාරු ද?'' දිලුතු ප්‍රශ්න කළා.

''නැහැ. ඉංජිනේරු මහතාණෙනි. සිකුරු ග්‍රහයා මත වාතය ඔන තරම්. නමුත් මිනිසුන්ට එය හුස්ම ගැනීමට බැහැ. ඒ වාතය විෂ වලින් පිරිලා.''

''මොනවා හරි ඔයාට පේනවා ද?'' දිලාන්ති ඇසුවා.

''බොහොම අපැහැදිලි ලෙස. දැන් මම සිකුරු ග්‍රහයාට හිරු එළිය වැටී ඇති පැත්තට යනවා. එතැන ඉඳලා මම වාර්තා කරන්නම්,'' බට්ස්කාප් යන්ත්‍රය පිළිතුරු දුන්නා.

සිකුරු ග්‍රහයා.

රූපවාහිනියේ කිසිවක් පෙනුණේ නැහැ. බට්ස්කාප් යන්ත්‍රය වාර්තා කරන තුරු තාත්තා, පුතා සහ දුව නො ඉවසිල්ලෙන් බලා හිටිය. ඉක්මණින් ම ඒ යන්ත්‍රය වාර්තා කරන්නට පටන් ගත්තා:

''හිරු රැස් තියෙන මේ පැත්ත හොඳට පේනවා. අහස යමතමින් රතු පාට යි. ඝනැති වලාකුළු නිසා හිරු පෙනෙන්නේ නැහැ. දැන් මම සිකුරු ගේ මතුපිටට තවත් ළං වෙනවා...''

''සිකුරු ගේ මතු පිට රතු පාට ද?'' දිලාන්ති ප්‍රශ්න කළා.

''නැහැ. අළු ඉහලා වගේ කළු පාට යි...'' යන්ත්‍රය වාර්තා කළා.

''මතුපිට සමතලා භූමියක් වගේ ද?'' ප්‍රධානියා ඇසුවා.

''එතරම් සමතලා නැත. කඳු, විවර, කුහර, කාන්තාර, අගාධ වගේ දේ මට පෙනෙනවා...''

''අගාධ තියෙනවා ද?'' දිලුතු මවිතයට පත් වුනා.

''ඔව්. බොහොම දිගැති පැල්මවලට සමාන ආගාධ. මම එකක් ඇතුළට එබී බලන්නට උත්සාහ කරන්නම්,'' බට්ස්කාප් යන්ත්‍රය පිළිතුරු දුන්නා.

''පතුල අන්ධකාර ද?'' දිලාන්ති ප්‍රශ්න කළා.

''එතරම් අන්ධකාර නැහැ. පතුලේ තියෙන ගල් කැට ගිනි ගෙන රත් පැහැයෙන් දිලිසෙනවා...''

''බට්ස්කාප් වහා ම අපේ අපටාකාශ යානයට පැමිණිය යුතු යි!'' බහිරව වූටි සියා අණ කළා. ''යානයේ ප්‍රධානියා සහ ඉංජිනේරු තැන බට්ස්කාප් යන්ත්‍රය පිළි අරගෙන සිකුරු ග්‍රහයා ගෙන් සමු ගැනීමට කටයුතු කළ යුතු යි.''

''අපි සූදානම්!'' යැයි යානයේ ප්‍රධානියා පිළිතුරු දුන්නා.

''මම අපටාකාශ යානයට එමින් සිටිමි'' යි බට්ස්කාප් යන්ත්‍රය කියා සිටියා.

''සවන් දෙන්න! ඔබේ අපටාකාශ යානය තව දුරට ත් සිකුරු ග්‍රහයා වෙටට යන්නේ නැත. එය දැන් අහසරු ලෝකය වෙත සිඝ්‍රයෙන් යමින්

සිටිනවා. බට්ස්කාප් එයාට අයත් වැඩ සපුරාලා විවේක ගනිමින් සිටිනවා. ඔබේ අජටාකාශ යානයේ තුන් දෙනාට ද විවේක ගැනීමට අවසර දෙනවා.'' එසේ දන්වා සිටියේ චූටි සීයා.

රතුවන් ග්‍රහයා ''යානයේ තිදෙනා ගේ සැප සනීප කොහොම ද?'' රූප වාහිනියෙන් පෙනී සිටි චූටි සීයා ප්‍රශ්න කළා.

''බොහොම හොඳ යි. අපි තුන්දෙනා හොඳින් විවේක ගත්තා,'' ප්‍රධානියා පිළිතුරු දුන්නා.

''එහෙනම් ඉතින් අහහරු ලෝකය පිළි ගැනීමට සූදානම් වෙන්න,'' චූටි සීයා කිව්වා.

මේ වේලාවේ දී අජටාකාශ යානයේ විදුලි බුබුළු නිවිලා ගියා. නමුත් කළුවර වුනේ නැහැ. කවුළු වලින් යානාව ඇතුළට ප්‍රභේලිකාවක් බඳු අහහරු ගේ රතුවන් ආලෝක ධාරා ඇතුළු වුනා.

''හොඳ වේලාවට ආවා. අහහරු ග්‍රහයා මතුපිට විශාල ධූලි කුණාටුවක් සන්සුන් වුනේ මේ ළඟ දී. එම කුණාටුව දවස් කිපයක් තිස්සේ තිබුණා. ඉහළට නැගපු රතු පාට ධූලි දූන් යළිත් බිමට පාත් වේ ගෙන එනවා. ඒ නිසා දූන් ඔබට අහහරු ග්‍රහයා හොඳින් බලා ගැනීමට හැකි වේවි.''

''අහහරු ලෝකයේ බොහොම තද උෂ්ණයක් තියෙනවා වෙන්නට ඕන!'' දිමුතු කිව්වා.

''අහහරු ග්‍රහයා මතුපිට උෂ්ණ යි කියලා පුතා සිතන්නේ මක්නිසා ද?'' තාත්තා ඇසුවා.

''ධූලි රතු පාට වෙලා තියෙන්නේ උෂ්ණය නිසා නේද?''

''ධූලි රතු පාට වී තියෙන්නේ උෂ්ණය නිසා නොවේ. අහහරු ගේ මතුපිට ධූලි පාට රතු නිසා. මෙම ග්‍රහයා සැහෙන තරම් හිතල යි,'' තාත්තා විස්තර කළා.

''සෝවියට් සංගමයේ උතුරු දිග වගේ හිතල ද?'' දිමුතු විමැසුවා.

''සමහර විට ඊට ත් වැඩිය හිතල වැඩි යි!'' තාත්තා කිව්වා.

''එහෙනම් අහහරු ලෝකයේ ඇවිදින විට උණුසුමට අදින්න ඕන,'' දිලාන්ති තීරණය කළා.

''ඇවිදින්න ඉඩ නැහැ! අපි අහහරුව නිරීක්ෂණය කරන්නේ අපේ යානයේ කවුළුවලින්,'' තාත්තා දන්වා සිටියා.

මෙයි කනගාටුවට පත් වුනා. නමුත් අජටාකාශ යානයේ ප්‍රධානියා ගේ අණ පිළිගත යුතු ය.

''ඔබට පෙනෙන සියලු දේ ගැන වාර්තා කරන්න!'' චූටි සීයා ගේ කට හඬ ඇසුණා.

''ගල් කැට සහිත මහා විශාල කාන්තාර,'' ප්‍රධානියා වාර්තා කළා.



"මහා යෝධ කන්දකි!" දිමුතු කීවා.

"ඉස්සර ඔය කන්ද යමහලක් වැ තිබුණා. ගිනි පිට කරන විට ගල් කැට ත් ගිනි කැට වගේ පිච්චිලා වීසි වුනා. දැන් ඔය කන්ද මැරිච්ච යමහලක්," චූටි සීයා විස්තර කළා.



"හඳේ සහ බුදහු ගේ වගේ ම විවර සහ පැල්ම මට පේනවා," දිලාන්ති පැවසුවා.

"ඒවාට සමාන නො වේ. බුදහු සහ හඳ මතු පිට සුළං නැත. එහෙත් අහඹරු ග්‍රහයා මතු පිට කුණාටු හමන නිසා සමහර විවර, කුහර ආදිය විනාශ වෙලා..." නාත්තා විස්තර කරමින් පැවසුවා.

"කඳු! දිගින් දිගට කඳු! කඳු වැටක්..." දිමුතු කෑ ගැසුවා.

"ඔව්, එය සැහෙන තරම් දිගැති කඳු පෙළක්," නාත්තා පැහැදිලි කළා.

අපටාකාශ යානය අඟහරු වටේ කරකැවෙන්නට පටන් ගත්තා.

"හිම, හිම!" දිලාන්ති හඬ නගා කීවා.

"දැන් අපි අඟහරු ග්‍රහයා ගේ තොප්පියක් වැනි ධ්‍රැවය උඩින් පියාඹන නිසා" කියලා නාත්තා දන්වා සිටියා.

"ඇත්තට ම අඟහරු තොප්පියක් පැළඳ ඉන්නවා ද?" පුනා නාත්තා ගෙන් ප්‍රශ්න කළා.

"තොප්පි වැනි ධ්‍රැව එකක් නො වේ දෙකක් ම අඟහරුට තියෙනවා! අපේ පෘථිවියේ උතුරු හා දකුණු ධ්‍රැව වල ගොඩ ගැසී තිබෙන විශාල අයිස් ගොඩ ත් තොප්පි වලට සමාන යි. අපේ පෘථිවියේ උතුරු හා දකුණු ධ්‍රැව වල ගොඩ ගැසී තිබෙන තරම් විශාල අයිස් හා හිම ගොඩවල් අඟහරු ලෝකයේ ධ්‍රැව වල ගොඩ ගැසී නැත. ගිම්හාන කාල වල දී ඒ හිම තට්ටු වඩා ත් කුඩා වෙනවා.

"දැන් ඔබේ අපටාකාශ යානය අඟහරුවා ගේ මහා අගාධයට උඩින් පියාසර කරනු ඇතැ!" යි රූපවාහිනී තිරයේ පෙනී සිටි චූටි සීයා කීවා.

ඉතා ම දිගැති, ඉතා ම ගැඹුරු අගාධයට ඉහළින් පියාඹීම තරමක් බිය ගෙන දුන් නමුදු සිත් ගන්නා දෙයක් වුනා.

"අගාධ පතුලේ මොනවා තියෙනවා ද?" දිලූතු විමසුවා.

"ඒ ගැන නම් තවම කිසිවෙක් දන්නේ නැහැ," තාත්තා කිවා.

ඔන්න ඊට පසුව අහඹරු ගේ මහා කාන්තාර පෙනෙන්නට වුනා. මෙහි පුදුමාකාර ප්‍රභේලිකා කීපයකි. ඔබ කල්පනා කර බලන්න: අහඹරු ලෝකයේ ජලය නැත. එහෙනම් එහි ගංගා, මුහුදු, සාගර කිසිවක් නැහැ. නමුත් යානයේ කවුළු වලින් බලන විට ගංගා පෙනේ. ඒවා සැබෑ ගංගා ලෙස පෙනුණ ද, ජලය නැති ගංගා ය. සමහර විට එහි ජලය සියල්ල වියලී ගිහින් ද?

"අහඹරු ලෝකයේ මිනිසුන්ට සමාන පිව ප්‍රාණීන් වාසය කරනවා කියලා මැනක් වන තුරු පෘථිවියේ මිනිස්සු සිතා ගෙන හිටියා..." තාත්තා ළමයිනට පැහැදිලි කළා.

"මිනිස්සු ද?" දිලූතු, ඇහුවා.

"මිනිසුන් ම නො වේ. පෘථිවියේ වාසය කරන අපේ මිනිසුන් සිතුවේ අහඹරු ලෝකයේ පිවින් අපට දයාදු වශයෙන් කෞතුක වස්තු ඉතිරි කරලා ගියා කියලා..."

අහඹරු ගේ මතු පිට කොටසක්.

"මොන විධියේ දයාදයන් ද?" දිලූතු ප්‍රශ්න කළා.

"උදාහරණයක් වශයෙන් අහඹරු වටේ කෘත්‍රිම චන්ද්‍රිකා යැවීම වැනි දේ..."

"සමහර විට අපට එවැනි චන්ද්‍රිකා දකින්නට ලැබෙවි," දිලාන්ති ඇගේ අදහස කියා පෑවා.

"දකින්නට ලැබෙවි. නමුත් ඒවා කෘත්‍රිම චන්ද්‍රිකා නො වේ. අහඹරු වටා ගමන් කරන ස්වාභාවික චන්ද්‍රිකා දෙක අපට දැකිය හැකි වේවි."

"ඔන්න අහඹරු වටේ කරකැවෙන චන්ද්‍රිකා දෙක. ඒවා 'පෝබස්' සහ 'ඩෙයිමස්' නමින් හඳුන්වනවා. එහි තේරුම 'බිය' සහ 'සංත්‍රාසය' යනු යි." එසේ කීවේ චූටි සීයා ය.

"ඒවා මොන චන්ද්‍රිකා ද? ඒවා අඩු ගණනේ වටකුරු වත් නො වේ. එකක මතුපිට හූරලා වගේ." දිලූතු කීවේ සිත් තැවුලෙනි.

"ඔව්, අහඹරු ගේ චන්ද්‍රිකා අපේ පෘථිවියේ හඳ වගේ නො වේ. නමුත් අහඹරුට ඒ වගේ චන්ද්‍රිකා වත් තියෙනවා. බුදහුට සහ සිකුරුට එවැනි චන්ද්‍රිකා කොහෙත් ම නැහැ නෙව..." තාත්තා කිවා.

"තාත්තේ, සමහර විට අහඹරු ලෝකයේ කිසියම් පීව ප්‍රාණින් ඉන්නට පුළුවනි, නේද?" දිලාන්ති ඇසුවේ බලාපොරොත්තුවෙකිනි.

"මම හිතන්නේ නැහැ. දැනටමත් අහඹරු ලොව වටා විජ්ජාකාර යානා නොවේ. හැබැ විද්‍යාත්මක අපටාකාශ යානා කිපයක් ම පියාඹා ආවා. ඒවා සාදන ලද්දේ සෝවියට් සංගමයේ සහ ඇමරිකාවේ විද්‍යාඥයින් විසිනි. නමුත් අහඹරු ලෝකයේ පීව ප්‍රාණින් සිටින බවට කිසි ම ලකුණක් නැහැ."

"අපි ඔවුන් සෙවීමට මහන්සි ගත්තොත්?" එහෙම යෝජන කළේ දිමුතු.

නමුත් තාත්තාට වචනයක් වත් කීමට ඉඩ ලැබුණේ නැහැ. අපටාකාශ පියාසැරියේ නායකයා ගේ දැඩි කටහඬ අසන්නට ලැබුණා:

"අපේ මේ අපටාකාශ යානය දැන් අහඹරු ගෙන් ඇත් වෙලා ඉතා ම විශාල ග්‍රහයා වෙත යාමට යනවා."

ඒ විශාල ග්‍රහයා බ්‍රහස්පති බව අපටාකාශ යානයේ තිදෙනා දැන ගත්තා.

බ්‍රහස්පති සහ එහි චන්ද්‍රිකා

"දැන් ඉතින් අපි අපේ අපටාකාශ සංචාරයේ අවසාන ග්‍රහයා දෙසට යමු," පියාසැරියේ ප්‍රධානයා පැවසී ය. "එහෙනම් අනිත් ග්‍රහයන් ගැන කොහොම ද? අප ඒවා බැලීමට යන්නේ නැති ද?" එලෙස ප්‍රශ්න කළා දිලාන්ති.

"නැහැ. ඒය අපේ වැඩ පිළිවෙලට අයිති නැත. බ්‍රහස්පති සහ සෙනසුරු ග්‍රහයන් අසලට සැබෑ විද්‍යාත්මක අපටාකාශ යානා ගිහිල්ලා තියෙනවා..."

"මා ත් කැමති යි ඒ ග්‍රහයන් බැලීමට යන්නට!" දිමුතු කීවේ ලොකු ආසාවකිනි.

"මාස කිපයක් තිස්සේ නොකඩවා ගමන් කිරීමට පුතා එකඟ වෙනවා ද!" තාත්තා ඇසුවා.

"මල්ලිට බැහැ ඒ වගේ දෙයකට ඔරොත්තු දීමට! අපේ මේ ක්‍රීඩාකාර මායාකාර පියාසැරිය වගේ නොවෙයි සැබෑ අපටාකාශ පියාසැරි!" දිලාන්ති කිවා.

"දුව ගේ කතාව හරි. සැබෑ අපටාකාශ ගාමීන් පවා තවම ඒ වගේ ග්‍රහයන් වෙත ගිහිල්ලා නැහැ..."

"අනාගතයේ දී යාවි නේද?" දිමුතු ඇසුවා.

"අනිවාර්යයෙන් ම යනු ඇති! මිනිසා අපටාකාශය මෙල්ල කිරීම ආරම්භ කළා පමණ යි. අනාගතයේ දී ඉතා වැදගත්, අමාරු පියාසැරි ඇති වේවි. වෙනත් ග්‍රහ ලෝකවලට ගියා ම තමා ගේ පෘථිවිය ගැන ත්, එහි අතීතය සහ අනාගතය ගැන ත් බොහෝ දේ දැන ගැනීමට මිනිසාට හැකි වේවි."

"සවන් දෙන්න! සවන් දෙන්න!" යානයේ තිදෙනාට නායකයා ගේ කට හඬ ඇසුණා. "දැන් ඔබ ගේ අපටාකාශ යානය බ්‍රහස්පති වටා ඇති අනතුරුදායක ප්‍රදේශයට යමින් සිටිනවා. සියලු දෙනා ම තමාට අයිති ස්ථානවල සිටිය යුතු ය! ප්‍රධානියා ඔත්තු බලන උපකරණය යවන්න!"

චූටි සීයා රූපවාහිනියෙන් අතුරුදන් වී ගොස් ඒ වෙනුවට පුංචි රොකට්ටුවක් රූපවාහිනියේ පෙනුණා. එයින් නික්මුණු ශබ්දය සහ හඬ මෙසේ ය:

"ඔත්තු බලන රොකට් යානය ඔබ හැමට සුබ පතයි. මම විජ්ජාකාරී බට්ස්කාප් ගේ වැඩිමල් සොහොයුරා වෙමි. ඕනෑ ම බියජනක ග්‍රහ ලෝකයෙක ඇති අනතුරු ගැන නොා තකා වැඩ කිරීමේ ශක්තියක් ඇති උපකරණයකි, මා. මගේ යන්ත්‍රයේ රූපවාහිනී මෙවලම් සවිකර ඇත. වැදගත් ලක්ෂණයන් ඔබට දැකගත හැකි වනු පරිදි මම ඒ රූපවාහිනී ක්‍රියාකාරී කරමි. මට සමාවන්න, මා ගුවන් විදුලිය මගින් කවුදෝ අමතනවා..."

යළිත් ඔත්තු බලන රොකට්ටුව රූපවාහිනිය මගින් පෙනී හිටියා.

"යෝධ බ්‍රහස්පති ග්‍රහයා ගේ පවුලට අයත් ධූම කේතුවක් මා අමතයි."

"බලන්න, බලන්න! රූපවාහිනියේ වල්ගා තරුවක් පෙනෙන හැටි!" දිලාන්ති කෑ ගසා කිවා.

"ඒක තම යි ධූමකේතුව" තාත්තා ළමයින්ට විස්තර කළ.

"මේ කතා කරන්නේ ඔත්තු බලන රොකට් යන්ත්‍රය! ධූම කේතුවේ සිට මට ලැබුණු තොරතුරු මම වාර්තා කරමි. බ්‍රහස්පති ග්‍රහයාට අයත් ආකාශ වස්තු පවුලේ තත්ත්වය බොහොම නොසන්සුන් බව මට දැන ගන්නට ලැබුණා. බ්‍රහස්පති ග්‍රහයා මතු පිට කොතරම් රෞද්‍ර ලෙස කුණාටු හමන්නේදයත්, මට පවා එහි යාම අනතුරක් වනු ඇත. බ්‍රහස්පති ග්‍රහයාට අයත් සමහර චන්ද්‍රිකාවල ගිනි කඳු ගිනි ජ්වාලා පිට කිරීමට පටන් ගෙන තිබෙනවා... පරෙස්සම් වන්න! පරෙස්සම් වන්න!"

යානයේ ඉංජිනේරු තැන, කුමක් කළ යුතු දැයි ප්‍රධානියා ගෙන් විමසුවා.

"එය තීරණය කළ යුත්තේ අපේ මුළු පියාසැරියේ නායකයා වන චූටි සීයා."

චූටි සීයා ඉතා ම අනතුරුදායක මොහොතේ දී රූපවාහිනියේ පෙනී සිටියා. ඒ වගේ මේ වෙලාවේ



දි ත් ඔහු පෙනුණා.

"කොහොම වුනත්, මා කැමති යි ඔය තුන්දෙනාට බ්‍රහස්පති ගේ චන්ද්‍රිකා ත්, ඒ වගේ ම බ්‍රහස්පති ග්‍රහයා ගේ මතුපිට ත් පෙන්වීමට. නමුත් ග්‍රහයාට ළංවීම භයානක යි. ඔබේ යානය බ්‍රහස්පති ග්‍රහයාට දුරින් ද, ඔත්තු බලන රොකට් යානය ග්‍රහයාට ළඟින් ද වටේ යනු ඇති..."

"රොකට් යානය ග්‍රහයා මත බහින්නේ නැද්ද?" දිමුතු නො ඉවසිල්ලෙන් ප්‍රශ්න කළා.

"ග්‍රහයා මතු පිට ගොඩබැසීමට පවා තැනක් නැහැ. බ්‍රහස්පති මතු පිට තවමත් වලාකුළු වගෙ යි. ඒවා උඩට බහින්නට නො හැකි ය. තවමත් කිසිවකුට බ්‍රහස්පති ග්‍රහයා මතු පිට ඝනැති වස්තු හෝ තට්ටුවක් තිබෙන බවක් හෝ සොයා ගෙන නැහැ. සමහර විට ඒ යෝධමය ග්‍රහ ලෝකය මතු පිට තදැති පොළවක් නැතුවා වෙන්නට පුළුවනි."

එසේ කියා වූටි සීයා අතුරුදහන් වුනා. තිරයේ අපූරු චිත්‍රයක් මැවුනා.

"මම ඔය තුන්දෙනාට බ්‍රහස්පති ගේ චන්ද්‍රිකාවක මතුපිට පෙන්වන්නම්. එයට කියන්නේ කැලිස්ටෝ කියා ය. බලන්න මෙහි කොතරම් විශාල ගණනක් කුහර, ක්‍රේටර තියෙනවා ද කියලා. හඳෙහි ද, බුදහු ගේ ද, අඟහරු ගේ ද තියෙන ක්‍රේටරවලට වඩා මෙහි තියෙන සංඛ්‍යාව බොහොම වැඩි යි. දැන් ඔබට පෙනෙන්නේ 'ගවයා ගේ ඇස' නැමැති යමහල යි. යමහලේ සිට සෑම පැත්තට ම රැළි විහිදී ගිහිල්ලා තියෙන සැටි බලන්න. ඒවා දැන් මියගිය, අප්‍රාණික රැළි. කැලිස්ටෝ ගේ මෙම රැළි දැන් ඝනැති අයිස් බවට පත් වෙලා..." යැයි ඔත්තු බලන රොකට් යන්ත්‍රය වාර්තා කළා.

යානයේ සිටින තිදෙනා බ්‍රහස්පති ග්‍රහයා ගේ පුදුම සහගත කැලිස්ටෝ චන්ද්‍රිකාව දෙස බලා ගෙන උන්නා.

"ගනිමෙද් දෙස බලන්න!" යැයි රොකට් යන්ත්‍රය ඉල්ලා හිටියා.

"ගනිමෙද් යනු කුමක් ද?" දිමුතු වටහා ගත නො හැකිව ප්‍රශ්න කළා.

"එයා අපට බ්‍රහස්පතිට අයිති තවත් එක චන්ද්‍රිකාවක් පෙන්වීමට යනවා. ගනිමෙද් චන්ද්‍රිකාව, කැලිස්ටෝ චන්ද්‍රිකාවට වඩා බ්‍රහස්පති ග්‍රහයාට කිට්ටු යි. දිලාන්තිට පෙනෙන දේ අපට වාර්තා කරන්න" යැයි නාත්තා කිවා.

"මෙහි විහිදී ගිය ඉරි සහිත ලස්සන ක්‍රේටර් බොහොම තියෙනවා. ඒවා විශාල හිම රැළි වලට සමාන යි," දිලාන්ති සිය වාර්තාව ආරම්භ කළා.

"මෙහි විවිධ කඳු සහ පැල්ම ආදිය තියෙනවා." එහෙම කිවේ දිමුතු.

"ගනිමෙද් හඳට බොහොම සමාන යි," දිලාන්ති කිවා.

රූපවාහිනියේ නැවත පෙනී සිටියේ ඔත්තු බලන රොකට් යානය ය.

"බ්‍රහස්පති ග්‍රහයාට ස්වාභාවික චන්ද්‍රිකා දහ හතරක් තිබේ. එයින් ග්‍රහයාට ඉතා ම ළං ව ඇති චන්ද්‍රිකා දෙකක් පමණක් පෙන්වන්නම්. එකක නම ඉඕ ය. අනික අමල්තේ නමින් හැඳින් වේ. ඔන්න දැන් ඉඕ චන්ද්‍රිකාව හොඳින් පෙනෙයි,"



රොකට් යානය වාර්තා කළා.

ඉඹ චන්ද්‍රිකාවේ යමහලකින් පැන නැගුණු මහා ගිනි ජාලා නිසා තුන්දෙනා ගේ අජටාකාශ යානය ආලෝකයෙන් දිලිසුනා.

"මෙතරම් ලස්සන දර්ශනයක් මීට පෙර කිසි ම දාක දකලා නැහැ" දිලාන්ති පැවසුවා.

"අජටාකාශ යානයේ තිදෙනා වෙත වාර්තා කරමි: වැඩි වේලාවක් ඉඹ චන්ද්‍රිකාව ඉහළින් පියාඹන්ට බැහැ. මම දැන් නුඹලාව අමල්තේ චන්ද්‍රිකාව වෙත ගෙන යන්නම්," කී ඔත්තු බලන රොකට් යානයේ හඬ ඇසුණා.

"මට අමල්තේ චන්ද්‍රිකාව පෙනෙනවා! එය කැකිරි ගෙඩියකට සමාන යි" දිමුතු කිවා.

එවිට ම වාගේ රූපවාහිනියේ දර්ශනය වෙනස් වුනා.

"ඔන්න දැන් ඔබ ඉදිරියේ ඉතා බියජනක ග්‍රහස්පති," ඔත්තු බලන රොකට් යානයේ හඬ ඇසුණා.

"එය බියජනක වන්නේ නිතර එහි අකුණු ඇති වන නිසා ද?" එහෙම ප්‍රශ්න කළේ දිමුතු.

"ඔවු, ග්‍රහස්පති ග්‍රහයා ගේ ඇති වන අකුණු ගැසීම් වැනි බියජනක අකුණු ගැසීම් අපේ පෘථිවියේ කිසි දිනෙක ඇති වන්නේ නැහැ. සිකුරු ග්‍රහයා ගේ පවා එවැනි දේ ඇති නො වේ. ඒ හැර ග්‍රහස්පති ලෝකයේ නො කඩවා සුළි සුළං ඇති වන නිසා ත් එයට 'බියජනක ග්‍රහයා' කියා නම තබා තිබෙනවා. මේ ග්‍රහ ලෝකයේ ඇති වන දේ බලන්න!" යැයි තාත්තා මෙයිනට කිවා.

ග්‍රහස්පති ගේ චන්ද්‍රිකා.

ග්‍රහස්පති ග්‍රහයා මතු පිට සිදු වන දේ සිතින් සිතා ගැනීමට පවා දුෂ්කර ය. එය පුරා විවිධ පාටවලට අයත් සුළි සුළං හමන්නාක් සේ ය. ඔත්තු බලන රොකට් යානයට සවි කර ඇති රූපවාහිනී කැමරා ඒ සුළි සුළං දෙසට එල්ලවිය. වැඩි වශයෙන් ඒ කැමරාවෙන් පෙනුනේ රතුවන් ලපයකි.

"එය මොකක් ද?" දිමුතු විමසුවා.

"එය තම යි, රතුවන් මහා ලපය," රොකට් යානය පිළිතුරු දුන්නා. "ඔය රතු ලපයට දැන් බොහොම වයස යි. පහුගිය අවුරුදු තුන් සියයක් තිස්සේ ඔය රතු ලපය පෘථිවියේ මිනිස්සු නිරීක්ෂණය කරනවා. ඒ කාලය තුළ දී ග්‍රහස්පති ග්‍රහයා

බොහෝ දුරට වෙනස් වුන නමුදු මහා රතු ලපය විතරක් වෙනස් නො වී තිබෙ...''

''ඔත්තු බලන රොකට් යානයට පුළුවන් ද, සුළි සුළං වලට යටින් ගිහින් ග්‍රහයා දෙස බලන්නට?''

''අනේ මල්ලියේ, රොකට් යානයට් ආපහු එන්නට බැරි වෙවි!'' දිලාන්ති මල්ලි ගේ අදහසට විරුද්ධත්වය පෑවා.

''අපේ අජටාකාශ පියාසැරියේ නායකයා මට එහෙම දෙයක් කිරීමට අවසර දී නැත. එනිසා මට සුළි සුළං වලට යටින් කිමිදී බැලිය නො හැකි යි,'' ඔත්තු බලන රොකට් යානය කීවා.

''බ්‍රහස්පති ගේ සුළි සුළං ආශ්වාස කිරීමට සුදුසු ද?'' දිමුතු ප්‍රශ්න කළා.

''ඒ සුළං මිනිසුන්ට ආශ්වාස කිරීමට කිසි සේ ත් ම සුදුසු නැහැ'' යි රොකට් යානය පිළිතුරු දුන්නා.

''එහෙනම් ලස්සන පාටවලින් සුළි සුළං ඇති වන බ්‍රහස්පති ග්‍රහයා මතු පිට පිළිත් විය නො හැකි'' යැයි දිමුතු කීවේ ලොකු දොම්නසකිනි.

''මම ඔබට තවත් බොහෝ දේ පෙන්වීමට කැමති යි. නිදසුනක් වශයෙන් බ්‍රහස්පති ගේ ප්‍රභා මණ්ඩලය!'' එලෙස කීවේ ඔත්තු බලන රොකට් යානය ය.

''කරුණාකරලා අපට එය පෙන්වන්නැ!''

''හොඳ යි, පෙන්වන්නම්'' යැයි රොකට් යානයේ හඬ පොරොන්දු වුනු විගස ම වාගේ තිදෙනා ගේ අජටාකාශ යානය තුළ අන්ධකාරයක් ඇති වුනා. එහි තිබූ රූපවාහිනිය ත්, විදුලි බුබුලු සියල්ල ත් නිවී ගියා.

''මොනවා වුනා ද?'' දිමුතු ඇසුවා.

''සියල්ල යසට සිදු වුනා. අපේ මේ විජ්ජාකාර අජටාකාශ පියාසැරිය අවසන් වුනා. අපි දැන් ආයෙමත් අපේ ගෙදරට ඇවිත් සිටිනවා,'' නාත්තා විස්තර කළා.

බ්‍රහස්පති සහ එයට අයත් සමහර චන්ද්‍රිකා.

ප්‍රධාන විජ්ජාකාර බහිරවයා කෝපයට පත් වෙලා. ආයෙත් අහනවා, කෝප නො වී පුළුවන් ද! නුගත් කුරුම්බිටා ඉරු ගැන කළ කතාවේ දී කොතරම් වැරදි

නුගත් කුරුම්බිටා නා-රකා සහ ග්‍රහයන් ගැන දන්නේ මොනවා ද?

ගොඩාක් කලා ද කියලා ප්‍රධාන විජ්ජාකාරයා චූටි සියා ගෙන් දැන ගත්තේ මේ දැන් ය. ප්‍රධාන විජ්ජාකාරයා නුගත් කුරුම්ටිටාට බරපතළ දඬුවම් දීමට තීරණය කලා. බොහොම තදින් කැළඹීමට පත් වූ නිසා කරුණු පටලවා ගෙන කතා කළෑ යි කියලා නුගත් කුරුම්ටිටා කිවා. ග්‍රහයන් සහ තරු ගැන ඔහු සියලු දේ දන්නා බැවින් වැරදි එකක් වත් නො කර සියලු දේ නිවැරදි ලෙස කියන බව දන්වා හිටියා.

"හොඳ යි, එහෙනම් කියන්න. මා සහ චූටි සියා නුගතා ගේ කතාවට සවන් දෙනවා" යැයි ප්‍රධාන විජ්ජාකාරයා කියා සිටියා.



අපේ පාඨකයෝ යළින් වරක් නුගත් කුරුම්ටිටා හමුවූනා. මේ හමුවේ අරමුණ නම් තාරකා සහ ග්‍රහ ලෝක පිළිබඳ මූලික දැනීම හොඳ හැටි වටහා ගන්නේ ද, නැද්ද යන්න සොයා බැලීම ය. මේ පොත කියවනා පොඩිත්තන් නුගත් කුරුම්ටිටා ගේ කතාවට සැලකිල්ලෙන් සවන් දී ඔහු කරන වැරදි සටහන් කරනවා පමණක් නොව එහි ඇති වැරදි නිවැරදි කිරීමට උත්සාහ ගැනීම ඇනවී.

නුගත් කුරුම්ටිටා ගේ කතාව

ගරු කටයුතු බහිරවයනි! අහසේ තාරකාවල සංචාරයක් සඳහා මා ගිය සැටි විස්තර කිරීමට මා කැමති යි. මට මතක යි මම පෘථිවියෙන් ඉවත් වී ගියේ රාත්‍රියේ දී. ඉතින් සත්තකින් ම මම කරු සහිත අහස ඉහා ඉක්මණින් ඉගිලිලා ගියා. අපොයි එහි හැම දෙයක් ම තියෙනවා. එහෙ නියම සත්තු වත්තක්! එහි සත්තු කුඩුවල ලගින්නේ නැහැ. උන් නිදහසේ ඇවිදිනවා. මට එහිදී ලොකු වලස් අම්මා (වැලඟින්න) කෙනෙකු යි, එයා ගේ පැටිය යි, ලොකු හරකෙකු යි හමුවූනා. මහ මුහුදේ බයානක රකුසා දුටු හැටියේ ම මම බොහොම බය වුනා. හොඳ වෙලාවට මම කැසියෝපිය ගේ මාලිගාවේ හැංගිලා උන් ගෙන් බේරුණා. මගේ



නත්තවය බොහොම නරක් වුනා. කැසියෝපියා රැජිනට පින්සිදු වන්නට ඇ ඇගේ අවලස්සන බව අන්ද්‍රොමේදාව වතුර ගෙනෙන්නට යැවිවා. රජ කුමරිය මාලිගාවෙන් එළියට ගිහිල්ලා කෙණෙස්සක් වගේ ලොකු හැන්දක් අරගෙන හඳේ තියෙන සාගරයකින් වතුර ගෙනාවා. මෙ ඒ වතුර බීපු හැටියේ මට ලොකු සනීපයක් දැනුණා. සෙපේයුස් රජ්ජුරුවෝ මට මන්දාකිණිය පෙන්නුවා. එය අපේ පෘථිවියේ සිට වුනත් බලන්නට පුළුවනි. මේ මන්දාකිණියට කිරි ගංගා මාර්ගය කියල ත් කියනවා. මොක ද දන්නවා ද සෙපේයුස් රජ්ජුරුවන් ගේ රාජ සේවකයෝ ඒ මගට හැම දාම කිරි වත් කරන හන්දා. කිරි ගංගා මාර්ගය ඔස්සේ ගමන් කිරීම අපහසු යි. ලිස්සා වැටෙන්නට යන නිසා. ඊට පස්සේ සෙපේයුස් රජ්ජුරුවෝ එයා ගේ මාළිගාවට මට ආරාධනා කළා. ඒ වේලාවේ දි හඳ වුවගෙන ආවා. එයා ගේ මුහුණ සිරිලා. එයා කිව්වා එයා ගේ මුහුණු සිරිලා තුවාල වුනේ පෘථිවි ගෝලයේ ශ්‍රැවය හන්දා කියලා. ඉතින් එයා හොඳටම දුක්වෙලා ඇඬුවා. ඊට පසුව හඳ හාමි එයා ගේ බැග් එක ඇරලා ලස්සන බැලුම් ගෝල විසුරුවා හැරී ය. ඒවා අහසේ තරු තමා යි. මේ තරු නොයෙක් පාටින් දිලිසුනා. හඳ තාරකා අල්ලා ගන්නු නිසා ඒවා ලෙඩ වෙලා. ඉතින් මට යි, රජ්ජුරුවන්ට යි සිද්ද වුනා. ලෙඩ වෙච්ච

තාරකා වලට උණ කට්ටුව තියලා බලන්නට. බොහොම තද උණ තිබුණේ රතු පාට තාරකා වලට යි. සිහල තාරකා සුදු පාට ඒවා. ඉතින් අපි උණ බලන විට හඳ අඬන්නට වුනා. එයා බොහොම කනගාටුවෙන් ඇඬුවා. හඳ අප බැලීමට එන විට මෙහෙට තරඟාරුවට හිටියා. පසුව අඬන්නට වුන හින්දා හඳ දිය වෙලා ගියා. ඉතින් ඊට ත් පසුව අපි...

''ඉතින් ඔය ඇති. යාළුවා, නුඹ කිසි ම අජටාකාශ පියාසැරියකට සහභාගි වෙලා නැහැ. නුඹ හිතින් හිතලා දොඩවාපු දේ සියල්ල පටට පල් බොරු. නුඹට කිසි දෙයක් තෝරා බේරා ගන්නට බැහැ. සියලු කරුණු පටලවා ගෙන කතා කළා!'' ප්‍රධාන විජ්ජාකාර බහිරවයා කෝප වෙලා පැවසුවා.

නුගත් කුරුම්ට්ටා සුසුම් හෙළමින් සමාව ඉල්ලා හිටියා. එහෙත් ප්‍රධාන විජ්ජාකාර බහිරවයා එයා ගේ කතාව සවන් දීමට වත් කැමති වුනේ නැහැ. ආදි කාලයේ සිට ලොකු පුස්තකාලයක් තියන ග්‍රහ ලෝකයට නුගත් බහිරවයාව යැවීමට ප්‍රධාන විජ්ජාකාරයා තීරණය කළා. ආපහු පැමිණීමට නුගත් කුරුම්ට්ටාට අවසර තියෙන්නේ ඔහු ඒ පුස්තකාලයේ තියන සියලු පොත් කියවලා නුගත් කම නැති කර ගත්තාට පසුව කියලා කිව්වා.

මේ කතාව තාත්තාට බහිරව වූට් සීයා ගෙන් දැන ගත් විට එය දුවට සහ පුතාට කිවා. නුගත් කුරුම්ට්ටා ගේ කතාවේ දී ඔහු කළ වැරදි බොහොම වැඩි යි. සමහර විට නුගත් කුරුම්ට්ටා ගේ කතාවේ වැරදි දිලාන්ති සහ දිමුතු හැරුණු විට, තවත් මෙයින් සොයාගෙන ඇති නේ ද? දැන් ඉතින් මේ පොත කියැවූ මෙයින් අපේ පෘථිවිය ගැන ත්, හඳ සහ වෙනත් ග්‍රහ ලෝක ගැන ත්, අපේ හිරු සහ වෙනත් තරු ගැන ත්, ඇත, ඉතා ඇත තිබෙන වෙනත් සෞර ග්‍රහ මණ්ඩල ගැන ත් සැහෙන තරම් කරුණු දන්නවා ඇති. ඉතින් ඔය මෙයින් තවත් හැදී වැඩුණයින් පසු තවත් බොහෝ දේ ඉගෙන ගන්නවා ඇතැ යි අපි තරයේ විශ්වාස කරමු!

ප්‍රිය පියවරුනි, මව්වරුනි, ආච්චිවරුනි සහ සීයාවරුනි!

මේ පොත ඔබේ පොඩිත්තන්ට කියැවී ද? එය ඔවුන් ගේ සිත් ගත්තේ ද? මේ පොත ගැන ඔබේ අදහස් හා යෝජනා අප වෙත දන්වා එවන්න.
අපේ ලිපිනය:

Raduga Publishers,
17, Zubovsky Boulevard,
Moscow, USSR.

පරිවර්තනය රුසියන් මුල් පිටපතිනි.
සෝවියට් සංගමයේ මුද්‍රිත ය.

ශ්‍රී ලංකාවේ බෙදා හරින්නෝ:
සි/ස මහජන ප්‍රකාශකයෝ (පීපල්ස් පබ්ලිෂිං හවුස් ලිමිටඩ්) 124, කුමාරන් රත්නම් පාර, කොළඹ-2





ISBN 5-05-00